# හරිත පොහොර
# යුගයක් වෙත

**කෘෂිකර්ම අමාත්‍යාංශය**
288, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය, ශ්‍රී ලංකාව.

දුරකථන අංකය : +94 11 2 868 920
ෆැක්ස් අංකය : +94 11 2 863 497
ඊමේල් : info@agrimin.gov.lk
වෙබ් : www.agrimin.gov.lk

CREATIVE WRITING, PHOTOGRAPHY
LAYOUT & DESIGN

කලාව

613/3, High Level Road, Gangodawila,
Nugegoda, Sri Lanka.
+94 11 302 4950 | +94 71 224 11 00
kalawainfo@gmail.com

# වාර්ෂික වාර්තාව

## 2017

සීමාසහිත ලංකා පොහොර සමාගම

**සීමාසහිත ලංකා පොහොර සමාගම**
ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල, ශ්‍රී ලංකාව.

දුරකථන අංකය : 011-2 930 298/ 99 | ෆැක්ස් අංකය : 011-2 947 763
ඊමේල් : lakpohora@sltnet.lk | වෙබ් : www.lakpohora.lk

# සම්මාන




CNCI  Achivers Awards 2014
**ජාතික මට්ටමේ කුසලතා සම්මානය**




වාර්ෂික වාර්තා සම්මාන 2014
**අනුකූලතා සම්මානය**



ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන 2014
**රිදී සම්මානය**




ISO14001:2004
**පාරිසරික තත්ත්ව සහතිකය**




JASTECA CSR සම්මාන 2014
**කුසලතා සම්මානය**



අකිමොටෝ එස්5 සම්මාන 2014
**කුසලතා සම්මානය**



ජාතික ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන 2014
**රන් සම්මානය**




SLCBCC ව්‍යාපාරික තරුව 2014
**රිදී සම්මාන**



මානව සම්පත් කළමනාකරණ සම්මාන 2014
**රිදී සම්මානය**



ජාතික ඵලදායිතා සම්මාන - 2012/13
**දෙවන ස්ථානය**



මානව සම්පත් කළමනාකරණ සම්මාන 2013
**කුසලතා සම්මානය**

# පටුන


| | |
|---|---|
| මෙතෙක් ආ ගමන් මඟ | 08 |
| ආයතනික තොරතුරු | 11 |
| දැක්ම සහ අරමුණ | 14 |
| කාබනික මඟ ඔස්සේ පෙරට යන ලෝකය | 16 |
| මූල්‍ය අවධාරණයන් | 19 |
| පසුගිය වසර දහය සඳහා මූල්‍ය සාරාංශය | 20 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 22 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ ප්‍රකාශය | 24 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 28 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 34 |
| කළමනාකාරීත්ව විමසුම සහ විශ්ලේෂණය | 38 |
| මානව සම්පත් කළමනාකරණය | 44 |
| ආයතනික පාලනය | 47 |
| ආයතනයේ සංවිධාන ව්‍යුහය | 51 |
| අවදානම් කළමනාකරණය | 52 |
| විගණන සහ අවදානම් කළමනාකරණ කමිටු වාර්තා | 55 |
| අපගේ භූගෝලීය ආවරණය | 64 |
| මූල්‍ය ප්‍රකාශන | 67 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය | 69 |
| සභාපතිතුමාගේ සහ මූල්‍ය කළමනාකරුගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය | 70 |
| ස්වාධීන විගණකවරයාගේ වාර්තාව | 71 |
| සවිස්තරාත්මක ආදායම පිළිබඳ ප්‍රකාශනය | 83 |
| මූල්‍ය ස්ථානය පිළිබඳ ප්‍රකාශනය | 84 |
| සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය | 85 |
| මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශනය | 86 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 87 |
| පෙරකලාසි ආකෘතිය | 112 |




# වී වගාව සඳහා
# සෘජු පොහොර

යූරියා, මියුරියේට් ඔෆ් පොටෑෂ්, ට්‍රිපල් සුපර් පොස්ෆේට්, සින්ක් සල්ෆේට් ඇතුළු සෘජු පොහොර අප විසින් ගොවීන්ට සපයනු ලැබේ.

It has Been
an Eventful and Rewarding
# Journey So Far

**1964**

Ceylon Fertilizer Corporation (CFC) established under the Agriculture, Food and Cooperatives' Ministry headed by Hon. Felix Dias-Bandaranaike with an initial investment of just Rs. 58,000 and with Senior Additional Secretary of the ministry Mr. Sam Silva as its first Chairman. The Head Office was at Darley Road and the stores capable of handling 80,000 MT was established at Hunupitiya.

With no money to hire a van Mr.K.K. Anthony, one of the first employees of the corporation picks up 12 wicker baskets to be used for discarded paper for the newly established corporation and bicycles back to the HO with those baskets hung around his bicycle.

**1966**

Mixing operations commence at the Hunupitiya facility with a mixing capacity of 35 MT/hour. 70,000 MT was thus mixed here. The monopoly of private companies in the import, manufacture and distribution was broken forever.

**1970**

The corporation's products are sold under the brand name "Lanka Pohora" (Ceylon Fertilizer)

**1976**

The permit system is abolished and the fertilizer subsidy introduced.

**1977**

With the introduction of the open economy, the sector-leader status of the CFC is lost. Responding aggressively to private sector competition, the corporation expands its distribution network which hitherto was exclusively through cooperatives and agrarian services centers to authorized private dealers.

**1978**

Work on establishing regional warehouses in Maho, Weligama, Polonnaruwa and Anuradhapura is started with a gift of Rs. 28 million and technical assistance from the German Government.

**1980**

The newly established stores are now fully operational with capacities ranging from 13,000MT – 16,000MT. For the first time, marketing material is created and distributed by the corporation.

**1986**

The fertilizer coordinating committee established by the state to optimize the distribution of fertilizer. Through this committee, the first education, training and awareness programs on fertilizer use started for the agricultural community.

**1988**

With a Rs.22 million from the German Government, the modernization of the central store at Hunupitiya is completed. A new mixer capable of 30Mt/hour is also installed.

**1992**

A critical year in the history of the corporation when the government decided to divest itself of these assets. The Hunupitiya facility became the Ceylon Fertilizer Corporation while five other limited liability companies were created based on the geographic spread of the stores. Three of these were subsequently sold to private interests while the Thamankaduwa Fertiizer Company and the Ceylon Fertilizer Corporation were run as two separate companies.

**1994**

The main responsibility of efficiently running the fertilizer subsidy was vested in the CFC. During these years of war, it worked hard to provide fertilizer to outliers and remote rural areas despite significant terrorist threats.

**2002**

The Head Office of the CFC which has been at Chatham Street was shifted to the Hunupitiya facility.

**2005**

The historic paddy fertilizer subsidy commenced by the then government. A massive program to provide a 50kg bag of fertilizer at the subsidized rate of Rs.350 per bag was implemented providing relief to 70% of farmers.

**2007**

The company was in serious fiscal vulnerability with net assets amounting to 330 million red.

**2008**

With the promise of the government not to privatize state agencies, a new board of management was appointed to the CFC and the company was re-registered under the Companies Act Number 07 of 2007

**2010**

The company, guided by wise management decisions starts to pull itself out of the red. It reduces It turns itself around and by 2013, has a net asset worth of Rs.1606 million black paying Rs.39 million as profit back to the treasury.

**2013**

52 high quality fertilizer stores established island wide as well as a transportation network with GPS tracking technology.





# ආයතනික
## තොරතුරු

**සමාගමේ නාමය**

සීමාසහිත ලංකා පොහොර සමාගම

**සමාගමේ ලියාපදිංචි අංකය**

PB 499

**නෛතික ස්වභාවය**

ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ පූර්ණ හිමිකාරිත්වය සහිත වගකීමෙන් සීමිත සමාගමකි.

**ලියාපදිංචි කාර්යාලය සහ ලිපිනය**

සීමාසහිත ලංකා පොහොර සමාගම
ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, ශ්‍රී ලංකාව.

දුරකථන : +94 11 2 930 298 / 99

ෆැක්ස් : +94 11 2 947 763

විද්‍යුත් තැපෑල : lakpohora@sltnet.lk

වෙබ් අඩවිය : www.lakpohora.lk

# අධ්‍යක්ෂ මණ්ඩලය

**සභාපති**

**රෝෂන වඩුගේ මහතා**
(19.02.2015 -31.03.2017)

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

**මාධව වත්තේගම මහතා**
(19.02.2015 – 31.03.2017)

**චන්දන පැල්පිට මහතා**
01.04.2016 – 31.12.2016)

**අධ්‍යක්ෂවරු**

**ජේ.එම්.එස්.ඩී. රත්නායක මහත්මිය**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ප්‍රතිපත්ති
සැලසුම් දෙපාර්තමේන්තුව
(10.03.2015 – 31.03.2017)

**අනෝජා හේරත් මහත්මිය**
අධ්‍යක්ෂ - සංවර්ධන
කෘෂිකර්ම අමාත්‍යංශය
(25.02.2015 – 31.03.2017)

**හේමක ලසිත් බාලසූරිය මහතා**
(19.02.2015 – 31.03.2017)

**උපුල් පීරිස් මහතා**
(19.02.2015 – 31.03.2017)

**සමාගම් ලේකම්**

එස් ඇන්ඩ් ඒ කන්සල්ටන්ට්ස් (පෞද්ගලික) සමාගම

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

**පී.ආර්. සමරවීර**
සාමාන්‍යාධිකාරී (වැඩබලන)
කළමනාකරු (මූල්‍ය)

**බී.ඩී.එල්. කුමාරසිරි මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක

**ඉංජිනේරු ඩී.එම්.එන්.ඒ. දිසානායක**
කළමනාකරු (කාර්මික)

**ආර්.ඒ.පී. පෙරේරා මහතා**
කළමනාකරු (බෙදාහැරීම්)

**ආර්.පී.එස්. බොධිපාල මහත්මිය**
කළමනාකරු
(අලෙවි හා විකුණුම්)

**යූ. පෙරේරා මහත්මිය**
කළමනාකරු
(රසායනාගාරය)

**සී.පී.පී. බුලත්සිංහල මහතා**
කළමනාකරු (වැඩබලන)
(පරිපාලන සහ මානව සම්පත්)

**ජී.ජී. සමන් මහතා**
කළමනාකරු (වැඩබලන)
සම්පාදන සහ ආනයන




# තේ වගාව සඳහා

ටී-65, ටී-200, ටී-750, යූටී-1625, යූටී-397, යූටී-752,
වීපීඑල්සී-880, වීපීඑල්සී-945, වීපීයූඑම්-910, යූ-625,

## අරමුණ

ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව නිෂ්පාදනය කරන ලද රසායනික සහ කාබනික පොහොර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රජාව වෙත සැපයීම

## දැක්ම

ශ්‍රී ලාංකික පොහොර වෙළෙඳපොළ නියමුවා ලෙස කෘෂි ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නව නිපැයුම් සේවා හා යෙදවුම් සපයන විවිධාංගීකරණය වූ නව ලොවට ගැළපෙන ප්‍රමුඛතම ආයතනය වීම.

## මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ලක් පොහොර පවුලේ උපරිම දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ නිෂ්පාදන, ආදායම හා ලාභදායිත්වය වැඩි කිරීම සඳහා බහුවිධ වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීම.

## වටිනාකම්

පාරිසරික තිරසාරත්වය පවත්වාගැනීම සහ බිම් මට්ටමෙන් ගොවීන් සමඟ සම්බන්ධව කටයුතු කිරීම අපගේ මූලික වටිනාකම් වන අතර, අප විසින් අපගේ අනාගත නිෂ්පාදන මාලාව ගොඩනගනුයේ ඒවා මතය.



# කාබනික මඟ ඔස්සේ පෙරට යන ලෝකය...

**ගෝලීය සහ දේශීය ප්‍රවණතාවන් මෙන්ම වෙළෙඳපොළ යථාර්ථයන් අවබෝධ කරගනිමින්, 2016 දෙවැනි කාර්තුව අවසාන වන විට දේශීය සහ ජාත්‍යන්තර කාබනික පොහොර සැපයුම්කරුවන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව කාබනික කෘෂි පොහොර වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමට සමාගම විසින් පියවර ගනු ලැබ ඇත.**

කාර්මික යුගයේ අවශ්‍යතා මත ස්වාභාවික සම්පත් සුරැකීම සහ පුනර්ජනනය කිරීම පිළිබඳව සැලකිලිමත් නොවෙමින් ඒවා ඉවක් බවක් නොමැතිව භාවිත කිරීම නිසා ලොව ස්වාභාවික සම්පත් සීඝ්‍රයෙන් ක්ෂය වී යෑමත් සමඟ මේ වන විට මුළු මහත් ලෝකයම අර්බුද හතරකට මුහුණ දී සිටියි. ඒවා නම් කාලගුණ අර්බුදය, ආහාර අර්බුදය, බලශක්ති අර්බුදය සහ මූල්‍ය අර්බුදය යනාදිය වෙයි. අප දන්නා පරිදි මේවායෙන් එකක් මඟින් වුව මිනිස් ශිෂ්ටාචාරය විනාශ වී යා හැකි අතර, ඒවා එකට එක් වූ විට එල්ල වන්නේ විසඳුම් ලබාදිය නොහැකි තරමටම බරපතළ අභියෝගයකි.

කෙසේවුවද, එක්සත් ජාතීන් නමැති පොදු එකමුතුව යටතේ එක්ව සිටින ලෝකයේ විවිධ රටවල නායකයින් මේ සියලු අභියෝග ජයගැනීම සඳහා තිරසර සංවර්ධන ඉලක්ක ලෙස හැඳින්වෙන ඉලක්ක දාහතක් ස්ථිරසාර වශයෙන් ස්ථාපිත කර ඇත. අපගේ ජනාධිපතිතුමා ශ්‍රී ලංකාව වෙනුවෙන් මේ ඉලක්ක සඳහා කැපවීම සම්බන්ධයෙන් ඉතා ප්‍රබල ප්‍රකාශයක් ගෝලීය ප්‍රජාව හමුවේ තැබූ අතර, මෙරට සමස්ත ප්‍රතිපත්ති සහ සංවර්ධන ක්‍රියාදාමය මෙකී ඉලක්ක මත සකසමින් රට පාලනය කිරීම සඳහා එතුමන්ව තෝරාපත් කරගනු ලැබීමට මූලික වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයට සෘජුව අනුකූල වන පරිදි එතුමන් කටයුතු කරයි.



ලංකා පොහොර සමාගම විසින් දෙවැනි ඉලක්කය (කුසගින්න තුරන් කිරීම), 3 වැනි ඉලක්කය (යහපත් සෞඛ්‍යය), 12 වැනි ඉලක්කය (තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය), 13 වැනි ඉලක්කය (කාලගුණ කටයුතු) සහ 15 වැනි ඉලක්කය (භූමියේ ජීවිතය) යනාදිය ඉතා සුවිශේෂ ලෙස සැලකිල්ලට ගනු ලැබ ඇත්තේ එහි ව්‍යාපාර ආකෘතියට සහ කාර්ය පිළිවෙතට ඒවා සෘජුවම බලපාන බැවිනි. එය ශ්‍රී ලංකාවේ මහා කෘෂි ප්‍රජාවට කාබනික නිෂ්පාදන සැපයීම මත පදනම්ව හරිත පොහොර යුගයක් වෙත සිය අවධානය යොමු කිරීමට මෙම ආයතනය ගත් තීරණය සඳහා බලපෑ ප්‍රධාන සාධකයක් විය.

කාබනික කෘෂිකර්මාන්තය යනු පසෙහි සෞඛ්‍යය පවත්වාගනිමින්, පරිසර පද්ධති පුනර්ජනනය කරන අතරම ජනතාවට සුවැති තත්ත්වයන් සහතික කරන නිෂ්පාදන ක්‍රමයකි. අහිතකර බලපෑම් ඇතැයි සැලකෙන ද්‍රව්‍ය භාවිතය වෙනුවට ප්‍රාදේශීය තත්ත්වයන් ඇතුළත පාරිසරික ක්‍රියාවලීන්, ජෛවවිවිධත්වය සහ ස්වාභාවික චක්‍ර සකසාගැනීම යනාදිය කෙරෙහි එහිදී අවධානය යොමු කෙරෙයි. කාබනික කෘෂිකර්මයේදී අපගේ පොදු පරිසරයේ හෝ පොදු තත්ත්වයන්වල සුබසිද්ධිය උදෙසා සම්ප්‍රදාය, නව්‍යකරණය සහ විද්‍යාව යොදාගැනෙන අතර, ඉල්ලුම්-සැපයුම් ජාලය හා සම්බන්ධ සියලු පිරිස් අතර සමානතාවයෙන් යුතු සබඳතා ප්‍රවත්වාගැනෙයි. අතිගරු ජනපතිතුමන් ජාත්‍යන්තර ප්‍රජාවට දුන් ප්‍රතිඥාව අනුව රජය විසින් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා 'වස විස නැති දැයක් වැඩසටහන ' යන නමින් ජාතික මට්ටමේ කෘෂි ප්‍රතිපත්තියක් නිර්මාණය කරනු ලැබිණි. මෙහි එක් අරමුණක් වන්නේ රට පුරා ගොවි ප්‍රජාවට බලපෑමක් එල්ල කර ඇති වකුගඩු රෝගය ඇතුළු බෝ නොවන රෝග රැසක් ඇති වීමේ ප්‍රවණතාව අඩු කිරීම සඳහා කෘත්‍රිම පොහොර, පළිබෝධනාශක සහ කෘෂිනාශක භාවිතය අවම කිරීමය. එයට අමතර වශයෙන් එමඟින් ශ්‍රී ලාංකේය වෙළෙඳපොළෙහි රසායනික පොහොර සැපයුම අවම කෙරෙනු ඇති අතර, දේශීය වෙළෙඳපොළ සඳහා කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට දිරිගැන්වීම් ලබාදීම මඟින් කාබනික කෘෂිකර්මය වැනි අඩු අහිතකර බලපෑමක් සහිත කෘෂි පිළිවෙත් ප්‍රචලිත කිරීමද සිදු කෙරෙනු ඇත.

වෙළෙඳපොළ යථාර්ථයන් මෙන්ම දේශීය සහ විදේශීය ප්‍රවණතාවන් වටහා ගනිමින් සමාගම විසින් 2016 දෙවැනි කාර්තුව අවසාන වන විට දේශීය සහ ජාත්‍යන්තර කාබනික පොහොර සැපයුම්කරුවන්ගේ සහයෝගීතාවයෙන් යුතුව කාබනික කෘෂි පොහොර වාණිජ වශයෙන් නිෂ්පාදනය කිරීමට පියවර ගෙන ඇත. පොහොර ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ සිය අනාගතය රැඳී ඇත්තේ මෙවැනි වෙනස් මඟක් ගැනීමෙන් බව වටහාගෙන සිටින සමාගම කාබනික පොහොර ක්ෂේත්‍රයේ අනභිබවනීය ප්‍රමුඛයා ලෙස පෙරමුණ ගැනීම සඳහා සැකසුම් ක්‍රියාවල සිට බෙදාහැරීම සහ ගොවි ජනතාව දැනුවත් කිරීම දක්වා වූ පුළුල් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.




# වෙනත් වගාවන් සඳහා

එළවළු, පලතුරු, අර්තාපල්, මිරිස්, කව්පි, රටකජු,
මුංඇට බඩඉරිඟු සහ උක් වගාව ආදිය සඳහා
විශේෂයෙන් මිශ්‍ර කළ පොහොර

# මූල්‍ය අවධාරණයන්




| ආදායම් අවධාරණයන් හා අනුපාත | | 2017 | 2016 | වෙනස |
|---|---|---|---|---|
| | | රුපියල් | රුපියල් | % |
| ආදායම | රු. | 2,350,637,985 | 4,242,769,733 | -45% |
| බදු පෙර ලාභය | රු. | 127,804,541 | 836,604,005 | -85% |
| ආදායම් බදු වියදම් | රු. | 11,787,491 | 233,331,176 | -95% |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | රු. | 139,592,032 | 603,272,829 | -77% |
| ලාභාංශ | රු. | 30,000,000 | 30,000,000 | - |
| කොටසක ඉපැයුම | රු. | 2.78 | 12.01 | -77% |
| වත්කම් මත ප්‍රතිලාභ | රු. | 0.39% | 1.65% | - |
| හිමිකම් මත ප්‍රතිලාභ | රු. | 2.54% | 12.76% | - |
| | | | | |
| **මූල්‍යමය තත්ත්ව අවධාරණයන් හා අනුපාත** | | | | |
| මූල්‍ය වත්කම් | රු. | 35,608,679,679 | 36,603,359,337 | -3% |
| මුළු හිමිකම් | රු. | 5,504,165,203 | 4,728,367,363 | 16% |
| නිකුත් කළ කොටස් සංඛ්‍යාව | සංඛ්‍යාව | 50,245,608 | 50,245,608 | - |
| කොටසකට ශුද්ධ වත්කම් | රු. | 110 | 94 | 17% |

# පසුගිය දස වසර තුළ මූල්‍ය අවධාරණයන්

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප | ශ්‍රී.ල.ගි.ප |
| | (For 7 Month) | (For 7 Month) | | | | | | | | |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය** | | | | | | | | | | |
| ආදායම | 900,461,713 | 1,370,080,315 | 1,904,299,851 | 2,246,402,738 | 2,496,268,383 | 2,450,132,816 | 2,563,549,727 | 3,835,989,834 | 4,242,769,733 | 2,350,637,985 |
| දළ ලාභය | 204,414,682 | 221,286,371 | 322,826,103 | 414,124,001 | 310,189,751 | 621,684,097 | 575,467,461 | 855,558,167 | 1,097,447,923 | 231,025,777 |
| වෙනත් ආදායම් | 76,899,044 | 130,892,642 | 132,287,779 | 157,164,017 | 197,912,757 | 108,809,998 | 93,172,755 | 142,197,667 | 122,926,594 | 29,096,825 |
| බදු පෙර ලාභය | 26,957,610 | 35,088,271 | 42,411,705 | 73,979,009 | 159,544,495 | 199,894,319 | 241,328,764 | 520,200,738 | 836,604,005 | 127,804,541 |
| බදු | (19,766,392) | (25,092,763) | (35,000,000) | (43,666,668) | (52,315,944) | (73,037,738) | (62,869,312) | 134,184,888 | (233,331,176) | 11,787,491 |
| බදු පසු ලාභය | 7,191,217 | 9,995,508 | 7,411,705 | 30,312,341 | 107,228,551 | 126,856,581 | 178,459,452 | 386,015,851 | 603,272,829 | 139,592,032 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 444,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 |
| ප්‍රත්‍යාගණන සංචිත | 1,616,307,519 | 1,616,307,519 | 1,986,087,280 | 1,986,087,280 | 1,836,179,780 | 1,835,723,580 | 1,835,723,580 | 1,833,071,080 | 1,833,071,080 | 2,506,976,187 |
| ආදායම් සංචිත | 191,389,499 | 201,385,007 | 208,796,713 | 224,109,054 | 1,285,578,730 | 1,397,891,510 | 1,500,363,432 | 1,869,914,195 | 2,392,840,203 | 2,494,732,936 |
| මුළු හිමිකම් | 2,252,153,098 | 2,320,148,607 | 2,697,340,072 | 2,712,652,414 | 3,624,214,590 | 3,736,071,170 | 3,838,543,092 | 4,205,441,355 | 4,728,367,363 | 5,504,165,203 |
| දේපළ, පිරියත හා උපකරණ | 1,642,814,214 | 1,686,442,553 | 1,902,075,430 | 1,895,412,152 | 1,908,557,760 | 1,882,887,059 | 1,879,174,306 | 1,865,055,225 | 1,838,655,988 | 2,683,237,393 |
| නොහිමි ප්‍රාග්ධන වැඩ | 17,895,434 | 20,024,735 | 15,934,103 | 542,901 | - | - | - | 29,982,587 | 32,152,294 | 21,960,737 |
| විලම්භිත බදු වියදම | - | - | - | - | 4,862,949 | 73,037,738 | 5,561,375 | 37,484,888 | - | - |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | 146,109,366 | 172,614,796 | 332,205,456 | 434,767,955 | 471,025,753 | 338,620,163 | 471,894,936 | 489,125,747 | 514,903,604 | 532,548,539 |
| අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - | - | 669,017 | 344,717 | 115,417 | 79,667 | - |
| විලම්භිත බදු වත්කම් | - | - | - | 76,814,523 | 71,951,574 | - | - | - | - | - |
| ශුද්ධ ජංගම වත්කම් | 592,829,041 | 610,949,150 | 12,476,640,540 | 6,975,143,544 | 1,706,541,296 | 1,915,693,141 | 2,025,842,182 | 2,417,551,302 | 2,963,028,124 | 3,020,938,645 |
| විලම්භිත බදු බැරකම් | - | - | - | - | - | 1,086,164 | 6,647,539 | 44,132,427 | 40,928,542 | 155,078,112 |
| කෙටි/ දිගුකාලීන ණය | - | - | 11,837,929,928 | 5,369,929,928 | - | - | 17,728,367,618 | 31,304,325,268 | | - |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය** | | | | | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (9,812,750,171) | (23,925,719) | (12,169,047,254) | (16,012,155,140) | 12,695,227,509 | (9,517,159,808) | (5,094,105,859) | (9,560,794,959) | (738,963,570) | 11,542,320 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | 9,796,712,574 | (85,865,511) | 12,216,587,459 | (36,565,665) | (8,458,411) | 83,232,936 | (508,688,188) | (1,021,212,231) | (1,086,700,012) | (591,862,107) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (19,176,247) | 46,739,763 | (159,725,222) | 16,168,483,382 | (13,079,312,780) | 9,575,483,282 | 5,654,013,585 | 10,614,850,014 | (3,843,885,272) | 834,304,831 |
| **වෙනත් තොරතුරු** | | | | | | | | | | |
| කොටසක ඉපැයුම (රු.) | 0.16 | 0.22 | 0.17 | 0.60 | 2.13 | 2.52 | 3.55 | 7.68 | 12.01 | 2.78 |
| කොටසකට ලාභාංශය (රු.) | - | 0.06 | 0.06 | 0.18 | 0.18 | 0.76 | 1.05 | 2.3 | 3.60 | 0.83 |
| කොටසකට ශුද්ධ වත්කම් (රු.) | 51 | 46 | 54 | 54 | 72 | 74 | 76.4 | 83.7 | 94 | 110 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1.07 | 1.04 | 2.09 | 1.29 | 1.08 | 1.08 | 1.06 | 1.06 | 1.09 | 1.10 |



# පොල්

# පොල් සඳහා

වයි.පී.එම්. (ඩබ්ලිව්) (ඩී), ඒ.පී.එම්. (ඩබ්ලිව්)/(ඩී)
රා මැදීම (ඩබ්ලිව්)/(ඩී)



දීර්ඝ කාලීන ආයතනික තිරසාරත්වය උදෙසා මූලික කාර්යසාධනය සහ අනාගත ඉලක්ක හඳුනාගැනීම වැදගත් බව සමාගම විශ්වාස කරයි. සීමාසහිත ලංකා පොහොර සමාගමේ අභිමතාර්ථය වන්නේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි කෘෂි ප්‍රජාවේ අවශ්‍යතා සපුරාලීමය. මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රය සවිමත් කිරීම පිණිස පුළුල් රාජ්‍ය නිර්දේශයන් සහ වැඩසටහන් සමඟ දැඩිව බැඳුණු සිය 2017 වසරේ ක්‍රියාකාරකම් ඔස්සේ සමාගම සුවිශේෂී සන්ධිස්ථානයකට ළඟා වී ඇති බව පෙනී යයි. මෙතැන් සිට, සමාගමෙහි ස්ථාවරය මෙන්ම එහි ප්‍රධාන ක්‍රමෝපායයන් හා සමපාත සහ සමගාමී වන යාන්ත්‍රණයන් ඔස්සේ අනාගත සංවර්ධන ක්‍රමෝපායයන් සඳහා සමාගමට දායක විය හැකි ආකාර පිළිබඳවද පැහැදිලිතාවක් ඇති කරගැනීම ඉතා වැදගත්ය.

වෙනත් රටවල කෘෂිකර්මය මුහුණ දෙන අභියෝග සහ ගැටලු සැලකිල්ලට ගන්නා විට ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රයේ කැපීපෙනෙන වර්ධනයක් අත් කරගනිමින් රට තුළ යහපත් ආර්ථික සංවර්ධනයක් ඇති කළ උත්සාහයන් අතර කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගැනීමට සමත්ව ඇත.

දිවයින පුරා ව්‍යාප්ත සිය බෙදාහැරීම් ජාලය ඔස්සේ දැයට සාර්ථකව සහ අඛණ්ඩව පොහොර සැපයීමට සමාගමට ඇති හැකියාව සීමාසහිත ලංකා පොහොර සමාගමේ ආර්ථික වර්ධනයට සහ සාර්ථකත්වයට විශාල දායකත්වයක් ලබා දී ඇති බව මම දකිමි. ලංකා පොහොර සමාගමේ අපගේ කණ්ඩායම දැඩි කැපවීමෙන් යුතුව කටයුතු කරමින් අපේක්ෂිත ඉලක්ක සපුරාලන අතරම දිවයින පුරා ව්‍යාප්ත අපගේ බෙදාහැරීම ජාලය ඔස්සේ දැයට සාර්ථකව සහ අඛණ්ඩව පොහොර සැපයීම සිදුකරමින් සමාගම ඉදිරියට ගෙනයෑමටත්, එහි ආර්ථික වර්ධනය සහ වැඩිදියුණුව සැලසීමටත් සමත්ව ඇත. අප කණ්ඩායමේ සාමාජිකයන්ගේ ප්‍රසංශනීය සේවය, කැපවීම සහ උදයෝගය විශේෂයෙන් ඇගයිය යුතු වන්නේ ඔවුන්ගේ සුවිසල් දායකත්වය අපගේ ඉලක්ක සපුරාගැනීම සඳහා ඉතා වැදගත්වූ බැවිනි.

මෙම ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ආශිර්වාදය සහ උපදෙස් ලබාදීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, විශාල අනුග්‍රහයක් ලබාදුන් ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමාටත්, නිරතුරුව සහාය ලබාදුන් අමාත්‍යංශ ලේකම්තුමා ප්‍රමුඛ අමාත්‍යංශයේ ප්‍රධාන නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කර සිටිමි.

ගෙවී ගිය 2017 මාර්තු 31 වැනිදායින් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළදී අප විසින් රජයට ගෙවන ලද සමස්ත බදු ප්‍රමාණය රු. මිලියන 11 ක් විය. ඒකාබද්ධ රාජ්‍ය

සමාගම විසින් ශ්‍රී ලංකාව පුරා බලයලත් නියෝජිතයින් 1,750කින් සමන්විත ජාලයක් ස්ථාපිත කරනු ලැබ ඇති අතර, සිය පාරිභෝගිකයින් සමඟ සෘජුව සම්බන්ධ වීම සඳහා සමාගමට ඇති හැකියාව ඉහළ නංවන දිස්ත්‍රික් පොහොර ගබඩා 40 ක් ඔස්සේ සමාගම සිය නිෂ්පාදන බෙදාහරියි.

# සභාපතිතුමාගේ පණිවුඩය

අරමුදලෙන් කිසිදු මූල්‍ය අනුග්‍රහයක් නොමැතිව ලාභදායී ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීමට සමාගම සමත් වී ඇත.

සමාගම විසින් ශ්‍රී ලංකාව පුරා බලයලත් නියෝජිතයින් 1,750කින් සමන්විත ජාලයක් ස්ථාපිත කරනු ලැබ ඇති අතර, සිය පාරිභෝගිකයින් සමඟ සෘජුව සම්බන්ධ වීම සඳහා සමාගමට ඇති හැකියාව ඉහළ නංවන දිස්ත්‍රික් පොහොර ගබඩා 40ක් ඔස්සේ සමාගම සිය නිෂ්පාදන බෙදාහරියි.

කෙටි සහ දීර්ඝ කාලීන ක්‍රමෝපායයික ඉලක්ක සපුරාගැනීම සඳහා අලෙවි බලකාය ඉතා ඵලදායී ආකාරයකින් කළමනාකරණය කරනු ලැබ ඇති අතර, සියලු සේවකයින්ට සිය දක්ෂතා සහ සුදුසුකම් මත පදනම්ව උසස්වීම් අවස්ථා ලබාගැනීමේ හැකියාව සැලසෙන පරිදි කළමනාකරණ සේවා අංශය විසින් අනුමත කරන ලද සේවක බඳවාගැනීම් සහ ප්‍රවර්ධන ක්‍රියාවලීන් යටතේ කෙරෙන බඳවාගැනීම් ප්‍රමිතිගත කර ඇත.

අන්තර් කාර්යාල ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව උපරිම මට්ටමකට ගෙන යෑම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉහළම අයුරින් ක්‍රියාත්මක වන ඉතා කාර්යක්ෂම තොරතුරු බෙදාහැරීම් තාක්ෂණයක් සමාගම විසින් පවත්වාගෙන යනු ලබන අතර, නවතම මෘදුකාංග භාවිතය පිළිබඳව පිරිස දැනුවත් කිරීම සඳහා වන අඛණ්ඩ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

ලංකා පොහොර සමාගම සැමවිටම සමාජය වෙනුවෙන් දායකත්වයන් සපයන්නේ එය සමාජ වගකීමක් ලෙස සලකමිනි. දිගු කාලීන ආයතනික තිරසාරත්වය සඳහා වන මූලික ක්‍රියාකාරීත්වය සහ අනාගත ඉලක්ක හඳුනාගැනීම වැදගත් බව සමාගම විශ්වාස කරයි. ඒ සඳහා දිගු සහ කෙටි කාලීන ක්‍රමෝපායයන් හඳුනාගනිමින් සහ ඒවා වෙත යොමු වෙමින් ක්‍රමෝපායයික මාර්ග සිතියමක් සැකසීමේ ක්‍රියාවලියෙහි සමාගම මේ වන විට යෙදී සිටියි.



**රෝෂණ වඩුගේ**
සභාපති



තවත් එක් මූල්‍ය වසරක් නිමාවට පත් වන මේ අවස්ථාවේදී 2016/17 මූල්‍ය වසර සඳහා වන විගණනය කළ මූල්‍ය ප්‍රකාශ සහ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන අතරම, අපගේ හිතවත් කොටස් හිමිකරුවන් වන ඔබ සැම ඇමතීමට ලැබීම මට මහත් සතුටකි.

නිෂ්පාදනයේ කැපීපෙනෙන පහළ වැටීමක් සහ දළ ජාතික නිෂ්පාදනය සඳහා කෘෂි අංශයෙන් සැපයුණු දායකත්වයේ සැලකිය යුතු පහළ වැටීමක් ඇති වන පරිදි ගංවතුර සහ නියඟ මඟින් කෘෂි ක්‍රියාකාරකම්වලට අහිතකර බලපෑම් ඇති කළ පසුබිමක් තුළ මේ වසර කෘෂිකාර්මික ක්ෂේත්‍රයට දුෂ්කර කාලපරිච්ඡේදයක් විය.

කෙසේවුවද, කෘෂිරසායන ද්‍රව්‍ය මත යැපීම අඩු කරමින්, ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධන මාවත කරා ගෙන යන අතරම මුළු හදින්ම තිරසාර කෘෂි පිළිවෙත් වැළඳගන්නා රටවල් අතරින් එකක් ලෙස ලොවට ආදර්ශයක් බවට පත් කිරීම සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වෙමින් මේ වසර තුළදී සිය නිෂ්පාදන රැස වඩාත් පුළුල් කිරීම සඳහාද සමාගම විසින් කටයුතු කරනු ලැබිණි.

දේශීය වෙළෙඳපොළ සඳහා කාබනික කැට පොහොර නිෂ්පාදනය කොට බෙදාහැරීමට කටයුතු කළ ප්‍රථම රාජ්‍ය ආයතනය ලංකා පොහොර සමාගම වන බව මා සඳහන් කරන්නේ ආඩම්බරයෙනි. මේ මුදල් වර්ෂය තුළදී, සිය බෙදාහැරීම් ජාලයේ මෙන්ම ගොවීන්ගේද චින්තන රටාව වෙනස් කිරීමට දරන ලද උත්සාහයන්වලදී කෘත්‍රිම පොහොර භාවිතයට සාපේක්ෂව කාබනික පොහොර භාවිතයේ ඇති වාසි පිළිබඳව ගොවි ජනතාව අතර ඇති දැනුවත්බව ඉහළ නැංවීම සඳහා මහා පරිමාණ, දීප ව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, එමඟින් අපගේ මූලික ඉලක්ක පිරිස වන ගොවි ප්‍රජාව තුළ ධනාත්මක ආකල්ප වෙනසක් ඇති කිරීම ඔස්සේ අලෙවි ශක්‍යතාව ඉහළ නැංවිණි.

ශ්‍රී ලංකාවේ කෘෂිරසායන භාවිතය අවම කරමින් වර්ෂ 2020 වන විට අපගේ කෘෂිකර්මාන්තමය නිෂ්පාදන සම්බන්ධයෙන් මුළුමනින්ම කාබනික පසුබිමක් වෙත ගෙන යෑම අරමුණු කරගනිමින් වඩාත් යහපත් ලොවක් වෙනුවෙන් දේශීය හා විදේශීය වශයෙන් දරනු ලබන දායකත්වයන් උදෙසා අප කැප වන්නේ එසේය. එම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා, නිබඳව වඩ වඩාත් පුළුල් කෙරෙන ඝන සහ දියර ආකාරයේ කාබනික පොහොර නිෂ්පාදන මාලාවක් නුදුරු අනාගතයේදීම ඉදිරිපත් කිරීමට සමාගම ක්‍රමෝපායයික වශයෙන් සැලසුම් කරයි.

# සාමාන්‍යාධිකාරීතුමාගේ ප්‍රකාශය

**දේශීය වෙළෙඳපොළ සඳහා කාබනික කැට පොහොර නිෂ්පාදනය කොට බෙදාහැරීමට කටයුතු කළ ප්‍රථම රාජ්‍ය ආයතනය ලංකා පොහොර සමාගම වන බව මා සඳහන් කරන්නේ ආඩම්බරයෙනි.**

විස්මිත ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා ඉපැරණි සාම්ප්‍රදායික ක්‍රමවේදයන් නැවත සැකසීම මඟින් දේශීය කෘෂිකර්මාන්තය තුළ පෙරළියක් ඇති කිරීම සඳහා වන දූරදර්ශී දැක්මක් සහිතව ශ්‍රී ලංකාව පුරා කාබනික පොහොර සංකල්පය ප්‍රවර්ධනය කිරීම උදෙසා ක්‍රමෝපායයික සැලසුම් ගණනාවක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සමාගම සමත් විය. තමන් වටා ඇති කාබනික ලෝකය සිය එදිනෙදා ජීවිතයේම කොටසක් ලෙස සැලකූ දේශීය ගොවීන්ට කාබනික පොහොර භාවිතය පිළිබඳ සංකල්පය ආගන්තුක නැත. මෙරට ආදි ඉතිහාසයේ පවා ස්වාභාවික කාබනික සම්පත් ශ්‍රී ලාංකේය කෘෂිකර්මය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. සිය වගාවන් සඳහා ස්වාභාවික කාබනික ද්‍රව්‍ය යොදාගත් අපේ මුතුන්මිත්තන් වී, පලතුරු සහ එළවළු, තේ, රබර්, පොල්, කුරුඳු සහ කරාබුනැටි ඇතුළු වගාබෝග රැසකින් ඇදැහිය නොහැකි තරම් ඉහළ අස්වැන්න නෙළාගනිමින් ලෝකය මවිත කළ බව සඳහන් වෙයි.

පුරාතනයේදී ශ්‍රී ලංකාව තුළ අතිරේක කෘෂි එලදාවන් නිෂ්පාදනය වූ බවත්, ඒවා ලොව පුරා විවිධ රටවලට අපනයන කරන ලද බවත් වාර්තා වෙයි. මේ සියලු විස්මයන් පසුපස වූයේ අපේ මුතුන්මිත්තන්ට විවිධාකාරයෙන් ප්‍රතිලාභ ගෙන දුන් සහ ඔවුන් විසින් සහජීවනාත්මක වූත්, අතිසමීප වූත් සබඳතාවක් පවත්වාගන්නා ලද ස්වාභාවික පරිසරයෙන් ලබාගත් කාබනික පොහොරය. අපට නිසැක වශයෙන්ම අතීතයෙන් බොහෝ දේ ඉගෙන ගනිමින්, කෘෂිකාර්මික කටයුතු සඳහා කාබනික පොහොර භාවිතය සම්බන්ධයෙන් වඩාත් විධිමත් සහ සංවර්ධනාත්මක ක්‍රම සකසාගත හැකි යැයි යන අදහස ඇතිව අපි දිවයින පුරා ගොවීන් සහ වැවිළිකරුවන් අතර කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමට නව ව්‍යාපෘති සැලසුම් කොට දියත් කර ඇත්තෙමු. පසුගිය වසර ගණනාව පුරා මනා සුදුසුකම් ලත් වෘත්තිකයින්ගේ සහායද ඇතිව කාබනික පොහොර පිළිබඳව ඉගෙන ගැනීම සඳහා විවිධ අධ්‍යයනයන් සහ පර්යේෂණ රැසක් සිදු කළ අපගේ අවබෝධය අනුව කාබනික පොහොර සමන්විත වන්නේ නැවුම් සහ වියළි ශාක ද්‍රව්‍යවල සිට සත්ව අපද්‍රව්‍ය සහ කැළිකසල මෙන්ම කෘෂිකාර්මික කටයුතුවලදී ඉවත දමන ද්‍රව්‍ය යනාදිය ඇතුළත් ශාක ආශ්‍රිත ද්‍රව්‍ය රැසකිනි.

කාබනික පොහොරවල පෝෂණ සංයුතිය එක් එක් ප්‍රභවයන් අනුව විශාල වශයෙන් වෙනස් වන අතර, පහසුවෙන් දිරාපත් වන ද්‍රව්‍යවල වඩාත් වැඩි පෝෂණ ප්‍රභවයන් ඇත. රසායනික පොහොරවලට සාපේක්ෂව කාබනික පොහොරවල නයිට්‍රජන් සහ පොස්ෆරස් සංයුතිය සැලකිය යුතු ලෙස අඩුවී ඇත. අන්තර්ගත තෙතමන මට්ටමද කාබනික පොහොරවල ඇති

නයිට්‍රජන් සහ පොස්ෆරස් සාන්ද්‍රණය පහත දමන හෝ තනුක කරන තවත් සාධකයකි. එබැවින් ඉහළ තෙතමනයෙන් යුතු කාබනික පොහොර දීර්ඝ දුර ප්‍රමාණයන් වෙත ප්‍රවාහනය කිරීම ආර්ථික වශයෙන් වාසිදායක නොවිය හැකිය. කෙසේවුවද, අදාළ කෘෂි නිෂ්පාදන ක්‍රමෝපායයන්ට යෝග්‍ය වන්නේ නම් ඒ ඒ ප්‍රදේශවල අවට පරිසරයෙන් ලබාගත හැකි පොහොර ප්‍රභවයන් වගාවන්ට යොදාගැනීම සැම අතින්ම සුදුසුය. සත්ව පොහොරවල ඇති පෝෂණ අගය කෘෂිකාර්මික කටයුතුවලදී ඉවත දමන ද්‍රව්‍යවල ඇති පෝෂණ අගයට වඩා විචල්‍ය මට්ටමක පවතී. සතුන් ලබාගන්නා ආහාර, සැකසුම් ද්‍රව්‍ය වර්ග සහ භාවිතය, ඒවායේ වයස සහ ගබඩා කර තබාගත් ආකාරය ඇතුළු සාධක පොහොරවල පෝෂණ වටිනාකම කෙරෙහි බලපායි. මේ සාධක කාලය අනුව ගොවිපොළේ ස්වභාවය මත සහ ප්‍රාදේශීය වශයෙන් මෙන්ම විශාල භූගෝලීය පරිමාණය අනුව වෙනස් විය හැකිය. එහෙත් එයට සාපේක්ෂව කෘෂිකාර්මික අතුරුඵලවල පෝෂණ සංයුතිය අඩු විචල්‍යතාවයෙන් යුතු වන නමුදු එය නිෂ්පාදනය සඳහා යොදාගැනෙන කර්මාන්තමය ක්‍රියාවලියෙන් එයට බලපෑමක් ඇති විය හැකිය. කෙසේවුවද, කාබනික පොහොරවල පෝෂණ සංයුතිය විශ්ලේෂණාත්මකව සොයාබැලීම වඩාත් සුදුසු බව සැමවිටම පිළිගැනෙයි.

පර්යේෂණ, ක්‍රමෝපායයික සැලසුම් සහ සංවර්ධනය යන ක්ෂේත්‍රයන් තුළ අප මෑත කාලයේ දැරූ ප්‍රයත්නයන්වලින් සොබාදහමට කිසිදු අහිතකර බලපෑමක් ඇති නොවන පරිදි දේශීය කෘෂිකර්මාන්තය තුළ පෙරළියක් කිරීම සඳහා අපට සහාය වන කාබනික පොහොර නිෂ්පාදනය හා ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ඉහළම ප්‍රමිතීන් සපුරාලීම උදෙසා යෝජිත අපගේ නව ව්‍යාපෘතීන් සමඟ ඉදිරියට යෑමට අවශ්‍ය දිරිය සපයන අපේක්ෂිත ප්‍රතිඵල දැන් ලැබෙමින් පවතී. අපගේ දේශීය ගොවීන්ගේ සහ වගාකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වැදගත් වන්නේ යැයි පර්යේෂණ මඟින් අනාවරණය කරගත් තොරතුරු මත පදනම්ව මෙකී ව්‍යාපෘතීන් සැලසුම් කර ඇත්තේ කාබනික පොහොර භාවිතයෙන් ඔවුන්ට වඩාත් වැඩි ප්‍රතිලාභ හිමිකර ගත හැකි වන පරිදිය. මා විශ්වාස කරන ආකාරයට, අපගේ මෑත කාලීන සංවර්ධන ව්‍යාපෘතීන් ඔස්සේ නුදුරු අනාගතයේදීම ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ඉදිරි පියවර වෙත රැගෙන යමින් වැඩි ඵලදාවන් ලබාගැනීම සඳහා වන අපගේ ඉලක්ක වෙත ළඟාවීමට හැකි වනු ඇති අතර, කෘෂි අතිරික්තයන් අපනයනය කිරීමටද හැකි වනු ඇත. මේ ඉලක්කය සපුරාගැනීමේ අරමුණ ඇතිව සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලද අපගේ නව ව්‍යාපෘතීන් කාබනික සංකල්පය මත පදනම්ව ඇති අතර, එමඟින් දේශීය කෘෂිකර්මාන්තයේ නව මංපෙත් විවර වනු ඇත.

මෙතෙක් දුර පැමිණි ගමන් මඟ සාර්ථක බවද, අනාගතය සුබවාදී බවද පෙනෙන්නට තිබේ. බොහෝ බාධක, අභියෝග සහ දුෂ්කරතා මධ්‍යයේ වුවද තව තවත් ජයග්‍රහණ අත්පත් කරගැනීම සඳහා අපගේ කණ්ඩායමේ දැඩි අධිෂ්ඨානශීලීත්වය සහ චිත්ත ශක්තිය අපට වැදගත් වනු ඇත. තවදුරටත් හඳුනාගත යුතුව ඇති විවිධ ආකාරවලින් විශිෂ්ටත්වය අත්පත් කරගැනීමේ හැකියාව අප සතුව ඇති බව හොඳින්ම දන්නා බැවින් අප ගැන අපට විශ්වාසයක් ඇත. කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ නව යුගයක් නිර්මාණය කරන කණ්ඩායමක් බවට පත්වීම සඳහා අවශ්‍ය හැකියාව, කැපවීම සහ විශේෂඥතාව අප සතුව ඇති බව අපි දනිමු. උදා වන හෙට දවසේදී අපගේ සුවිසල් සිහින සැබෑකර ගැනීම සඳහා අපි එක්ව අත්වැල් බැඳගෙන ඉදිරියටම යමු.

**පී.ආර්. සමරවීර**
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)




# රබර් වගාව සඳහා

ආර්.ඒ - 465, ආර්.යූ - 462, ආර්.යූ - 465, ආර්/ වයි.බී,
ආර්/එස්.ඒ ඇතුළු විශේෂ මිශ්‍රිත පොහොර

# අධ්‍යක්ෂ මණ්ඩලය



අනෝජා හේරත් මහත්මිය
අධ්‍යක්ෂ

මාධව වත්තේගම මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

හේමක ලසිත් බාලසූරිය මහතා
අධ්‍යක්ෂ



රෝෂන වඩුගේ මහතා
සභාපති

උපුල් පීරිස් මහතා
අධ්‍යක්ෂ

ජේ.එම්.එස්.ඩී. රත්නායක මහත්මිය
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය





## රෝෂන වඩුගේ මහතා
**සභාපති**

කොළඹ මහානාම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන ඔහු ඕස්ට්‍රේලියාවෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ජපානයේ මෝටර් කාර්මික විද්‍යාව සම්බන්ධ වෘත්තීය පුහුණුවක් ලබා ඇත.

පාසලේ වයස අවුරුදු 15න් පහළ ක්‍රිකට් කණ්ඩායමේ නායකයා වූ ඔහු වයස අවුරුදු 17න් පහළ ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයෙකුද විය. ඔහු සිංහ සමාජයේ සභාපති ලෙසද, පාසල් ගුවන්විදුලි සංගමයේ උප සභාපති ලෙසද තනතුරු දරා ඇත.

වසර 3ක කාලයක් පුරා කෝට්ටේ අගනගරයේ සිංහ සමාජයේ සභාපතිත්වය දරා, වසර 3ක් එහි සාමාජික අධ්‍යක්ෂ ලෙසද කටයුතු කළ ඔහු ජාත්‍යන්තර සිංහ සමාජයේ 306 සී දිස්ත්‍රික්කයේ අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරයි.

සමාජ සේවාවන් සඳහා වන රාජ්‍ය නොවන සංවිධානයක් වන ආර්යා පදනම පිහිටුවා, එහි සභාපතිවරයා ලෙස කටයුතු කරන ඔහු ලංකා එක්සත් ප්‍රවාහකයින්ගේ සංගමයේ සභාපති ලෙස සහ ලංකා වාහන ආනයනකරුවන්ගේ සංගමයේ උප සභාපති ලෙසද තනතුරු දරයි.

ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය විසින් 2006 වසරේදී ඔහුට 'ජීවනසූරි' සම්මානය පිරිනමනු ලැබිණි.

## මාධව වත්තේගම මහතා
**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

කොළඹ නාලන්ද විද්‍යාලයෙන් සිය ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, නිව්කාස්ල් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගත් ඔහු ලන්ඩනයේ ව්‍යාපාර විධායක සංගමයේ I සහ II පරීක්ෂණ සාමාර්ථ සුදුසුකම් ලැබීය. බටහිර ඕස්ට්‍රේලියාවේ පියෝකොම්ප් වෙතින් ඔටෝ කැඩ් සඳහා සහ ඕමානයේ සුල්තාන් රජයේ ඇරැබ් කම්පියුටර් සර්විස් වෙතින් ඔටෝ කැඩ් වින්ඩෝස් සඳහා ලබාගත් සුදුසුකම්ද ඇතුළුව විවිධ ඩිප්ලෝමා සුදුසුකම් රැසක් ඔහු ලබා ඇත.

සිල්වර් බර්ඩ් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගමේ සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ ලෙසද, ඉන්ඩිපෙන්ඩන්ස් ආකිටෙක්චරල් හෝම්ස් (පුද්ගලික) සමාගමේ සහ කලම්බු ග්ලෝබල් ෂිපින් (පුද්ගලික) සමාගමේ සභාපති ලෙසද දැනට කටයුතු කරන ඔහු, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙසද සේවය කර ඇත.



## ශිරන්ති ධම්මිකා රත්නායක මහත්මිය
### අධ්‍යක්ෂ

කැලණිය විශ්වවිද්‍යාලයෙන් සිය විද්‍යා උපාධිය ලබාගත් ඇය වෙනත් විෂය ක්ෂේත්‍රයන්හි වැඩිදුර අධ්‍යාපනය ලබමින් කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳවද, ටෝකියෝ නුවර අයිඩියාස් ස්කූල් වෙතින් සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳවද, ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණය පිළිබඳවද පශ්චාත් උපාධි හිමි කරගෙන ඇත.

ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ සහ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සැලසුම් සංගමයේ සමාජිකාවක් වන ඇය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිති නිලධාරිනියක ලෙසද (1993 - 1994), මූල්‍ය හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරියක ලෙසද (1994 - 2004), එම අමාත්‍යංශයේම සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරියක ලෙසද, ග්‍රාමීය මූල්‍ය අංශයේ සංවර්ධනය සඳහා වන වැඩසටහනෙහි ව්‍යාපෘති නිලධාරිනිය ලෙසද සේවය කර ඇත. එම අමාත්‍යංශයේම අයවැය සැකසීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ලෙස 2011 සිට 2013 දක්වා වූ කාලය තුළ සිය සේවා කටයුතු කිරීමෙන් අනතුරුව, මේ වන විට ඇය ජාතික ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්තුමිය ලෙස සේවය කරයි.

ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලය, ජපානයේ අයිඩියාස් ස්කූල් සහ කොළඹ විශ්වවිද්‍යාලය ඇතුළු දේශීය සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ගණනාවක පර්යේෂණ අධ්‍යයනයන් සඳහා ඇය සම්බන්ධ වී ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## හේමක ලසිත් බාලසූරිය මහතා
**අධ්‍යක්ෂ**

වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය සහ වරලත් අලෙවිකරුවන්ගේ ආයතනයෙන් අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හිමි කරගත්තේය.

කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ආයතනයෙන් සිග්මා හය සංකල්පය පිළිබඳ කළු පටි ලාභියකු වන ඔහු, දුරකථන සන්නිවේදනයේ ඉදිරි මෙහෙයුම් (තනි මෙහෙයුම්), ව්‍යාපාර ක්‍රියාවලීන්, අලෙවි කළමනාකරණය, සමූහ කළමනාකරණය, පාරිභෝගික රඳවාගැනීම, ව්‍යාපාර සැලසුම් සහ පරිපාලනය, දැනුම් කළමනාකරණය සහ පාරිභෝගික අත්දැකීම් කළමනාකරණය ඇතුළු විවිධ සේවා ක්ෂේත්‍ර ආවරණය කරමින් බොහෝ ක්ෂේත්‍ර ගණනාවක බහුවිධ කාර්යභාරයන් රැසක් ඉටු කරමින් වසර 16කට අධික විශේෂඥතාව ලබා ඇත.



## උපුල් පීරිස් මහතා
**අධ්‍යක්ෂ**

ගල්කිස්ස, සාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද ඔහු, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ මෙන්ම ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන මණ්ඩලයේද හිටපු අධ්‍යක්ෂවරයෙකි.

ඌව පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස සේවය කර ඇති ඔහු, 2015 පෙබරවාරි 4 වැනිදා සිට සීමාසහිත ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරමින් සිටියි.



## අනෝජා හේරත් මහත්මිය
### අධ්‍යක්ෂ

කොළඹ දේවි බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක වන ඇය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යා විශේෂ උපාධියක් (කෘෂිකර්ම) සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධියක් හිමි කරගෙන ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය, පර්යේෂණ සහකාරවරියක ලෙස පරිසර කටයුතු හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයට බැඳී, 2003 වසරේ සැප්තැම්බර් මාසයේදී ආධුනික නිලධාරිනියක ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුණාය.

ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරියක සහ තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරියක ලෙස කටයුතු කළ ඇය දැනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරියක ලෙස සේවය කරයි. ශ්‍රී ලංකාවේ කාලගුණික විපර්යාස භාරගැනීම සහ තුලනය කිරීම සම්බන්ධ තාක්ෂණ අවශ්‍යතාවන් ඇගයීම සඳහා වන ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකාරිකාව ලෙස ඇය කටයුතු කර ඇත. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පාරිසරික හා තිරසාරත්ව සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සමුළු ගණනාවකට සහභාගි වී ඇති ඇය එක්සත් ජාතීන්ගේ කාලගුණ වෙනස්කම් සම්මුතිය සහ නියොන් කෙටුම්පත සකස් කිරීමේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය නියෝජිතවරියක් ලෙස සහභාගි වී ඇත.

ශ්‍රී ලංකාවේ කාබනික තේ පිළිබඳ පර්යේෂණ ගණනාවක් සිදු කර, ඒවා ප්‍රකාශයට පත් කර ඇති විශේෂඥවරියක වන ඇය දැනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ රේඛීය අමාත්‍යාංශය වන කෘෂිකර්ම අමාත්‍යාංශය නියෝජනය කරන සාමාජිකාව ලෙස කටයුතු කරන්නීය.

## එස් ඇන්ඩ් ඒ කන්සල්ටන්ස් (පෞද්ගලික) සමාගම

**සමාගමේ ලේකම්**

894/4, බී,
අතුරුගිරිය පාර,
මාලබේ.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**පී.ආර්. සමරවීර මහතා**
සාමාන්‍යාධිකාරී (වැඩ බලන) සහ කළමනාකරු (මූල්‍ය)



**බී.ඩී.එල්. කුමාරසිරි මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක



**ඉංජිනේරු ඩී.එම්.එන්.ඒ. දිසානායක මහතා**
කළමනාකරු (කාර්මික)



**ආර්.ඒ.පී. පෙරේරා මහතා**
කළමනාකරු (බෙදාහැරීම්)



**ආර්.පී.එස්. බෝධිපාල මිය**
කළමනාකාරිණී (අලෙවි සහ වෙළෙඳ)



**යූ. පෙරේරා මිය**
පරීක්ෂණාගාර ප්‍රධානී



**සී.පී.පී. බුලත්සිංහල මහතා**
වැඩ බලන කළමනාකරු (පරිපාලන සහ මානව සම්පත්)



**පී.පී. සමන් මහතා**
වැඩ බලන කළමනාකරු (ප්‍රසම්පාදන සහ ආනයන)

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම









**පී.ආර්.**
**සමරවීර මහතා**

සාමාන්‍යාධිකාරී (වැඩ බලන) සහ කළමනාකරු (මූල්‍ය)

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජ (විශේෂ) උපාධියක් හිමි කරගෙන ඇත. ශ්‍රී ලංකාවේ පොදු මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේත්, වරලත් ව්‍යාපාර පරිපාලන ආයතනයේත්, ශ්‍රී ලංකා පොදු මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේත් ඉහළ සාමාජිකත්වය දරන ඔහු ශ්‍රී ලංකාවේ ගණකාධිකාරීවරුන්ගේ වෘත්තීය ආයතනයේ ආශ්‍රය සාමාජිකත්වයද දරයි. වර්ෂ 1987 දී සීමාසහිත ලංකා පොහොර සමාගමට සම්බන්ධ වූ ඔහු දීර්ඝ කාලයක් අප සමඟ රැඳී සිටිමින් සමාගමේ ජ්‍යෙෂ්ඨතම කළමනාකරු බවට පත්ව සිටියි.

**බී.ඩී.එල්.**
**කුමාරසිරි මහතා**

සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණක

කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජ (විශේෂ) උපාධියක් ලබා ඇති ඔහු ශ්‍රී ලංකාවේ මහජන මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේත්, වරලත් ව්‍යාපාර පරිපාලන ආයතනයේත්, ශ්‍රී ලංකා පොදු මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකාවේ පොදු මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ විශේෂ සාමාජිකත්වය දරයි. ඔහු පොදු ගිණුම් සහ මූල්‍ය ආයතනයෙන් මෙන්ම අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයෙන්ද අභ්‍යන්තර විගණනය සඳහා සහතික ලබා ඇත. ජාතික උපකරණ යන්ත්‍රසූත්‍ර පිළිබඳ සංවිධානයේ ගණකාධිකාරීවරයා සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ලෙස ඔහු සේවය කර ඇත.

**ඉංජිනේරු ඩී.එම්.එන්.ඒ.**
**දිසානායක මහතා**

කළමනාකරු (කාර්මික)

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ BSc උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයකු වන ඔහු ඒ ආයතනයේම ඉංජිනේරු අංශ කමිටුවේ සාමාජිකයකුද වෙයි.

**ආර්.ඒ.පී.**
**පෙරේරා මහතා**

කළමනාකරු (බෙදාහැරීම්)

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සමාජවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇත. එයට අමතරව ඔහු කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවන්ද හිමි කරගෙන ඇත. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ඵලදායීතාව පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව සම්පූර්ණ කර ඇති ඔහු මානව සම්පත් කළමනාකරණය, කාර්මික සෞඛ්‍යය සහ ආරක්ෂාව, ගිනි ආරක්ෂාව සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ නඩත්තු ක්ෂේත්‍ර පිළිබඳව විශේෂඥ වෘත්තීය මට්ටමක් දරයි.









### ආර්.පී.එස්. බෝධිපාල මිය

කළමනාකාරිණී
(අලෙවි සහ වෙළෙඳ)

ඇය සබරගමුව විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය (වැවිළි කළමනාකරණය) පිළිබඳ විද්‍යා විශේෂ උපාධියක් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. වැවිළි කර්මාන්ත කළමනාකරණය පිළිබඳ ඉහළ පළපුරුද්දක් ඇයට ඇත.

### යූ. පෙරේරා මිය

කළමනාකාරිණී
(රසායනාගාරය)

ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යා (ජීවවිද්‍යා) උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් (MSc) ලබා ඇත. වර්ෂ 1996 දී සීමාසහිත ලංකා පොහොර සමාගමට සම්බන්ධ වූ ඇය පොහොර විශ්ලේෂණය සම්බන්ධ ඉහළ අත්දැකීම් සහිතව දීර්ඝ කාලයක් සේවය කර ඇත.

### සී.පී.පී. බුලත්සිංහල මහතා

වැඩ බලන කළමනාකරු
(පරිපාලන සහ මානව සම්පත්)

ඔහුට මෙම සමාගමේ වසර 36ක සේවා පළපුරුද්දක් ඇත. ඔහු දිවයින පුරා බල පැවැත්වෙන පරිදි සාමදාන විනිශ්චයකරුවකුද වේ.

### ජී.ජී. සමන් මහතා

වැඩ බලන කළමනාකරු
(ප්‍රසම්පාදන සහ ආනයන)

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් කලා උපාධියක් ලබා ඇත. දැනට ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රසම්පාදන සහ ගිවිසුම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරයි.



සෘජු පොහොර මෙට්‍රික් ටොන් 145,103.4ක ප්‍රමාණයක් සහ මිශ්‍ර පොහොර මෙට්‍රික් ටොන් 32,846.8 ක ප්‍රමාණයක් අලෙවි වූ අතර, ඒ අනුව සමස්ත අලෙවි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 177,950.2 ක් විය. ප්‍රධාන වශයෙන් වී වගාව සඳහා භාවිත කෙරෙන සෘජු පොහොර මඟින් මේ අලෙවි ප්‍රමාණයෙන් 90%ක් සඳහා දායකත්වය සැපයිණි. එයින් 80% කට වැඩි ප්‍රමාණයක් වී වගාව සඳහා සෘජු පොහොර ලෙස නිකුත් කරන ලද යූරියා, ටී.එස්.පී සහ එම්.ඕ.පී පොහොර විය. සෙසු අලෙවි ප්‍රමාණයන් පොල්, තේ, රබර්, එළවළු, පලතුරු සහ මල්, අපනයන භෝග, වෙනත් භෝග සහ කාබනික පොහොර සඳහා වූ විශේෂිත නිෂ්පාදනවලින් සමන්විත විය.

# කළමනාකාරීත්ව

# විමසුම සහ විශ්ලේෂණය

## ආයතනික විමසුම

### අංශ පිළිබඳ විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද පැවැති දුෂ්කර තත්ත්ව යටතේ පවා වර්ෂ 2015 පැවැති සියයට 4.8 ට සාපේක්ෂව 2016 වසරේදී සියයට 4.4කින් සැබෑ ලෙසම වර්ධනය විය. දේශීය වශයෙන් මහා පරිමාණ රාජ්‍ය යටිතලපහසුකම් ව්‍යාපෘති කිහිපයක් නැවත ඇරඹීම සහ පුද්ගලික අංශයේ ආයෝජන ක්‍රියාකාරකම් ආර්ථික වර්ධනයට උපකාරී විය. කෙසේවුවද, ආදායම් ඉහළ නැංවීම හා විශේෂයෙන් සම්බන්ධිත මූල්‍ය සැකසුම් ක්‍රමවේදයන් අඛණ්ඩව පවත්වාගැනීම, සැපයුම් අංශ අවහිරතා සහ බදු ප්‍රතිපත්ති නිර්ණායකයන් ඔස්සේ 2016 වසර අවසාන භාගය වන විට උද්ධමන පීඩනය ඉහළ යෑම, මහබැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි වීම සහ වසර පුරා පැවැති අයහපත් කාලගුණ තත්ත්වයන් මඟින් වර්ධන වේගය අඩාල කරනු ලැබිණි.

නිෂ්පාදන අංශ ඇස්තමේන්තු අනුව, වර්ධනය ප්‍රධාන වශයෙන්ම සිදු වූයේ 2016 වසර පුරා පැවති අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා වූ අර්බුදකාරී තත්ත්වය මධ්‍යයේ කර්මාන්තය පුළුල් වීම සහ සේවා සම්බන්ධ ක්‍රියාකාරකම් පුළුල් වීම මඟිනි. ඉතා අයහපත් බලපෑම් ඇති කළ කාලගුණික තත්ත්ව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන සඳහා රුසියාව සහ ඇතැම් මැදපෙරදිග රටවලින් ලැබුණු ඉල්ලුම පහළ වැටීම සහ අඩු මිල ගණන් යන කරුණු නිසාද කෘෂිකාර්මික කටයුතුවල සීමාකාරී තත්ත්වයන් ඇති විය.

දරුණු කාලගුණ තත්ත්වයන් හේතු කොටගෙන, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ 4.2%ක සෘණ වර්ධනයක් ඇති වූ අතර, ඒ සමගම එහි දළ දේශීය නිෂ්පාදන

කොටස 2015 වසරේ පැවති 7.8% අගය 2016 වසරේදී 7.1% දක්වා පහත වැටීම මෙන්ම වී, තේ සහ රබර් නිෂ්පාදනය පිළිවෙළින් 8.3%, 11.0 සහ 10.7 දක්වා අඩුවීමත් සිදු විය. වසර පුරාම පැවති අයහපත් කාලගුණ තත්ත්වයන් සහ විශේෂයෙන්ම දෙවැනි කාර්තුවේදී අධික වර්ෂාපතනයන් හේතු කොටගෙන ඇති වූ ගංවතුර මෙන්ම දීර්ඝ කාලයක් පැවති නියඟයද කෘෂිකර්මාන්තයේ ක්‍රියාකාරිත්වය සඳහා අහිතකර ලෙස බලපෑවේය.

රජය විසින් ස්වයං පොහොර සහනාධාරයක් ලබා නොදුන් ප්‍රථම වසර ලෙස 2016 සටහන් විය. ඒ වෙනුවට පොහොර සහනාධාරය 2016 දෙසැම්බර් මාසයේදී රු. බිලියන 37.5ක සමස්ත වටිනාකමකට රු. 25,000ක දීමනාවක් බවට පත් කරනු ලැබිණි. එළවළු, මුංඇට, කව්පි, සෝයා බෝංචි, බොම්බයි ළූනු සහ තවත් ඇතැම් භෝග වගා කරන ගොවීන්ට පොහොර සහනාධාරය ලෙස වාර්ෂිකව හෙක්ටෙයාරයකට රු. 10,000ක් ලබාදීමටද රජය තීරණය කළේය.

| වර්ෂය | සෘජු පොහොර (මෙට්‍රික් ටොන්) | මිශ්‍ර පොහොර (මෙට්‍රික් ටොන්) | එකතුව |
|---|---|---|---|
| 2015/2016 | 98,804.912 | 27,840.517 | 126,645.429 |
| 2016/2017 | 46,298.535 | 5,006.250 | 51,304.785 |

දීර්ඝකාලීන පදනමක් මත රසායනික පොහොර භාවිත කිරීමෙන් ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට එළඹෙන වසරේ සිට 'සංස්ථා කොම්පෝස්ට්' යන නම සහිතව කාබනික පොහොර නිෂ්පාදනය හඳුන්වාදීමට අවශ්‍ය සියලු කටයුතු සැලසුම් කිරීමට සමාගම කටයුතු කරගෙන යයි.

## ආයතනික විශ්ලේෂණ

ශ්‍රී ලාංකේය ගොවියාට අවශ්‍යම මොහොතේදී සහායට එන සුමිතුරා ලෙස කටයුතු කරමින්, පොහොර ආනයනය කොට, මිශ්‍ර සහ අමිශ්‍ර ස්වරූපවලින් එය බෙදාහරින සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූලික අභිමතාර්ථය වන්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට කැප වූ රාජ්‍ය ආයතනයක් ලෙස කටයුතු කිරීමය.

දිවයින පුරා ගොවීන්ට අවශ්‍ය ඕනෑම විටෙක කලට වේලාවට අනර්ඝතම පොහොර ලබාදීමට පූර්ණ වශයෙන් කැපවී සිටින අප සමාගම, ආනයනය කරනු ලබන සියලු පොහොර වර්ග කර්මාන්ත පර්යේෂණ ආයතන මඟින් තත්ත්ව පරීක්ෂාවට ලක් කරමින් ඒවායේ ඉහළම ප්‍රමිතිය සහතික කරයි. අපගේ ගබඩාවලින් බලයලත් නියෝජිතයින් වෙත බෙදාහරිනු ලබන සෑම පොහොර වර්ගයකම සාම්පල්, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතන සහතිකය ලබා දී ඇති ISO/IEC/17025: 2005 සහතික ලත් අපගේම පරීක්ෂණාගාරයේදී පරීක්ෂාවට ලක් කෙරෙයි.

වත්තල, හුණුපිටියේ පිහිටි අප සමාගමේ මධ්‍යම ගබඩා සංකීර්ණය මෙට්‍රික් ටොන් 67,000ක ධාරිතාවකින් සමන්විත වන අතර, පොළොන්නරුවේ පිහිටි ප්‍රධාන ප්‍රාදේශීය ගබඩා සංකීර්ණය මෙට්‍රික් ටොන් 18,500ක ධාරිතාවකින් සමන්විතය. එයට අමතරව, දිවයින පුරා පිහිටි ගබඩා 40කින් සමන්විත ගබඩා ජාලයේ සමස්ත ධාරිතාව මෙට්‍රික් ටොන් 15,000කි.

මිශ්‍ර පොහොර නිෂ්පාදනය එක් එක් වගාවන්ට ගැලපෙන පරිදි රජය විසින් නිර්දේශ කරන ලද අනුපාතයන්ට අනුකූලව හුණුපිටිය මධ්‍යම ගබඩා සංකීර්ණයේදී සිදු කෙරෙයි. වී වගාවන් සඳහා සෘජු පොහොර සැපයුමට පමණක් සීමා නොවෙමින් තේ, පොල්, රබර්, එළවළු, පලතුරු සහ වෙනත් භෝග සඳහාද විශේෂ මිශ්‍ර කළ පොහොර සපයන අපි, යථා කාලයේදී ගොවීන්ට 'සංස්ථා කොම්පෝස්ට්' යන නම යටතේ කාබනික පොහොර හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු මේ වන විට සකසමින් සිටින්නෙමු.

විමසුමට ලක් කෙරෙන වසර තුළදී සෘජු පොහොර මෙට්‍රික් ටොන් 145,103.4 ක ප්‍රමාණයක් සහ මිශ්‍ර පොහොර මෙට්‍රික් ටොන් 32,846.8 ක ප්‍රමාණයක් අලෙවි වූ අතර, ඒ අනුව සමස්ත අලෙවි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 177,950.2 ක් විය. ප්‍රධාන වශයෙන් වී වගාව සඳහා භාවිත කෙරෙන සෘජු පොහොර මඟින් මේ අලෙවි ප්‍රමාණයෙන් 90% ක් සඳහා දායකත්වය සැපයිණි. එයින් 80% කට වැඩි ප්‍රමාණයක් වී වගාව සඳහා සෘජු පොහොර ලෙස නිකුත් කරන ලද යූරියා, ටී.එස්.පී සහ එම්.ඕ.පී පොහොර විය. සෙසු අලෙවි ප්‍රමාණයන් පොල්, තේ, රබර්, එළවළු, පලතුරු සහ මල්, අපනයන භෝග, වෙනත් භෝග සහ කාබනික පොහොර සඳහා වූ විශේෂිත නිෂ්පාදනවලින් සමන්විත විය.

'ලක්පොහොර' යන වෙළෙඳ නාමය මෙරට පුළුල් ගොවි ප්‍රජාවක් අතර ප්‍රචලිත කරමින් දිවයින පුරා ව්‍යාප්ත අපගේ නියෝජිත ජාලය සහ ආර්පිකෝ, කාගිල්ස් සහ කීල්ස් ඇතුළු සුපිරි වෙළෙඳසල් ඔස්සේ අපගේ නව නිෂ්පාදන අලෙවි කෙරෙයි.

කාබනික පොහොර වෙළෙඳපොළ පිළිබඳව 2015 දී තැබූ බලාපොරොත්තු 2016 වසර තුළදී පුළුල් නව වැඩසටහන් පෙළක් බවට පත් කරමින් සමාගම විසින් සිය ප්‍රථම කාබනික පොහොර පෙළ හඳුන්වාදෙනු ලැබිණි. මිල සාධකය සම්බන්ධයෙන් යම් යම් සංශෝධන කළ යුතුව තිබියදී, මෙට්‍රික් ටොන් 295ක සමස්ත කාබනික පොහොර ප්‍රමාණයක් පසුගිය වසරේදී අලෙවි විය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබුවේ ශ්‍රී ලංකාව තුළ නියෝජනත්වයක් සහිත කොරියානු සමාගමක් වන හියොසුන්ග් ඕ.එන්.බී. (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ ඒකාබද්ධවය.

හඳුන්වාදෙන ලද කාබනික පොහොර මාදිලි රැස අතරට තේ, වී, එළවළු සහ සුළු අපනයන භෝග වගාකරුවන් සඳහා වූ කි.ග්‍රෑම් 2 සහ කි.ග්‍රෑ 20 මළුවලින් යුතු ඝන කාබනික කැට පොහොර, කි.ග්‍රෑම් 2 සහ කි.ග්‍රෑම් 20 කොම්පෝස්ට් ඇතුළත් විය.




**ශ්‍රී ලංකාව තුළ නියෝජනයක් සහිත කොරියානු සමාගමක් වන හියොසුන්ග් ONB (ප්‍රයිවට්) ලිමිටඩ් සමග සහයෝගීතාවයෙන් යුතුව මෙම වැඩසටහන පැවැත්විණි.**





**ලක්පොහොර සේවාදායකයින්ගේ අලෙවි ජයග්‍රහණ කොරියානු සමාගම විසින් ඇගයීමට ලක් කෙරෙයි.**

කාබනික පොහොර අලෙවිය සඳහා වූ ඉලක්කය මෙට්‍රික් ටොන් 2500 ක් විය.

බෙදාහරින්නන්ගේ සහ ගොවීන්ගේ මනසේ ප්‍රමුඛතා අවධානයක් නිර්මාණය වන පරිදි කාබනික පොහොර පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ මාකඳුර කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව මූල්‍ය වසර පුරාම දැනුවත්කිරීම් වැඩසටහන් පවත්වනු ලැබිණි. දැන්වත්කිරීම් වැඩසටහන ප්‍රථමයෙන්ම අලෙවි කාර්යමණ්ඩලය දැනුවත් කිරීම සඳහා පවත්වන ලද අතර, එමඟින් ප්‍රාදේශීය කළමනාකරුවන් සහ විධායකයින් 50 දෙනෙක් පුහුණු කරනු ලැබිණි. එයින් අනතුරුව, පොළොන්නරුව, අනුරාධපුරය, අම්පාර සහ මාතලේ යන ප්‍රදේශවල දැනුවත්කිරීම් වැඩසටහන් පවත්වනු ලැබිණි. එමඟින් සමස්ත වශයෙන් කෘෂිකර්ම උපදේශකයින් 150 දෙනෙක් සහ ගොවීන් 250 දෙනෙක් පුහුණු කෙරිණි.

එයට අමතරව, කාබනික පොහොර අංශය සහ හරිත පොහොර වෙනුවෙන් එමඟින් ලබාදෙන කැපවීම විදහාපෑම සඳහා ඉහළ ඵලදායීතාවයෙන් යුතු කාබනික කෘෂිකර්ම ඉසව්වක් හුණුපිටියේ පිහිටි ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ නිර්මාණය කරනු ලැබිණි.

## මූල්‍ය විමසුම

බලපෑමක් ඇති කිරීමේ හැකියාව සහිත කාලගුණ තත්ත්වයන් ඇතුළු බාහිර සාධක මෙන්ම ජාතික ප්‍රතිපත්ති හා අනුකූල වන පරිදි සිදු කරන ලද කාර්යභාර වෙනස්කම් හේතු කොටගෙන සමාගමෙහි වසරකට සාපේක්ෂව වසරක ආදායම ශ්‍රී.ලං.රු. මිලියන 4,243 සිට ශ්‍රී.ලං.රු. මිලියන 2,350 දක්වා කැපීපෙනෙන ප්‍රමාණයකින් පහත වැටුණු අතර, එය 45%ක පහළ වැටීමක් විය.




## දළ ලාභය

විමසුමට ලක් කරන ලද වසර තුළදී සමාගම විසින් රු. මිලියන 231ක දළ ලාභයක් වාර්තා කර තිබූ අතර, 79%ක පහළ වැටීමක් වූ එය ඉහත දක්වන ලද හේතු අනුව කලින් වර්ෂයට සාපේක්ෂව 28.27% ක ඉහළ යෑමක් විය.




## පරිපාලන වියදම්

නව ප්‍රවණතාව ඉදිරියට ගෙන යමින්, සමාගම විසින් වසරකට සාපේක්ෂව වසරක පරිපාලන වියදම් ශ්‍රී.ලං.රු. මිලියන 540 සිට ශ්‍රී.ලං.රු. මිලියන 445 දක්වා වූ 18% ක තවදුරටත් පහත දැමීමක් සිදු කරනු ලැබිණි.




## බෙදාහැරීම් වියදම්

කාලගුණික තත්ත්වයන් හේතු කොටගෙන ඇති වූ දුෂ්කරතාවන් නිසා සමාගමේ බෙදාහැරීම් වියදම් වසරකට සාපේක්ෂව වසරකදී 66.67%කින් ඉහළ නැංවිණි.




## මූල්‍ය ආදායම සහ වියදම්

මූල්‍ය වසර තුළදී සමාගමේ මූල්‍ය ආදායම රු. මිලියන 333.5 දක්වා ඉහළ ගොස් ඇත. අභ්‍යන්තර කාර්යක්ෂමතාවන් ක්‍රමවත් කිරීම හේතුවෙන් මූල්‍ය වියදම් වසරකට සාපේක්ෂව වසරකදී ශ්‍රී.ලං.රු. 126,125 දක්වා 93%කින් විශාල වශයෙන් පහළ ගොස් ඇත.



## බදු අයකිරීමට පෙර ලාභය

2012 වසරේ සිට මේ දක්වා වාර්තා වූ සමාගමේ අඩුම බදු පෙර ලාභය රු. මිලියන 127ක් ලෙස සටහන් වූ අතර, එය 85%ක පහළ වැටීමකි. මෙම පහළ වැටීම සිදු වූයේ සමාගම විසින් මෙතෙක් ලද ඉහළම ලාභය වසරකට සාපේක්ෂව වසරක ප්‍රතිශත පහළ වැටීම වෙනුවෙන් ලබාදීම සිදු වූ කෘෂිකර්ම එලදාව සම්බන්ධයෙන් සරු වසරකින් පසුවය.




## බදු

මූල්‍ය වසර සඳහා ආදායම් බදු වියදම රු. මිලියන 11ක් වූ අතර, එය 2016/2017 වසරේදී රු. මිලියන 223 ක් විය. වෙනස් වූ බදු වියදම වන රු. මිලියන 69 ආදායම් බදු වියදමට ඇතුළත්ව ඇත.

## කොටසකට ඉපැයුම් (EPS)

සමාගම විසින් ශ්‍රී.ලං.රු. 139ක වටිනාකමක් වාර්තා කරනු ලැබීමත් සමඟ කොටසක් සඳහා ඉපැයුම් 2013න් පසු එහි අඩුම අගය දක්වා පහත වැටිණි. මෙය වසරකට සාපේක්ෂව වසරකදී 77%ක පහත වැටීමකි.




## කොටසකට ලාභාංශ (DPS)

මූල්‍ය වසරේදී කොටසක් සඳහා ලාභාංශය ශ්‍රී.ලං.රු. 139ක් වූ අතර, එය 77%ක පහත වැටීමකි.




## වත්කම් මත ප්‍රතිලාභ (ROA)

විමසුමට ලක් කෙරෙන වසර තුළදී සමස්ත වත්කම් මත 0.39% ක ප්‍රති-ලාභයක් ජනනය කිරීමට සමාගමට හැකි විය. මෙය වසරකට සාපේක්ෂව වසරකදී 76% ක පහත වැටීමක් විය.




## හිමිකම් මත ප්‍රතිලාභ (ROE)

සමාගම විසින් 2.54% ක සම කොටස් මත ආපසු ලැබීම් ප්‍රමාණයක් ජනනය කරන ලද අතර, එය වසරකට සාපේක්ෂව වසරකදී 80% ක පහත වැටීමක් විය.



## වත්කම් පදනම

ජංගම නොවන වත්කම් 8% ක් සහ ජංගම වත්කම් 95% ක් සහිතව සමාගමේ සමස්ත වත්කම් වටිනාකම 2016 මූල්‍ය වසර අවසානයේදී රු. බිලියන 35.6 ක් විය.

ප්‍රධාන වශයෙන්ම දේපළ, වගකීම් සහ උපකරණ යනාදියෙන් සමන්විත වූ, ප්‍රක්ෂේපිත වසර සඳහා සමාගමේ ජංගම නොවන සමස්ත වත්කම රු. බිලියන 2.7ක් විය.

පසුගිය වසරට සාපේක්ෂව සමස්ත වත්කම් ප්‍රමාණය 2.72% කින් පහත වැටී තිබිණි.

**ASSET BASE**




## මුදල් ප්‍රවාහය සහ ද්‍රවශීලතාවය

සමාගමේ ප්‍රධාන මුදල් ප්‍රභවයන් වන්නේ මෙහෙයුම් සහ ආයෝජන මඟින් ජනනය කරනු ලබන මුදල්ය. ප්‍රක්ෂේපිත මුදල් වර්ෂයේදී මෙහෙයුම්වලින් ලද මුදල් ප්‍රවාහය රු. මිලියන 214ක් සහ ආයෝජනවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු. මිලියන 591 ක් විය. විමසුමට ලක් කළ වසර තුළදී සමාගමේ මූල්‍ය ක්‍රියාකාරිත්වයන් මඟින් ලද මුදල් ප්‍රවාහය රු. මිලියන 834ක් විය.

## සේවා ණය හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා

ප්‍රාග්ධන වියදම් සහ ලාභාංශ පියවීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වාගැනීමට සමාගමට හැකි විය.

## කොටස් හිමියන්ගේ අරමුදල්

කොටස් 100%ක හිමිකාරිත්වය රජයේ භාණ්ඩාගාරය සතුව පැවතිණි. නිකුත් කළ කොටස් ප්‍රමාණය 50,245,608 කි.

# මානව සම්පත් කළමනාකරණය



## යහ ක්‍රියාපිළිවෙත් සහ සේවක ප්‍රතිපත්ති

සාප්පු හා කාර්යාල පනත, පඩිපාලක සභා ආඥා පනත, භාණ්ඩාගාර හා රේඛීය අමාත්‍යංශය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශන සංග්‍රහය සහ දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින අදාළ සියලු කම්කරු නීතීන් යනාදියට අනුකූල වන පරිදි අපගේ මානව සම්පත් කළමනාකරණ ක්‍රමෝපායයන් මනාව සකසනු ලැබ ඇත. රජයේ පරිපාලන නියාමනයන්ගේ සහ විද්‍යුත් ඊ කේතකරණයේ ඉහළම ප්‍රමිතීන්වලට අනුගත වෙමින්, සිය මානව සම්පත් කළමනාකරණය ප්‍රශස්ත මට්ටමක පවත්වාගැනීමට වෙහෙසෙන අතරම, ආයතනික ව්‍යුහය නිර්මාණය කිරීමේදී නිසි අවධානය සහ විනිවිදභාවය පවත්වාගනිමින්, එහි අඩුපාඩු හඳුනාගනිමින් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන උපදෙස් පරිදි ඒවා සම්පූර්ණ කිරීම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කරනු ලබන ප්‍රමිතීන් සහ උපදෙස් අනුව උසස්වීම් පිරිනැමීම සහ වැටුප් සැකසීම යනාදියද සමාගම විසින් සිදු කරනු ලබයි.

## සේවක ප්‍රතිලාභ සැලසුම

රජයේ නියමයන්ට අනුකූල වන පරිදි, සමාගම විසින් දළ වැටුපෙන් 15% ක් (මූලික වැටුප + ජීවන වියදම) සේවක අර්ථසාධක අරමුදලටද, 3% ක් සේවක නියුක්තියන්ගේ භාර අරමුදලටද දායක කරනු ලබයි.

## ප්‍රතිලාභ සැලසුම හඳුන්වාදීම

ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සුදුසුකම් ලත් තක්සේරුකරුවකු විසින් සෑම වසරකම මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලබන අතර, සෑම සේවකයෙකුගේම ප්‍රථම සේවා වසරේ සිට විශ්‍රාම ප්‍රතිලාභ හිමිකම් වගකීම සඳහා අදාළ ප්‍රතිපාදනද වෙන්කරනු ඇත.

## සේවක දිරිගැන්වීම

එකමුතුකමෙන් යුතු සේවා පරිසරයක් නිර්මාණය කිරීම, පහසුකම් වැඩිදියුණු කිරීම, ආතතිය පහළ දැමීම, සමාගමේ එදිනෙදා ව්‍යාපාර කටයුතු මෙන්ම ක්ෂයවීම් විශාල වශයෙන් අවම කිරීමෙන් කෙටි සහ දීර්ඝ කාලීන වශයෙන් ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධ පුළුල් හැඟීමක් සේවකයින්ට ලබාදීම මඟින් කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව උපරිම මට්ටමකට ඉහළ නැංවීම සඳහා කාර්යමණ්ඩලය දිරිගැන්වීමට සමාගම අවධානයක් යොමු කරයි.

## මූල්‍ය ප්‍රතිලාභ

- ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා වන ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පැවැත්වෙන වාර්ෂික දිරිගැන්වීම් වැඩසටහනක් මඟින් සෑම සේවකයෙකුගේම තනි පුද්ගල ක්‍රියාකාරිත්වය හඳුනාගනු ලැබෙයි.

- ලාභදායිතා මට්ටම පදනම් කරගනිමින් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛයට අනුව වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීම

- මූල්‍ය පීඩනය අවම කිරීම සඳහා සුදුසුකම් සහිත කාර්යමණ්ඩල සාමාජිකයින්ට තේ, පවිත්‍රතා සහ ඇඳුම් සඳහා දීමනා ගෙවනු ලැබේ.

- වසරේ වැඩි දින ගණනක් සේවා ස්ථානයේ ගත කිරීමට සියලු සේවකයින් යොමු කෙරෙන දිරිගැන්වීමක් ලෙස ඉතිරි වෛද්‍ය නිවාඩු දින සඳහා මුදල් ගෙවනු ලැබේ.

- සමාගම වෙනුවෙන් ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා සුදුසුකම් ලත් කාර්යමණ්ඩල සාමාජිකයින්ට ජංගම දුරකථන සැපයෙන අතර, ජංගම සහ ගෘහස්ථ දුරකථන බිල්පත් සඳහා ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ.

- වැටුප් ගෙවීමට අමතරව කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් ඇති වගකීම වටහාගනිමින්, දේශීය සහ විදේශීය මට්ටමෙන් අධ්‍යාපනික, සංස්කෘතික හෝ ක්‍රීඩා කටයුතුවලදී විශිෂ්ටතා දක්වන කාර්යමණ්ඩලිකයින්ගේ දූ දරුවන්ට මූල්‍ය තිළිණ ප්‍රදානනය කරනු ලැබේ.

## වෙනත් ප්‍රතිලාභ

- අලෙවි ඉලක්ක සපුරාලන ප්‍රාදේශීය කළමනාකරුවන්ට නිල වාහන සපයනු ලැබේ.

- සේවා කටයුතු ආශ්‍රිත ඵලදායීතාව ඉහළ නැංවීමට දිස්ත්‍රික් අලෙවි විධායකයින් සහ අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් සඳහා යතුරුපැදි ලබාදෙනු ලැබේ.

- සියලුම සේවකයින්ට සහනදායී ගාස්තු යටතේ අපගේ නිවාඩු නිකේතන වෙන්කරගත හැකිය.

- සියලුම සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණය වන පරිදි වෛද්‍ය රක්ෂණ සැලසුමක් ක්‍රියාත්මක කර ඇත.

- ඉහළම අලෙවියක් වාර්තා කරනු ලබන ක්ෂේත්‍ර නිළධාරීන් දිරිගැන්වීම සඳහා දේශීය සහ විදේශීය සංචාර පිරිනමනු ලැබේ.

**STAFF COMPOSITION**




**EMPLOYEE'S PROVINCIAL BREAKDOWN**




- පහළ සිට ඉහළට නිදහසේ සහ සුහදශීලී ලෙස තොරතුරු ගලායෑම සඳහා ඉඩ සැලසෙන විවෘත සන්නිවේදන ප්‍රතිපත්ති සහිත, මනා වැඩ පරිසරයක් ඇති වන ආකාරයේ ආයතනික සංස්කෘතියක් ස්ථාපිත කෙරෙයි.

- අපගේ සේවකයින්ට ආධ්‍යාත්මික සහ කුසලතා ආශ්‍රිත පුහුණු වැඩසටහන් නිතිපතා පිරිනැමෙන අතර, එමඟින් සමස්ත වශයෙන් මානසික සෞඛ්‍යය සහ රැකියා කුසලතා වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරෙයි.

## සුබසාධනය සහ මානව සම්පත්

අපගේ සියලුම කාර්යමණ්ඩල සාමාජිකයින් අතර ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම, ස්වයං වර්ධනය, නායකත්ව හැකියාවන් සහ අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීම යනාදිය සඳහා සහාය, අනුග්‍රහය සහ පහසුකම් සපයන යහපත් ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අප හොඳින් වටහාගෙන සිටියි.

එයට අමතර වශයෙන්, අපගේ සමස්ත මානව සම්පත් සංවර්ධන ක්‍රියාදාමයේ කොටසක් ලෙස දිරිගැන්වීම් ඉහළ නැංවීම, අත්දැකීම් ඔස්සේ ඉගෙනීම සඳහා දිරිගැන්වීම සහ උපදේශන ධාරිතාව ඉහළ නැංවීම යනාදිය සිදු කරන අතරම, තාක්ෂණික සහ නායකත්ව

කුසලතා වැඩිදියුණු කිරීමට අපි විවිධ අංශ, තේමා සහ ප්‍රවණතාවන් සම්බන්ධ අභ්‍යන්තර මෙන්ම බාහිර වෘත්තිකයින්ගේ සේවාවන් යොදා ගන්නෙමු.

සමාගමේ නිෂ්පාදන පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබාගැනීම දසත විසිරී සිටින සේවක පිරිස් සඳහා අත්‍යවශ්‍ය වන බැවින්, විශේෂ පුහුණු වැඩසටහන් අළෙවි බලකාය සඳහා කාබනික පොහොර පිළිබඳ ඉතා ඉහළ දැනුමක් ලබාදීම සිදුකරනු ඇත.

## රඳවාගැනීම

කාර්යමණ්ඩල සංවර්ධන කටයුතු, සමානාත්මතාව, සුහදශීලීත්වය සහ වෘත්තීය ප්‍රාගුණ්‍යය වැඩිදියුණු කරගැනීම සඳහා අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට පහසුකම් සහ ප්‍රතිලාභ සැලසෙන පරිදි ඉගෙනීමේ හැකියාව ලැබෙන මනා වැඩ පරිසරයක් නිර්මාණය කිරීම මඟින් මූල්‍ය වසර තුළදී අඩු සේවක පිරිවැයක් සහ අවම සේවක පිරිවැටුමක් පවත්වාගැනීමෙන් ලබාගත් ජයග්‍රාහී තත්ත්වය පිළිබඳව සමාගමට ආඩම්බර විය හැකිය.






# ආයතනික පාලනය

ප්‍රබල ආයතනික හර පද්ධතියක් සහ සම්මත මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලියක් මඟින් පාලනය වන ධූරාවලියක් මඟින් ආයතනකරණය වී තිබේ.

ඉහළම ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගමේ ආයතනික පාලනය පවත්වාගැනීමේ පූර්ණ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. සමාගමේ ආයතනික පාලනයේ යාන්ත්‍රණය මඟින් සියලු පාර්ශ්වයන්ට කිසියම් ඒකාග්‍රතාවක් මත පිරිනැමෙන වටිනාකමක් සහතික කෙරෙයි. ආයතනික පාලනය සිදු වන්නේ පහත දැක්වෙන රෙගුලාසි, නීති සහ පනත් අනුවය.

1. 2007 වසරේ අංක 7 දරන සමාගම් පනත

2. යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සංග්‍රහය

3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය සඳහා වන ප්‍රතිපත්ති ලේඛනය

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති හා අනුකූල වන පරිදි කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස රාජ්‍ය කර්මාන්ත කළමනාකරණය කිරීමය. සම්පත් ආරක්ෂා කිරීම, මනා ගිණුම් තත්ත්වයන් පවත්වාගැනීම, නිවැරදි වාර්තා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සහතික කිරීම සහ කළමනාකරණය සම්බන්ධ සියලු ස්ථාපිත හා වෙනත් අවශ්‍යතා අනුව කටයුතු කිරීම මඟින් මෙය කළ හැකිය.

කර්මාන්තයට ක්‍රමෝපායයික අරමුණු ඇති බවත්, එහි ක්‍රමෝපායයික අරමුණු ඉටු කරගැනීමට සමාගම කටයුතු කරන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබයි. අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය සඳහා ඵලදායී ක්‍රමයක් පවත්වා ගැනීමත්, කළමනාකරණ කටයුතු ඵලදායී අයුරින් සිදු කිරීමත් මෙන්ම සම්පත් සහ වත්කම් ඵලදායී අයුරින් යොදවාගැනීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රමානුකූලව අධීක්ෂණය කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සාමාන්‍යාධිකාරීවරයාගේ සහ

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කාර්යමණ්ඩලයේ ක්‍රියාකාරීත්වයන් ඇගයීමත්, මූල්‍ය කරුණු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සැපයීමත් සහ අවශ්‍ය වූ විටෙක එම ස්වරූපයේ වෙනත් කරුණු ක්‍රමානුකූල පදනමක් මත හෙළිදරව් කිරීමත් සිදු කරනු ලබයි.

විගණන සහ අවදානම් කළමනාකරණ කමිටු පත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. සමාගම විසින් ආයතනික පාලනය සම්බන්ධ සම්මත පාලන මාර්ගෝපදේශ මාලාවක්, චර්යාධර්ම සංග්‍රහයක් සහ ක්‍රමෝපායයන් හඳුන්වා දී ඇත. මෙහෙයුම් කටයුතු සහ හිමිකාරත්වය සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් ඇති නොවන පරිදි රජයේ චක්‍රලේඛයන්ට අනුව මේ සියලු ව්‍යවස්ථාවන් සහ උපදෙස් මාලාවන් අනුගමනය කෙරෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගබලා ගත යුතු වෙයි.

## අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම

රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන විට, එම පත්වීම් කරනු ලබන්නේ සම්මත, තරගකාරී සහ වගකීම් සහගත ආකාරයකටය. පත්වීම් ලිපිය මඟින් අදාළ බලයලත් පුද්ගලයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ බැඳීම්, කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලිව දක්වනු ලබයි.

සමාගමේ ක්‍රමෝපායයික ඉලක්ක සහ ආයතනික අරමුණු, සමාගමේ ආයතනික පාලනය, කළමනාකරණ හා පරිපාලන ක්‍රම සහ ක්‍රියා පිළිවෙත් සම්බන්ධ වගකීම් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරෙනු ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014/15 මූල්‍ය වසර තුළදී රැස්වීම් 12ක් පවත්වා ඇති අතර, කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන මඟින් කාලීන සහ අදාළ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබ ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ දීමනා

රජය විසින් සැලසුම් කරන ලද දීමනා ප්‍රතිපත්ති සහ පරිමාණයන් මත පදනම්ව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ දීමනා ගෙවනු ලැබේ. මේ දීමනා සම්බන්ධ තීරණවලට අධ්‍යක්ෂවරුන් මැදිහත් නොවේ.

## සභාපති

සභාපතිවරයාගේ කාර්යභාරය සමස්ත ආයතනික ව්‍යුහය සඳහා ඉතා වැදගත් වන අතර, ඔහු විසින් ආයතනය නිවැරදි දිශාව වෙත මෙහෙයවනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. ආයතනික පාලනය පවත්වාගැනීම සම්බන්ධ කටයුතු ගැටලුවකින් තොරව සිදු වන බවට වගබලාගැනීම, සෑම අධ්‍යක්ෂවරයෙකුටම එක සමාන ලෙස සැලකීම, නිවැරදි ආකාරයෙන් වගකීම් බෙදාහැරීම, බලය සහ අධිකාරීත්වය තුලනය කිරීම, ඔහුගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑමේ ක්‍රියාවලිය සහතික කිරීම යනාදිය සභාපතිවරයා විසින් සිදු කරනු ඇත. සිය විශේෂඥතාව සහිත අංශවලට ඔහු දායකත්වය සපයනු ඇති අතර, සක්‍රිය කාර්යභාරයක් ඉටු කිරීමට සියලු අධ්‍යක්ෂවරුන් යොමු කරවන අතරම මෙහෙයුම් කටයුතුවලට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වීමෙන් වැළකී සිටිමින් අධීක්ෂණ කාර්යභාරයක් ඉටු කරනු ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් සහ වාර්ෂික මහා සමුළු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම්දීම සහ කාලයෙන් කාලයට අදාළ වගන්ති සහ කොන්දේසි පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කිරීම සම්බන්ධ වගකීම දරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳව දැනුවත්ව සිටීම, අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන්නේදැයි යන්න සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන නිසි කලට පෙර බෙදාහරිනු ලබන්නේදැය යන කරුණු හා සම්බන්ධ ක්‍රියාපිළිවෙත් නිසි පරිදි සිදු වන බවට ලේකම් වගබලා ගත යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලයට සම්බන්ධ වගකීම්, වගන්ති සහ කොන්දේසි මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත උපදෙස් සමඟ සහාය ලබාදීම පිළිබඳ මාර්ගෝපදේශකත්වය ඔහු විසින් සපයනු ඇත.

## සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් සමාගමේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වගකීම දරනු ලබයි. ඵලදායී ලෙස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ දියත් කිරීම සම්බන්ධ වගකීම ඔවුන් සතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සහ තීරණ ගැනීම සඳහා අදාළ තොරතුරු සහ අවශ්‍ය පැහැදිලි කිරීම් ඔවුන්ට සපයනු ලබන්නේ සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසිනි. සමාගමේ ඵලදායී කළමනාකාරීත්වය සඳහා පරිපාලන සහ නියාමන පද්ධති පවත්වාගන්නා අතරම සමාගමේ දැක්ම සහ අරමුණ සපුරාලීමට හැකි වන පරිදි මෙහෙයුම්, සැලසුම් සහ අයවැය සැකසීම ඔවුන් විසින් සිදු කරනු ලබයි.

සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා වන දීමනා තීරණය කෙරෙනුයේ දීමනා ගෙවීම් යෝජනාවලිය අනුවය.

## මූල්‍ය වාර්තා

සමාගමේ වාර්ෂික මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය නිවැරදි සහ සාධාරණ ආකාරයෙන් දක්වමින් වාර්ෂික මූල්‍ය වාර්තා සැකසීම සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සහ 2007 වසරේ අංක 07 දරන සමාගම් පනතට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකසා ඉදිරිපත් කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට සහ සාමාන්‍යාධිකාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සිය වගකීම් ඵලදායී අයුරින් ඉටුකිරීමේ හැකියාව ඇති වන පරිදි වැදගත් තොරතුරු අවශ්‍ය සෑම විටෙකම මූල්‍ය වාර්තා මඟින් ඒවා පූර්ණ වශයෙන් ඉදිරිපත් කළ යුතු වෙයි.

## වාර්ෂික විගණනය

වරලත් ගණකාධිකාරීවරුන්ගේ ලැයිස්තුවකින් විගණකාධිපති / මහා භාණ්ඩාගාරය විසින් නිර්දේශ කරනු ලබන සහ විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බාහිර විගණකවරයකු විසින් සමාගමේ වාර්ෂික විගණනය සිදු කරනු ලබයි. වාර්ෂික විගණන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමසුමට ලක් කරනු ලැබීමෙන් පසුව වාර්ෂික මහා සමුළුවේදී අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙයි. විගණන ක්‍රියාවලියේදී පාක්ෂිකභාවයෙන් තොර සහ ස්වාධීන තීරණ කෙරෙහි බලපෑම් ඇති විය හැකි උපදේශන සහ වෙනත් සේවාවන් සැපයීමෙන් වැළකී සිටින අතර, මෙම බාහිර විගණකවරුන් සෑම වසර 05 කට වරක් බැගින් වෙනස් කෙරෙයි.

## විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව

පරිපාලන කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම මඟින් සමාගමේ විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මහා භාණ්ඩාගාරයේ මූල්‍ය වශයෙන් සුදුසුකම් ලත් නියෝජිතයෙකුද ඇතුළත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයින් තුන්දෙනෙකුගෙන් මෙම කමිටුව සමන්විත වෙයි. එම නියෝජිතයා විගණන කමිටුවේ සභාපති තනතුර දරයි.

# ආයතනයේ **සංවිධාන** ව්‍යුහය




| | |
|---|---|
| **නි.ක.** | - නියෝජ්‍ය කළමනාකරු |
| **නි.ක.(තා)** | - නියෝජ්‍ය කළමනාකරු තාක්‍ෂණ |
| **ස.ක.** | - සහකාර කළමනාකරු |
| **ක.ක.** | - කනිෂ්ඨ කළමනාකරු |
| **ක.ස.** | - කළමනාකරණ සහකාර |
| **ප්‍රා.ශි.** | - ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ සේවක භවතුන් |
| **ප්‍රා.අ.ශි.** | - ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා සේවක භවතුන් |
| **ප්‍රා.ශි.නො.** | - ප්‍රාථමික ශිල්පීය නොවන සේවා සේවක භවතුන් |



# අවදානම් කළමනාකරණය

## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අනාවරණය වූ අවදානමක් හඳුනාගැනීම සහ අවබෝධ කරගැනීම සිදු කරනු ලබන්නේ අවදානම් කළමනාකරණය මඟිනි. පාඩු සිදුවීම වළක්වාගැනීම සහ පාඩුවකින් ඇති වන බලපෑම අවම කරගැනීම සඳහා ආයතනය මඟින් ඵලදායී සැලසුමක් සකසා ක්‍රියාත්මක කිරීමට එමඟින් කටයුතු කෙරෙයි. අවදානම් හඳුනාගැනීම සඳහා පැහැදිලි සහ ව්‍යුහාත්මක මඟක් අවදානම් කළමනාකරණය මඟින් සැපයෙයි. සියලු අවදානම් ගැන පැහැදිලි අවබෝධයක් ලබාගැනීම මඟින් එම අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය ඇගයීම් කරමින් සහ ප්‍රමුඛතාවන් ලබාදෙමින් අදාළ පියවර ගැනීමට ආයතනයකට හැකි වෙයි.

නොසැලකිලිමත්බව හඳුනාගැනීම, ඇගයීම, අවම කිරීම සහ වෙනස් කිරීම සඳහා විසැණින් ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ආයතනය විසින් අනුගමනය කරනු ලැබ ඇත. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රමයේ මූලික අරමුණ වනුයේ අවදානම් පිළිබඳව පූර්ණ අවධානය මත පදනම්ව අපගේ ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතුවලට සහාය ලබාදීමය.

කළ යුතු මූලිකම සහ වැදගත්ම දේ වනුයේ අවදානම් හඳුනාගැනීම සහ ඇගයීමය. හඳුනාගත් අවදානම් වැළැක්වීම, අවම කිරීම සහ වෙනස් කිරීම සඳහා යොදාගත හැකි ක්‍රමෝපායයන් ඉන් පසුව සැලසුම් කෙරෙයි. සමාගමේ මෙහෙයුම් කටයුතු කෙරෙහි අවධානය යොමු කරන ඵලදායී අවදානම් කළමනාකරණ ක්‍රමයක් පවත්වාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය.

## මූලික අවදානම් සාධක

අපගේ සමාගමේ අවදානම් සාධක කිහිපයක් සඳහා නිරාවණය වීම් ඇති අතර, මෙහෙයුම් සැකසුමෙහි අවිනිශ්චිතතාවක් පවතී. සමාගම මුහුණ දෙන එම අවදානම් සාධක සහ ඒවා අවම කිරීම සඳහා ගෙන ඇති පියවර පසුව සාකච්ඡා කෙරෙයි.

## උපායමාර්ගික අවදානම්

අපගේ ක්‍රමෝපායයික අභිමතාර්ථ සහ ප්‍රයෝජනයට නොගත් අවස්ථාවන් තුළ ගැබ්ව ඇති අවිනිශ්චිතතාවන් මඟින් ඇතිවන අවදානම් ක්‍රමෝපායයික අවදානම් ලෙස හැඳින්වේ. මෙවැනි ආකාරයේ අවදානම් පැන නගින්නේ ප්‍රධාන වශයෙන්ම ආයතනයේ ඉලක්කවලට අනුකූලව අධ්‍යක්ෂවරුන් විසින් ගනු ලබන වැදගත් තීරණ මඟිනි. ක්‍රමෝපායයික අවදානම පසුපස ඇති මූලිකම සංකල්පය වනුයේ අපගේ යෝජිත ආයතනික ඉලක්ක සපුරාගැනීමට අසමත්වීමය. මෙය කාරුණික අවධානයට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය

සහ කළමනාකාරීත්ව කණ්ඩායම විසින් අනාගතයට අදාළ වන පරිදි වසර පහක සංයුක්ත සැලසුමක්, වසර තුනක ක්‍රියාකාරී සැලසුමක් සහ වාර්ෂික සැලසුම මත පදනම්ව ක්‍රමානුකූල පසු විමසුම් සිදු කරනු ලබයි.

## ව්‍යාපාර අවදානම්

නිෂ්පාදනය, නිෂ්පාදනයේ අලෙවිය සහ වෙළෙඳාම සම්බන්ධ අවදානම්, නිෂ්පාදන පිරිවැයට බලපාන ආර්ථික අවදානම්, මෙන්ම තාක්ෂණික පරිසරයේ සහ පාරිභෝගික රුචිඅරුචිකම් වෙනස් වීම හේතුකොටගෙන ඇති වන අවදානම් යනාදිය මෙම අවදානමට අයත් වේ. අපගේ ව්‍යාපාරයට සම්බන්ධ ප්‍රධානතම අභ්‍යන්තර අවදානම් වන්නේ පවතින නිෂ්පාදන සම්බන්ධයෙන් කටයුතු කිරීමේ නොහැකියාව සහ නව නිෂ්පාදන සංවර්ධනයට සම්බන්ධ අවදානම්ය. පවතින නිෂ්පාදන සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇති නොහැකියාව සිව්වැදෑරුම් වෙයි. එනම්, පාරිභෝගිකයාගේ අවශ්‍යතා, තාක්ෂණය, කර්මාන්තමය සහ ආර්ථික කරුණු මෙන්ම සෛද්ධාන්තික අවශ්‍යතා හඳුනාගැනීමට ඇති නොහැකියාව වශයෙනි.

සමාගම විසින් පාරිභෝගික තෘප්තිය පිළිබඳ ක්‍රමානුකූල සමීක්ෂණ සහ ඔවුන්ගේ අවශ්‍යතාවන්ගේ වෙනස්වීම් පිළිබඳ ඇගයීම් පවත්වනු ලබයි. සමාගමේ සිදු විය හැකි නියාමනයන් සහ නිර්දේශයන් සම්බන්ධ අනාගත වෙනස්වීම් වටහාගැනීම සඳහා ප්‍රමුඛතම නීති මණ්ඩල මෙන්ම රජය, පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය සහ රබර් පර්යේෂණ ආයතනය වැනි ආයතන සමඟද එය සමීපව කටයුතු කරයි. නව නිෂ්පාදන හඳුන්වාදෙනු ලබන්නේ වෙළෙඳපොළ සහ පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ පූර්ණ අධ්‍යයනයකින් පසුව පමණකි.

## ව්‍යාපාරමය නොවන අවදානම්

මෙම අවදානම ප්‍රධාන ව්‍යාපාරයට සම්බන්ධ නොවන අතර, දිගු කාලීන මූල්‍යකරණය සඳහා මූලික වශයෙන් සම්බන්ධ වෙයි. ඉදිරි වසර 5 සඳහා වන සංයුක්ත සැලසුම සහ වසර 3ක් සඳහා සැකසූ ක්‍රියාකාරී සැලසුම ඔස්සේ සමාගමේ දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා කල්තියා ඇගයීම මඟින් මෙම මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය මූලාශ්‍ර හඳුනාගනු ලැබේ. සැලසුම් කළ වාර්ෂික අයවැය සහ ප්‍රසම්පාදන සැලසුම මඟින් සමාගම තුළට එන සහ එයින් පිටතට යැවෙන මුදල් ප්‍රවාහය කාර්යක්ෂම කෙරෙන බැවින් කිසිවිටෙක ක්ෂණික මුදල් අවශ්‍යතා කිසිවක් පැන නොනගියි.

## මෙහෙයුම් අවදානම්

ආයතනයේ බිම් මට්ටමේ සිදු වන්නේ කුමක්දැයි යන්න පිළිබඳව අදහසක් මෙයින් ලබාදෙයි. ආයතනයේ අභ්‍යන්තර සම්පත්, පද්ධති, ක්‍රියාවලීන් සහ සේවකයින් සමඟ මෙහෙයුම් අවදානම් සෘජුවම සම්බන්ධය. ගබඩා සහ යන්ත්‍රසූත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක නොවීම, සේවක පිරිවැය සහ අයහපත් දේශගුණික තත්ත්ව වැනි ස්වාභාවික සංසිද්ධීන්ද මෙයට ඇතුළත්ය.

- ප්‍රමාණවත් ගිනි නිවීම් යන්ත්‍ර සහ අනතුරු සංඥා උපකරණ සහිත විශාල ආරක්ෂක පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යනු ලැබේ.

- ගින්නකින් ඇති විය හැකි හානි ආවරණයට සමාගම විසින් ගිනි රක්ෂණාවාරණයක් සහ අති සංවේදී පර්යේෂණාගාර උපකරණ සඳහා අමතර ඉලෙක්ට්‍රෝනික රක්ෂණයක් ලබාගනු ලැබ ඇත.

- මංකොල්ලකෑම සහ වංචා දූෂණ වැනි දෙයින් ඇති විය හැකි බලපෑම අවම කිරීම සඳහා ජංගම මුදල් සහ මුදල් සේප්පු සඳහා රක්ෂණය ලබාගෙන ඇත.

- ආනයනය කරනු ලබන සෑම නැව් තොගයක් සඳහාම ප්‍රමාණවත් සාගර රක්ෂණයන් ලබාගෙන ඇත.

- මුදල්මය සහ මුදල්මය නොවන සේවක දිරිගැන්වීම් වැඩසටහන් නිසා සමාගමේ සේවකයින් සඳහා යන වියදම අඩු මට්ටමක පවතී.

## මූල්‍ය අවදානම්

මුදල් උපකරණ භාවිතයේදී ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ වෙළෙඳපොළ අවදානම යනාදිය ඇතුළත් මුදල් අවදානම සමාගම සතුව ඇත.

## ණය අවදානම්

සමාගමේ එකඟතාවන් ඇතිකර ගත් වගකීම්වලට මුහුණදීමට අදාළ පාර්ශ්වයන් අසමත් වන්නේ නම්, සමාගමේ මූල්‍ය පාඩුවට සම්බන්ධ අවදානම වන්නේ ණය අවදානමය. ණය අවදානම ඇති වන්නේ ප්‍රධාන වශයෙන්ම ණය පදනම යටතේ කෙරෙන අලෙවිය සහ මූල්‍ය ආයතනවල කෙරෙන තැන්පතු හේතුවෙනි. මෙම අවදානම් අවම කරගැනීම සඳහා පහත සඳහන් පියවර අනුගමනය කෙරෙයි:

- බෙදාහරින්නන් පත් කිරීමට පෙර ඒ සෑම අයෙකුගේම ශක්‍යතාව පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් ප්‍රාදේශීය අලෙවි කළමනාකරුවන්, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මූල්‍ය කළමනාකරු, සහ සමාගමේ නීති නිලධාරීන් යන අයගෙන් සමන්විත කණ්ඩායමක් විසින් සිදු කරනු ඇත.

- ණය පහසුකම් නිදහස් කිරීමට පෙර බෙදාහරින්නන්ගෙන් සහ අදාළ පාර්ශ්වයන්ගෙන් බැංකු ඇපකර ලබාගැනෙයි.

- ණය කාලපරිච්ඡේදයන් සහ ණය සීමාවන් දැක්වෙන්නේ බෙදාහරින්නන් සහ අදාළ පාර්ශ්වයන් සඳහා සිදු කෙරෙන ණය විශ්ලේෂණවලදී ඇති කරගනු ලබන අවසන් නිගමනවලට අනුකූලවය.



# අවදානම් කළමනාකරණය

### ද්‍රවශීලතා අවදානම්

මූල්‍ය වගකීම්වලට මුහුණ දීමට සමාගමට ඇති නොහැකියාව ද්‍රවශීලතා අවදානම ලෙස හැඳින්වේ.

ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා සමාගම කටයුතු කරන්නේ සාමාන්‍ය මෙන්ම අනපේක්ෂිතව ඇති වන වගකීම්වලටද මුහුණ දීම සඳහා සෑහෙන මුදල් ප්‍රමාණයක් පවත්වාගැනීම සඳහාය. සමාගමෙන් පිටතට යැවෙන මුදල් සහ මෙම මුදල් ප්‍රවාහයන්ගේ ප්‍රභවයන් පිළිබඳ පූර්ව ඇගයීම් හඳුනාගැනීමට ඉදිරි වසර පහ සඳහා වන සංයුක්ත සැලසුම සහ ඉදිරි වසර තුන සඳහා වන ක්‍රියාකාරී සැලසුම උපකාරී වන අතර, සමාගම වෙතට එන සහ සමාගමෙන් පිටතට යන මුදල් ප්‍රවාහයන් කාර්යක්ෂම කිරීම සහ සියලු මූල්‍ය වගකීම් සපුරාලීම සඳහා පහසුකම් සැපයීම වාර්ෂික වාර්තාව සහ ප්‍රසම්පාදන සැලසුම මඟින් සිදු කෙරෙයි.

### වෙළෙඳපොළ අවදානම්

විදෙස් විනිමය වටිනාකම වෙනස් වීම (විනිමය මුදල් අවදානම) සමඟ අනුපාත වෙනස් වීම හේතුවෙන් වෙළෙඳපොළ මිල වෙනස් වීම වෙළෙඳපොළ අවදානම ලෙස හැඳින්වෙන අතර, එමඟින් සමාග මේ ආදායමට සහ මූල්‍ය උපකරණ පවත්වාගැනීමේ හැකියාවට බලපෑම් ඇති විය හැකිය.

### හුවමාරු මුදල් අවදානම්

ඇමෙරිකානු ඩොලරයට සාපෙක්ෂව ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම වෙනස් වීමෙන් ඇති වන අවදානම මඟින් විනිමය මුදල් අවදානම ඇති වෙයි.

### පොළී අවදානම

ස්ථාවර පොළී අනුපාතයක් යටතේ කරනු ලබන ණය මිලදීගැනීම සහ බැංකු තැන්පතු සම්බන්ධ රඳවාගැනීම් පොළී සඳහා වෙළෙඳපොළ පොළී අනුපාත වෙනස් වීම පොළී අවදානම ලෙස හැඳින්වේ.

### නියාමන අවදානම්

පොහොර ආනයනය, නිෂ්පාදනය, බෙදාහැරීම සහ පරිභෝජනය සම්බන්ධ රාජ්‍ය නියාමනයන් සහ පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය සහ රබර් පර්යේෂණ ආයතනය වැනි රාජ්‍ය ආයතන මඟින් බලාත්මක කරනු ලබන නිර්දේශයන් වෙනස් වූ විට, ඒ අනුව කටයුතු කිරීමේ නියාමන බලය
සමාගමට ඇත. නියාමන සැකැස්මේ කිසියම් වෙනසක් හඳුනාගැනීමේදී සමාගම මේ ආයතන සමඟ සමීපව කටයුතු කරයි.

කෙසේවුවද, අවදානම් සාධක මෙම ලැයිස්තුවට සීමා නොවන අතර, සමාගමේ මෙහෙයුම්වලට බලපෑම් ඇති කළ හැකි එවැනි වෙනස්වීම් සම්බන්ධයෙන් එය ඉතා සැලකිලිමත්ය.

# විගණන සහ අවදානම් කළමනාකරණ කමිටු වාර්තා

**2017 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වසර තුළදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද කාර්ය නීතිවලට අනුකූලව විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව කටයුතු කර ඇත.**

## කමිටුවේ සංයුතිය

විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව පත් කරනු ලැබ ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සහ කමිටු සභාපති ලෙස කටයුතු කරන භාණ්ඩාගාර නියෝජිතයෙකුගෙන් කමිටුව සමන්විත වෙයි. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයා සහ කෘෂිකර්ම අමාත්‍යංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා කමිටුවේ නිරීක්ෂකයින් ලෙස කටයුතු කරති. මෙම කමිටුව 2016/17 සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

1. ජේ. එම්. එස්. ඩී. රත්නායක මිය
   කමිටු සභාපතිනිය
2. අනෝජා හේරත් මිය
   කමිටු සාමාජිකා
3. හේමක ලසිත බාලසූරිය මහතා
   කමිටු සාමාජික
4. ආර්. පී. සුනන්දා පද්මිණී මිය
   නිරීක්ෂක
5. පී. එල්. නාමසේන මහතා
   නිරීක්ෂක

## කමිටු රැස්වීම් සහ සහභාගීත්වය

මෙම මූල්‍ය වසර තුළදී විගණන කමිටුව 4 වරක් රැස්වී ඇත. විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා කටයුතු කර ඇති අතර, කමිටුවේ ආරාධනය පරිදි පැහැදිලි කිරීම් සැපයීම සඳහා සාමාන්‍යාධිකාරීවරයා, අදාළ අංශ ප්‍රධානීන් සහ සෙසු නිලධාරීන් රැස්වීම්වලට සහභාගි වී ඇත. රැස්වීම්වලට සහභාගිවීම පහත පරිදි විය:

### රැස්වීම් සහ සහභාගීත්වය - 2016/2017

| දිනය | ජේ. එම්. එස්. ඩී. රත්නායක මිය | අනෝජා හේරත් මිය | හේමක ලසිත බාලසූරිය මහතා | ආර්. පී. සුනන්දා පද්මිණී මිය | පී. එල්. නාමසේන මහතා |
|---|---|---|---|---|---|
| 27.02.2017 | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 19.12.2016 | ✓ | × | ✓ | ✓ | ✓ |
| 13.09.2016 | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 17.05.2016 | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| | **4/4** | **3/4** | **4/4** | **4/4** | **4/4** |

## කමිටුවේ කාර්යභාරයන්

1. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලාංකේය සහ ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සකසා ඇත්දැයි සහතික කරගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව සහ සාධාරණත්වය විශ්ලේෂණය කිරීම.
2. සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ආර්ථිකය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව සහතික කරගැනීම, විමර්ශනය සහ ඇගයීම.
3. සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධතියේ ඵලදායීතාව විමර්ශනය කිරීම.

4. රජයේ විගණකවරුන් සමඟ සාකච්ඡා පැවැත්වීම සහ විගණකවරයාගේ කළමනාකරණ ලිපිය විමර්ශනය කිරීම.

5. නීති, නියාමන, වගන්ති සහ චක්‍රලේඛ යනාදිය සමඟ සමාගමේ ක්‍රියාකාරකම් අනුගත වන්නේදැයි සහතික කරගැනීම.

6. අභ්‍යන්තර විගණන වාර්තා / විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් සම්බන්ධ විමසුම් සහ නිර්දේශ.

7. මහජන ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් / නියමයන් ක්‍රියාත්මක කිරීම.

## වසරේ ක්‍රියාකාරකම්

අදාළ පාර්ශ්වයන්ට සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාව සහ විශ්වසනීයත්වය සහතික කරගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබ ඇති මූල්‍ය වාර්තාකරණ පද්ධතිය විමසුමට ලක් කළ කමිටුව විසින් ශ්‍රී ලාංකික සහ ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිතීන් සහ ආශ්‍රිත පාර්ශවීය කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිය නිරීක්ෂණයන් සපයනු ලැබිණි. එයට අමතර වශයෙන්, බාහිර විගණක ලෙස කටයුතු කරමින් යම් යම් කරුණු නිවැරදි කිරීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු උපදෙස් නිකුත් කිරීමේ කාර්යභාරය ඉටු කරන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් මතු කරනු ලබන විගණන ගැටලු කෙරෙහිද කමිටුව විශේෂ අවධානය යොමු කරයි.

## අභ්‍යන්තර විගණනය

සමාගම මනා සංවිධානාත්මක බවකින් යුතු අභ්‍යන්තර විගණන අංශයකින් සමන්විත වන අතර, එහි කාර්යමණ්ඩලය විගණනය, මූල්‍ය ගිණුම්කරණය, බදුකරණය සහ ව්‍යාපාර පරිපාලනය ඇතුළු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පළපුරුදු වෘත්තිකයින්ගෙන් සැදුම් ලත් කාර්යමණ්ඩලයකින් සමන්විතය.

**අභ්‍යන්තර විගණන අංශයේ මූලික අරමුණු:**

1. ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන ක්‍රම විමසුමට ලක්කිරීම

2. මූල්‍ය සහ මෙහෙයුම් තොරතුරු පරීක්ෂාව

3. මෙහෙයුම්වල ආර්ථිකය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව විමසුමට ලක්කිරීම

4. කළමනාකරුවන් වෙත පවරා ඇති මෙහෙයුම් සහ වැඩසටහන් නිසි පරිදි සිදු වන බවට වගබලා ගැනීම සහ මෙහෙයුම් සහ වැඩසටහන් සැලසුම් කළ පරිදි සිදු කෙරෙන බව මෙන්ම ස්ථාපිත අරමුණු සහ ඉලක්ක සමඟ මෙහෙයුම් ප්‍රතිඵල සමපාත වන බව සාධාරණ ඇගයුමක් සහිතව සහතික කිරීම

5. කළමනාකරණ ප්‍රතිපත්ති සමඟ නීති, නියාමනයන් සහ සෙසු බාහිර අවශ්‍යතා සමපාත වන බව සහතික කරගැනීම

6. විශේෂ විමර්ශන පැවැත්වීම

අභ්‍යන්තර විගණන සැලසුම, ප්‍රාදේශීය පොහොර ගබඩාවල විගණන වැඩසටහන්, නියාමන අවදානම් ඇගයුම් ක්‍රමවේදය සහ අවදානම් මත පදනම් වූ විගණන සැලසුම් කෙරෙහි අවධානය යොමු කරමින් වාර්තා කිරීම් කාලපරිච්ඡේදය අතරතුරදී විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලැබීය. විමසුමට ලක් කරන ලද වසර තුළදී අභ්‍යන්තර විගණකවරයාගේ වාර්තා සහ නිර්දේශයන් සැලකිල්ලට ගැනීම සඳහා විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණකවරයා සමඟ සාකච්ඡා පවත්වා ඇත.

ප්‍රාදේශීය පොහොර ගබඩා 40ක සහ ප්‍රධාන කොට්ඨාස 08 ක අභ්‍යන්තර විගණන වාර්තා සැලකිලිමත්ව විමසුමට ලක් කරන ලද අතර, සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතීන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය තුළ සැලකිය යුතු වර්ධනයක් දැකගත හැකි විය.

වැදගත් කරුණු සාකච්ඡා කිරීම සඳහා ත්‍රෛමාසික පදනමක් මත කෘෂිකර්ම අමාත්‍යංශයේ පැවැත්වෙන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහභාගි වෙයි. පොහොර අලෙවිය සහ බෙදාහැරීම සම්බන්ධ ක්‍රියාවලියේදී සිදු වන අල්ලස් හා දූෂණ මර්දනය සඳහා තොරතුරු ලබාදීමට කැමති මහජනතාව සහ ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙතින් රහස්‍යභාවය සහතික කරමින් තොරතුරු ලබාගැනීම සඳහා තොරතුරු තාක්ෂණ විගණන ඒකකයක් ස්ථාපිත කර ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව සහ පොලිස් දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් ලබාදෙන සහයෝගය ඉතා විශිෂ්ටය.

## බාහිර විගණනය

සමාගමේ බාහිර විගණක ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

## කමිටුවට ලබාදෙන සහාය

කමිටු සභාපති සහ කළමනාකාරීත්ව කමිටු සාමාජිකයින් විසින් අපේක්ෂිත සහාය කමිටුවට ලබාදෙන ලද අතර, වාර්තා කිරීම් කාලපරිච්ඡේදය අතරතුරදී ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා කමිටුවට එය ඉතා වැදගත් විය.

## කමිටු ඇගයීම

කමිටුවේ සේවා ක්‍රියාවලිය එහි විමසුමක් සමඟම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අගයනු ලැබේ. කමිටුවේ සේවා ක්‍රියාවලිය ඵලදායී වී ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිගමනය කරනු ලැබ ඇත.



**ජේ. එම්. එස්. ඩී. රත්නායක**
සභාපතිනිය
විගණන සහ කළමනාකාරීත්ව කමිටුව
2017 මැයි 31

# තොරතුරු තාක්ෂණ අංශ වාර්තාව

තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ සැලසුම්, මෘදුකාංග යෙදවුම සහ නඩත්තුව, දෘඩාංග ලබාගැනීම සහ නඩත්තුව, ජාලගතකරණ සංවර්ධනය සහ නඩත්තුව, වෙබ් අඩවි නඩත්තුව සහ තොරතුරුවල ආරක්ෂාව සහතික කිරීම සහ සුදුසු කළමනාකාරීත්ව තීරණ ගැනීමේ කටයුත්ත සඳහා ආයතනය වෙත වැදගත් දත්ත සහ තොරතුරු කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ලැබෙන බව සහතික කිරීම සම්බන්ධ ක්‍රියාවලීන් තොරතුරු තාක්ෂණ අංශය මඟින් ඉටු විය යුතු යැයි අපේක්ෂා කෙරෙයි. අදාළ විමසුමට ලක් කරන ලද වසර තුළදී එහි ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

- ව්‍යවසාය සම්පත් කළමනාකරණ මෘදුකාංගය (ERP) සීමාසහිත ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.
- ආරම්භක පියවරක් වශයෙන් පොළොන්නරුව, වීරවිල, කුරුවිට, මතුගම ඇතුළු ප්‍රාදේශීය පොහොර ගබඩා 10 ක් VPN සම්බන්ධතාවය මඟින් ERP පද්ධතිය හා සම්බන්ධ කිරීම.
- ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පරිගණක ජාලය පරිගණක 250ක් සම්බන්ධ කළ හැකි පරිදි වැඩි දියුණු කිරීම. (පරිගණක 130 ක ජාලයක් දැනටමත් ප්‍රධාන කාර්යාලයේ භාවිතා කෙරේ).
- රාජකාරි ජංගම උපාංග සහ ලැප්ටොප් සඳහා ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ ආරක්ෂිත වයි-ෆයි කලාපයක් හඳුන්වාදීම

ලංකා පොහොර සමාගමේ ව්‍යවසාය සම්පත් කළමනාකරණ මෘදුකාංගයේ මූලික අරමුණ වන්නේ භාණ්ඩ සැපයුම් දාමයේ ක්‍රියාකාරකම්, මිලදී ගැනීමේ සිට සැකසීම, මිශ්‍ර කිරීම, පාරිභෝගිකයා වෙත බෙදාහැරීම දක්වා පිරික්සීමය. සමාගමේ දත්ත පිළිබඳ මේ සමෝධානික දැක්ම මඟින් ක්‍රියාකාරීත්ව සහ ආයතනික සීමාවන් ඔස්සේ තොරතුරු බෙදාහදාගැනීම සහ සහයෝගයෙන් යුතුව කටයුතු කිරීම ඉහළනැංවීම අරමුණු කෙරෙයි.

සමාගම විසින් ව්‍යවසාය සම්පත් කළමනාකරණ මෘදුකාංගය (ERP) යොදාගනු ලබන්නේ එහි අභ්‍යන්තර ක්‍රියාවලීන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහාය. මේ පද්ධතියෙහි තත්කාලීන තොරතුරු ප්‍රවාහය මඟින් දත්ත රැස්කිරීම, විශ්ලේෂණය සහ වාර්තාකරණය සරල කෙරෙන අතර, එමඟින් තීරණ ගැනීමේ හැකියාව ඉහළ නැංවෙයි. ව්‍යවසාය සම්පත් කළමනාකරණ මෘදුකාංගය සඳහා සැලසුම්කරණය, තොග නැවත ගබඩා කිරීම සහ නිෂ්පාදන කාල සැලසුම්කරණය අවශ්‍ය වන අතර, එමඟින් බහුවිධ දත්ත ගොනු සහ වෙන් වෙන් වශයෙන් වාර්තාකරණ පද්ධතීන් පවත්වාගැනීමේ අවශ්‍යතාව අඩු වෙයි. කළමනාකාරීත්වයට අදාළ මොහොතේදීම සැකසීම් කළ හැකි වන බැවින් මෙම ක්‍රියාවලිය මඟින් නිෂ්පාදන පමාවන්ද අඩු කළ හැකිය. ව්‍යවසාය සම්පත් කළමනාකරණ මෘදුකාංග ක්‍රියාවලීන් මඟින් කාර්යයන් නැවත කිරීමේ අවශ්‍යතාව අඩු වන බැවින් එමඟින් පිරිවැයද අඩු වෙයි.

## සුවිශේෂී විශේෂාංග

### ප්‍රසම්පාදනය සහ ආනයන

- සැලසුම්කරණය
  - අයිතමය / අලෙවිකරු / මිලදීගැනීම් කේතය / පුරෝකථනය / නිපැයුම් සැලසුම් කිරීම
- ඇණවුම් සැකසීම
  - මිල ගණන් ඉදිරිපත් කිරීම
  - ආවරණ මිලදීගැනීම් ඇණවුම
  - මිලදීගැනීම් ඇණවුම් - දේශීය/ආනයන
  - මිලදීගැනීම් ඉන්වොයිස්පත
- තොග සහ පිරිවැයකරණය
  - අයිතමය / ගබඩාකරණය / තොග පාලනය
- ඉතිහාසය
  - බඩු භාරගැනීම් කුවිතාන්සිය / මිලදීගැනීම් අයපත (AP)
- විශ්ලේෂණය සහ වාර්තා

### අලෙවි සහ වෙළෙඳ

- අලෙවි
  - සම්බන්ධතා තොරතුරු
  - පාරිභෝගිකයා
  - ක්ෂේත්‍ර නිළධාරී තොරතුරු
- ඇණවුම සැකසීම
  - මිල ගණන් ඉදිරිපත් කිරීම
  - ආවරණ ඇණවුම
  - අලෙවි ඇණවුම සකස්කිරීම
  - විකුණුම් ඉන්වොයිස්පත
- ඉතිහාසය
  - සම්පූර්ණ කරන ලද විකුණුම් ඉන්වොයිස්පත
  - සම්පූර්ණ කරන ලද නිකුත් කිරීම්පත්

- වාර්තා සහ විශ්ලේෂණය

## මූල්‍ය කළමනාකරණය

- සාමාන්‍ය ලෙජරය
- මුදල් කළමනාකරණය
- පිරිවැය ගිණුම්කරණය
- මුදල් ප්‍රවාහ පුරෝකථනය
- ලැබීම්
- ගෙවීම්
- ස්ථාවර වත්කම්
- තොග කළමනාකරණය
- කාලානුරූප ක්‍රියාකාරකම්

## බෙදාහැරීම, ගබඩා සහ තොග

- ඇණවුම් සහ සැපයුම්කරුවන්ගේ විස්තර
  - ගබඩා/ මිලදීගැනීම් ඇණවුම්/ විකුණුම් ඇණවුම්/ හුවමාරු කිරීම් ඇණවුම්/ නිෂ්පාදන ඇණවුම්

- සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම
  - අයිතම නැවත වර්ගීකරණය

- තොග
  - අයිතම විස්තරය
  - හුවමාරු ඇණවුම් - ගබඩා හුවමාරුකිරීම්
  - ප්‍රත්‍යාගණනය කිරීම
  - භෞතික තොග විස්තරය

- ඉතිහාසය
  - හුවමාරු ලැබීම්/ නිකුත්කිරීම්/ බඩු භාරගැනීමේ කුවිතාන්සිය

- විශ්ලේෂණය සහ වාර්තා

## නිෂ්පාදනය

- නිෂ්පාදන සැලසුම්කරණය
  - නිෂ්පාදන අමුද්‍රව්‍ය සටහන්පත
  - මිශ්‍රණ ක්‍රමවේද

- ධාරිතාවන්
  - මිශ්‍රණ ක්‍රමවේද
  - මිශ්‍රණ අංශය

- සැලසුම්කරණය
  - පොහොර ගබඩා
  - නිෂ්පාදන පුරෝකථනය

- ක්‍රියාත්මක කිරීම
  - නිෂ්පාදන ඇණවුම් සැලසුම් කිරීම
  - නිමකරණ ලද නිෂ්පාදන ඇණවුම්

- පිරිවැයකරණය - අයිතම

## මුල් පිටුව

- මයික්‍රොසොෆ්ට් අවුට්ලුක්
- පොදු රූප සටහන් - ත්‍රිමාන
- භාවිතකරු පාදක කරගත් අන්තර් මුහුණත
- මුදල් ප්‍රවාහ පුරෝකථනය
- දැනුම්දීම්
- වෙබ් සේවාදායක
- සජීවී සම්බන්ධවීම්

## මානව සම්පත් / වැටුප් සැකසීම සහ දෛනික පැමිණීම් පිටවීම් වාර්තාකරණය

- සේවක විස්තරය
- පැමිණීම
- අතිකාල, දිරිදීමනා, ප්‍රසාද දීමනා සහ වෙනත් දීමනා
- ණය
- ඒකාබද්ධ වැටුප් විස්තර
- වාර්තා
  - වැටුප් පත්‍රය
  - වැටුප් පත්‍රිකාව
  - සී ආකෘති පත්‍රය
  - කාසි විශ්ලේෂණය
  - අන්තර් බැංකු ගෙවීම් ක්‍රමවේදය

## BI මෙවලම

- මතකය පාදක කරගත් BI මෙවලම
- What if විශ්ලේෂණය
- Offline විශ්ලේෂණය
- කාර්යභාරය පාදක කරගත් භාවිතකරු සීමාකරණය
- එක් අවස්ථාවකදී බහුවිධ දත්ත ගොනු
- වෙබ් පාදක කරගත් භාවිතකරු සබඳතාව



### End to End Solution

- One Solution for everything
- No Duplication of Data
- Easy integration with other SQL database Systems



### User Friendly

- In-built integration with Microsoft Office – Excel , Word, E-mail, O365 etc.
- Familiar Interfaces
- Web Based



### Software + Services

- Based on Microsoft Best Practices
- Flexible for Customer specific Customization
- Availability of Local Implementation Team



### Cost

- Low TCO ( Total Cost of Ownership)
- High Return on Investment (ROI)
- Lower maintenance Cost

# කාර්මික අංශ වාර්තාව

පොහොර ආනයනය සහ සිල්ලර අලෙවිය කරන ප්‍රමුඛතම රාජ්‍ය නියෝජිත ආයතනය සීමාසහිත ලංකා පොහොර සමාගම බව පුන පුනා පැවසීම හෝ අවධාරණය කිරීම අවශ්‍ය නැත. සමාගමේ කාර්මික අංශය ලෙස ආනයන අවස්ථාවේ සිට අපගේ පාරිභෝගිකයින් වෙත සැපයුම් ලබාදෙන අවස්ථාව දක්වාම සම්බන්ධ වෙමින් ඔවුන් උපරිම වශයෙන් සෑහීමට පත් වන පරිදි අපි කටයුතු කරන්නෙමු. මේ ඒකායන අරමුණ වෙනුවෙන් ප්‍රසම්පාදන, මූල්‍ය, අලෙවි සහ බෙදාහැරීම් අංශ සමඟ එක්ව කටයුතු කරමින් සමාග මේ ලාභ ඉහළ නැංවීමටත්, 24 X 365 සේවා ආචාරධර්මය ඔස්සේ අපගේ කාර්යමණ්ඩලයට වඩාත්ම ගැළපෙන සේවා පරිසරයක් ලබාදීමටත් අපි කටයුතු කරන්නෙමු.

කාර්මික අංශයේ කාර්යමණ්ඩල සාමාජිකයින් 20 දෙනෙකුගෙන් පමණ සමන්විත තත්ත්ව චක්‍ර කණ්ඩායම මඟින් අපගේ වැටුප් අංශයේ කාර්යමණ්ඩලයට, ලියාපදිංචි වූ සියලු ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්ට සහ ඔවුන්ගේ නියෝජිතයින්ට, ලියාපදිංචි වූ සියලු සිල්ලර අලෙවි බෙදාහරින්නන්ට සහ විවිධ සේවාවන් සපයමින් ආයතනවලින් අප හා සම්බන්ධ වන පිරිස් වෙතට කැපවීමෙන් යුතු සේවයක් ලබාදෙයි. සුහදශීලී සේවයක් ලබාදීමේ සෘජු ප්‍රතිඵල ලෙස ලාභ ඉහළ යෑම සිදු වන බව අප විසින් හඳුනාගනු ලැබ ඇති බැවින්, සැමවිටම එවැනි ඉහළ තත්ත්වයේ සේවයක් ලබාදීමට අපි කැපව සිටින්නෙමු.

# රසායනාගාර අංශය

## ලංකා පොහොර සමාගමේ පොහොර පරීක්ෂාවන් සිදු කෙරෙන රසායනාගාරයේ ව්‍යුහය

ISO/IEC 17025:2005 තත්ත්ව සහතිකය සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ අනුමැතිය ලබා ඇති ලංකා පොහොර සමාගමේ රසායනාගාරය පොහොර සහ ඇසුරුම් ද්‍රව්‍ය පරීක්ෂාව සඳහා පහසුකම්වලින් සමන්විතය.

ලංකා පොහොර සමාගමේ කළමනාකාරිත්වය සහ රසායනාගාර කාර්ය මණ්ඩලය පාර්භෝගිකයින්ට පරීක්ෂාවන් සහ විශ්ලේෂණයන් සම්බන්ධව පිරිමැසුම්දායි හා ඉහළ අනර්ඝත්වයෙන් යුතු විශිෂ්ඨ සේවාවක් ලබාදීම සඳහා කටයුතු කරති.

රසායනාගාරය මඟින් සම්මත ක්‍රමවේදයන්ට, පාර්භෝගිකයින්ගේ අවශ්‍යතාවන්ට සහ අදාළ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි සිය සේවාවන් සිදු කරයි.

රසායනාගාරයේ අරමුණ වන්නේ සෑම සේවකයෙකුටම සිය සේවා කර්යභාරයන් නිවැරදි අයුරින් සිදු කිරීම සඳහා සුදුසු මෙවලම්/උපකරණ සහ මනා පුහුණුව ලැබෙන පරිසරයක් නිර්මාණය කිරීමය. රසායනාගාරයේ සමස්ත කාර්යමණ්ඩලයට සිය කාර්යභාරයන් හා සම්බන්ධ ක්‍රියාවලීන් සහ ක්‍රමවේදයන් පිළිබඳ පුහුණුව ලබාදෙනු ලබන අතර, ISO/IEC 17025:2005 තත්ත්ව පද්ධතිය සාර්ථක කරගැනීමේ වගකීම ඉටුකිරීමටද ඔවුන් යොමු කෙරෙයි.



# අලෙවි අංශ වාර්තාව

මේ අභියෝගාත්මක වසර තුළදී වුවද, අලෙවි අංශය විසින් ලංකා පොහොර සමාගම නමැති සන්නාමය ඉහළ නැංවීම සඳහා මෙන්ම එහි නිෂ්පාදන අංශ ගොවි ජනතාව අතර ප්‍රවර්ධනය කිරීම සඳහාද වැඩසටහන් ගණනාවක් දියත් කරනු ලැබිණි. විමසුමට ලක් කෙරෙන වසර තුළදී පහත දැක්වෙන කටයුතු සිදු කරනු ලැබිණි.

- එක් අතෙකින් ජාලයේ සවිමත්බව ඉහළ නැංවීමටත්, අනෙක් අතින් කාබනික කැට පොහොර හඳුන්වාදීම සඳහාත් අලෙවි නියෝජිත සමුළුවක් සහ සුහද හමුවක් මීගමුව ග්‍රෑන්ඩීසා හෝටලයේ පවත්වනු ලැබිණි.

- කෘෂිකර්මාන්ත සතිය අතරතුරදී අලෙවි අංශය විසින් වැඩසටහන් රැසක් සංවිධානය කරනු ලැබිණි.

  - අනුරාධපුර කලාවැව අසල මැටි පහන් 2000ක් දැල්වීම
  - කෘෂි සේවාවන්, කෘෂි සංවිධාන වැනි රාජ්‍ය කාර්යාල සහ ගොවීන්, අලෙවි නියෝජිතයින් සහ පාරිභෝගිකයින් සඳහා දැනුවත්කිරීම් වැඩසටහන් ලෙස කුඩා හමු පවත්වනු ලැබිණි.
  - කාබනික ආහාර ප්‍රවර්ධන උළෙලට සහභාගී වීම සඳහා විහාරමහාදේවී උද්‍යානයේදී කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන පවත්වනු ලැබිණි

- ක්‍රමෝපායයිකව ප්‍රවර්ධන කටයුතු සිදු කරමින් සමාගම විසින් ලෝක ළමා දින සැමරුම් අතරතුරදී රූපවාහිනී දැන්වීමක් දියත් කරනු ලැබිණි.

- කාබනික අංශය අරමුණු කරගත් සන්නාම ප්‍රවර්ධන වැඩසටහන් කුරුණෑගල, ගාල්ල සහ මාතර කෘෂි සේවා මධ්‍යස්ථානවල සංවිධානය කෙරිණි.

- ගොවීන් අතර ලක්පොහොර සන්නාම දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ප්‍රධාන බලයලත් නියෝජිතයින්ට සහ බෙදාහරින්නන්ට බැනර්, පෝස්ටර් සහ නාම පුවරු ලබාදෙනු ලැබිණි. ලංකා පොහොර සමාගම සහ එහි නිෂ්පාදන රැස පිළිබඳ අලුත්ම තොරතුරු සහිත ඩී.වී.ඩී. පටයක්ද ඇතුළත්ව තවත් අලෙවි ප්‍රචාරණ ද්‍රව්‍ය නිර්මාණය කරනු ලැබිණි.

- සමාජ මාධ්‍ය ජාලවල වැදගත්කම අවබෝධ කරගනිමින්, ලංකා පොහොර සමාගම සහ එහි පුළුල් පාරිභෝගික පදනම අතර අන්තර් ක්‍රියාකාරී සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා අලෙවි අංශය විසින් ෆේස්බුක් නියෝජනයක් ස්ථාපිත කරනු ලැබිණි.

- දිරිගැන්වීම් සහ උත්ප්‍රේරක වැඩසටහන් සැලසුමෙහි එක් අදියරක් ලෙස ඉහළ සේවා ක්‍රියාකාරිත්වයක් පළ කළ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දේශීය මෙන්ම විදේශීය සංචාරද සංවිධානය කරනු ලැබිණි.



# ප්‍රසම්පාදන අංශය

සීමාසහිත ලංකා පොහොර සමාගමේ අරමුණ සපුරාගැනීම සඳහා ප්‍රසම්පාදන අංශය විසින් සමාගම තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. වඩාත් පුළුල් මෙන්ම විවිධාංගීකරණය වූ වෙළෙඳපොළක් සඳහා පොහොර නිෂ්පාදනය සහ අලෙවිය සිදු කරන අතරම ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සහ කෘෂි සේවාවන් තුළ නිෂ්පාදන ආදායම සහ ලාභදායීත්වය ඉහළ නැංවීමට සක්‍රියව දායක වෙමින් ලාභ උපරිමකරණය සහ පවත්වාගැනීම සිදු කෙරෙයි.

මෙම අංශයේ මූලික කාර්යභාරය වන්නේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රසම්පාදන උපදෙස් මාලාවන් සහ නිර්දේශයන්ට අනුකූලව භාණ්ඩ, සේවාවන්, කාර්යභාරයන් සහ උපදේශන සේවාවන් සපයාගැනීමය. මූලික අවධානය යොමු කෙරෙන්නේ යූරියා, MOP සහ TSP වැනි ප්‍රධාන පොහොර වර්ග ප්‍රසම්පාදනය කෙරෙහිය.

ලංකා පොහොර සමාගම මූල්‍ය වශයෙන් සවිමත්භාවයෙන් යුතු රජයට අයත් ව්‍යාපාරයක් වන බැවින් ශ්‍රී ලංකාවේ පොදු භාණ්ඩාගාර ක්‍රමයට අයත් වුවද, එය ඒකාබද්ධ අරමුදලෙන් කිසිදු මූල්‍ය සහායක් ලබා නොගනියි. එසේම, වී වගාව සඳහා රටේ පොහොර අවශ්‍යතාවයේ සමස්ත ප්‍රමාණයෙන් ප්‍රධාන කොටස මෙම සමාගමේ ක්‍රමවත් ප්‍රසම්පාදන ක්‍රමය මඟින් සපුරාලනු ලැබ ඇත.

රජයේ ප්‍රතිපත්තිය වන්නේ "වසවිසෙන් තොර රටක් - නිරෝගීමත් ජනතාවක්" යන තේමාව යටතේ රසායනික පොහොර භාවිතය අවම කරන අතරම, කාබනික පොහොර පරිභෝජනය ඉහළ නැංවීම වන බැවින්, ප්‍රසම්පාදන අංශය විසින් රාජ්‍ය ප්‍රතිපත්තිය හා අනුකූල වන පරිදි කාබනික දියර පොහොර, කාබනික කැට පොහොර සහ කොම්පෝස්ට් පොහොර වැනි කාබනික පොහොර නිෂ්පාදන ප්‍රසම්පාදනය කිරීම සඳහා ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කරනු ලැබිණි.



# බෙදාහැරීම් අංශය

බෙදාහැරීම් අංශයේ මූලික කාර්යභාරය වන්නේ සමාගමේ බෙදැහැරීම් කටයුතු හා සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීමය. දිවයින පුරා ව්‍යාප්ත ප්‍රාදේශීය ගබඩා 44කින් සමන්විත ලක්පොහොර බෙදාහැරීම් ජාලය උපයෝගී කරගනිමින් ඉල්ලුම් - සැපයුම් සමීකරණය ප්‍රශස්ත පරිදි පවත්වා ගැනීමට එය කටයුතු කරයි.

මෙම බෙදාහරින්නන් පත්කිරීම මගින් සමාගමේ ව්‍යාප්තියට විශාල දායකත්වයක් ලැබී ඇති අතර, එමඟින් ගොවියාගේ ගෙයි දොරකඩටම පොහොර සැපයීමට හැකියාව ලැබෙයි. මෙය විශේෂයෙන්ම අදාළ වන්නේ කාබනික දියර පොහොර බෙදාහැරීම සම්බන්ධයෙනි.

**බෙදාහරින්නන් විසින් සිදු කරනු ලබන බෙදාහැරීම් ආවරණ ප්‍රදේශ**

- මොනරාගල
- මඩකලපුව
- ත්‍රිකුණාමලය
- මහනුවර
- පොළොන්නරුව
- යාපනය
- කිළිනොච්චිය
- පුත්තලම
- අම්පාර
- හම්බන්තොට
- රත්නපුරය
- මන්නාරම




## නිෂ්පාදන කාර්යසාධනය 2016/17

මිශ්‍ර පොහොර නිෂ්පාදනය මෙම අංශය විසින් සිදු කරනු ලබන දෙවැනි කාර්යභාරයක් වන අතර, මෙය සිදු කෙරෙන්නේ පර්යේෂණ ආයතන විසින් ස්ථාපිත කරනු ලැබ ඇති සූත්‍රයන්ට අනුකූලවය. මිශ්‍ර පොහොර නිෂ්පාදනයේදී නවතම තාක්ෂණය උපයෝගී කරගනු ලබන දියුණු මුසුකිරීම් යන්ත්‍ර යොදාගැනෙන අතර, විමසුමට ලක් කෙරෙන වසර සඳහා එම වාර්ෂික නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 8,488,455ක් විය.






# අපගේ භූගෝලීය ආවරණය

# 44 Island wide fertilizer distribution warehouse network....

## Ceylon Fertilizer Co. Ltd.

Islandwide Fertilizer Distribution Network

**Northern Region**
Kondavil
Kilinochchi
Varani
Olumadu
Murankan

**North Central Region**
Medawachchiya
Horowpathana
Nochchiyagama
Hingurakgoda
Welikanda
Polonnaruwa

**North Western Region**
Anamaduwa
Maho
Kurunegala
Nattandiya

**Central Region**
Dambulla
Nagolla
Matale
Gampola
Rikillagaskada
Nuwara-Eliya

**Eastern Region**
Trincomalee
Kantale
Batticaloa
Dehiattakandiya
Ampara
Pothuvil

**Western Region**
Hunupitiya
Dodangoda
Matuhgama
Pelawatte

**Sabaragamuwa Region**
Kegalle
Kuruvita
Embilipitiya

**Uva Region**
Mahiyanganaya
Bibile
Badulla
Monaragala

**Southern Region**
Weerawila
Dehigahalanda
Bata-Atha
Medawiyangoda
Akuressa
Koggala




+11,00.00



# මූල්‍ය ප්‍රකාශන

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
සීමාසහිත ලංකා පොහොර සමාගම

# අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම
## පිළිබඳ ප්‍රකාශනය

2007 අංක 07 දරණ සමාගම් පනතේ අංක 150(1) සහ 151 වගන්තීන්ට අනුව එහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම සමාගමේ කටයුතු සහ සමාගමේ ලාභ අලාභ ගිණුමෙහි සත්‍ය හා සාධාරණත්වය පිළිඹිබු වන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට අධ්‍යක්ෂකවරුන් වගකිව යුතු වේ.

මූල්‍යමය තත්වය සාධාරණ නිර්වද්‍යතාවයකින් තීරණය කිරීමට ඉවහල් වන පරිදි විධිමත් ලේඛන පවත්වාගෙන යන බවට, මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට සහ එම ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන නියමාකාරයෙන් සිදුවන බවට අංක 148 වගන්තියට අනුව අධ්‍යක්ෂකවරු වගකිව යුතු වේ.

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශ වල අවංකභාවය හා වාස්තවිකතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය භාර ගනී. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගනුදෙනුවල ස්වරූපය හා අන්තර්ගතය නිසි අයුරින් පිළිඹිබු වන සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන්ට එළඹෙමින් උචිත ගිණුම් ප්‍රතිපත්ති සංගතභාවයකින් යුතුව තෝරාගෙන භාවිතා කළ බවට අධ්‍යක්ෂවරු සහතික කරති.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම පනතට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරන ලද බවට ද අධ්‍යක්ෂක මණ්ඩලය සහතික කරයි.

තවද, මෙම මූල්‍ය ප්‍රකාශන සමාගම් පනත යටතේ අවශ්‍ය තොරතුරු සම්පාදනය කරනු ලබන අතර, අධ්‍යක්ෂකවරුන් තමන් සතු සමාගම පිළිබඳ දැනීම, ප්‍රධාන මෙහෙයුම් හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ නිශ්චිත තොරතුරු මත පදනම්ව තම මතය ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන එම පදනම මත පිළියෙල කර ඇත.

සමූහයේ වත්කම් සුරැකීම පිළිබඳව අධ්‍යක්ෂකවරුන් සාධාරණ පියවර ගෙන තිබෙන අතර, වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වළක්වා ගැනීමේ අරමුණින් ඒ සම්බන්ධයෙන් උචිත අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කර තිබේ. සමාගම් පනතේ අංක 57 වගන්තිය යටතේ එවැනි බෙදාහැරීමකින් පසු සමාගමට නුබුන්වත්භාවය පිළිබඳව පරීක්ෂාවෙන් සාර්ථකත්වය ලැබිය හැකි බවට ලැබී ඇති තොරතුරු මත සෑහීමකට පත් වී, සමාගම් පනතේ අංක 56(2) වගන්තිය අනුකූලව දැනට යෝජිත ලාභාංශ බෙදා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර, යෝජිත ලාභාංශ සම්බන්ධයෙන් නුබුන්වත්භාවය පිළිබඳ ප්‍රකාශනයක් සමාගමේ විගණකවරුන්ගෙන් ඉල්ලා ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ නව වැනි සංශෝධනයේ විධිවිධාන යටතේ ලංකා පොහොර සමාගම විගණනය කිරීමේ බලය හිමි විගණකාධිපති හට මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ඔවුන්ගේ මතය පිහිටුවීමට සුදුසු යැයි ඔවුන් සැලකූ පරීක්ෂාවන් භාරගැනීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවක්ම සලසනු ලැබිණි.

### අනුකූලතා වාර්තාව

සමාගමේ සේවකයන් හා රජයට අදාළව සමාගමෙන් එහි පරිපාලිත සමාගම්වලින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනය වන විට ගෙවීමට නියමිත සියලුම නීතිප්‍රකාර ගෙවීම් සිය උපරිම දැනුම අනුව ගෙවා නිමකර ඇති බව හෝ අදාළ පරිදි ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂක මණ්ඩලය සහතික වේ.



**රෝෂන වඩුගේ**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,
සීමාසහිත ලංකා පොහොර සමාගමේදී,
2017 දෙසැම්බර් 07 දිනදී ය.

# සභාපතිවරයාගේ හා මූල්‍ය කළමනාකරුගේ
# **වගකීම් පිළිබඳ ප්‍රකාශය**

2017 මාර්තු මස 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කරනු ලබනුයේ පහත දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වෙමිනි.

- ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්
- 2007 අංක 07 දරණ සමාගම් පනත
- මහාභාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති සංයුත්ත පාලනය සම්බන්ධයෙන් හොඳම පරිචයන සංග්‍රහය.

මූල්‍ය ප්‍රකාශනවල, සටහන් යටතේ විස්තර කර ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී උපයෝගී කරගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිත පරිදි හා නිරන්තරයෙන් යොදාගත් බව අපි සනාථ කරමු.

කිසිම අපගමනයකින් තොරව නිර්දිෂ්ඨ ගිණුම් ප්‍රමිතීන් යොදාගෙන තිබේ. ඉහළ මට්ටමේ විචාර බුද්ධි ගෝචර හා සංකීර්ණ වැදගත් ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් විගණන කොමිටියේ සහ අපගේ බාහිර විගණකයින්ගේ අදහස් විමසන ලදී.

වත්කම් සුරැකීමේ, වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වළක්වා ගැනීමේ හා අනාවරණය කරගැනීමේ අරමුණෙන් අභ්‍යන්තර පාලන පද්ධති හා ගිණුම් ලේඛන ස්ථාපිත කිරීමටද අප නිසි හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇත. මේවා ඉදිරියට ද ක්‍රියාත්මක වන පදනමක් මත සමාලෝචනයට, අගැයුමට හා යාවත්කරණයට ලක්වී තිබේ. සමාගමේ අභ්‍යන්තර විගණකයින් විසින් කලින්කලට කරන ලද විගණන තුළින් සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති හා පටිපාටි නින්තරයෙන්ම අනුගමනය වී තිබෙන බවට සාධාරණ සහතිකවීමක් සැලසී ඇත. එසේ වුවද, ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම් තැබීමේ පද්ධතියක් තුළින් සැලසෙන සහතිකවීම් කිරා බැලීමේදී හඳුනාගත යුතුවූ ආවේනික සීමාවන් තිබේ.

විගණනවල සඵලතාවය සමාලෝචනය කිරීමටත්, විගණනය කිරීම, අභ්‍යන්තර පාලනය හා මූල්‍ය වාර්තාකරණයේ ගැටලු ගැන සාකච්ඡා කිරීමටත් සමාගමේ විගණන කොමිටිය කලින්කලට අභ්‍යන්තර විගණකයින්ට හා බාහිර විගණකයින්ට පූර්ණ හා නිදහස් අවසරය දී තිබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති විසින් මූල්‍ය වාර්තා විගණනය කරන ලදී.



**රෝෂණ වඩුගේ**
සභාපති



**ප්‍රියන්ත සමරවීර**
මූල්‍ය කළමනාකරු
2017 දෙසැම්බර් 07

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

2017 මාර්තු 31 වැනිදායින් අවසන්වූ වසර සඳහා සීමාසහිත ලංකා

# පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපති වාර්තාව

**සීමාසහිත ලංකා පොහොර සමාගම - 2016/2017 වර්ෂය**

---

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබද සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 සමාගම පිහිටුවීම

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී ජර්මන් සමූහාණ්ඩුවේ මූල්‍ය හා තාක්ෂනික දායකත්වය සහිතව සීමාසහිත ලංකා පොහොර සමාගම ස්ථාපනය කරන ලදී. 1987 අංක 23 දරන රජයට පවරාගත් ආයතන පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුකූලව 1992 සැප්තැම්බර් 15 දින සිට බල පැවැත්වෙන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගම නමින් නැවත ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර පවත්වාගෙන යනු ලැබේ.

### 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2017 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම විගණනයේ විෂය පථය හා සීමාකිරීම් පහත දක්වා ඇති පරිදි වේ.

- තත්ත්වාගණනය කළ මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයට හා අනුකූලවන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

ප්‍රමිතයේ 63 ඡේදය ප්‍රකාරව ආයතනයේ නිශ්චිත සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන් වෙන්ව හඳුනාගත යුතු වුවද , එසේ සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

(i) ප්‍රමිතයේ 08 වන ඡේදය ප්‍රකාරව, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත වූ සහ ආයතනය කල්පිරීම තෙක් තබා ගැනීමට අපේක්ෂාවන් ඇති හා කල්පිරීම තෙක් තබාගැනීමට හැකියාව ඇති මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් තබා ගැනෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණ කළ යුතු වුවත් රු. 3,844,988,912 ක් වූ වත්කම් අනෙකුත් මූල්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වර්ගීකරණය කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 46(ආ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 532,548,539 ක්වූ පරිණතවන තෙක් තබා ගන්නා ආයෝජන සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට මැනිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 මාර්තු 31 දිනට ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම රු.12,632,701 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ඒ අනුව ගෙවිය යුතු ආදායම් බදු මුදල ද රු.3,537,156 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කිරීමේ දී මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ආදායම් තුළ ඇතුළත් රු.7,498,445 ක් වන බංගලා ගාස්තු, කුලී ආදායම්, ප්‍රවාහන මගින් ඉපයූ ආදායම් සහ පොහොර උර විකුණුම් ආදායම් යනාදිය සැළකිල්ලට නොගැනීම නිසා ආසන්න වශයෙන් බදු වටිනාකම රු.130,724 ක් අඩුවෙන් තක්සේරු කර තිබුණි.

### 2.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාගමේ සමාලෝචිත වර්ෂයට අදාල ජාතිය ගොඩනැගීමේ බදු නිදහස් පිරිවැටුම රු.253,056,860 ක් වුවත් ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව අනුව එය රු.249,439,632 ක් ලෙස දක්වා තිබීම නිසා රු.3,617,228 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වසර 10 සිට වසර 20 දක්වා කාල පරාසයක් තුළ ආයතන 4 කින් සමාගමට අයවිය යුතු රු. 87,474,958 ක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකරගෙන නොතිබුණි.

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනත | |
| (i) 131 (1) වගන්තිය | 2017 සැප්තැම්බර් 30 දින වන විටත් 2014/2015 වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 223 වගන්තිය | 2015 මැයි 05 දිනට පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වූ වෙනස්වීම් 2017 සැප්තැම්බර් 15 දින වනවිටත් සමාගම් රෙජිස්ට්‍රාර් වෙත දැනුම් දීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| 2.8.1 , 2.8.5 ,4.3.1 , 4.3.2, 5.4.8 , 7.9.2 වගන්ති | අංක හතර ගබඩාවේ වහලය අලුත්වැඩියා කිරීම සඳහා වූ වටිනාකම රු.1,992,175 ක් වූ කොන්ත්‍රාත්තුවේ ලංසු ඇගයීම සඳහා විස්තරාත්මක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකටද එළඹ නොතිබුණි. තවද ඒ වෙනුවෙන් කාර්යසාධන සුරක්ෂණයක්ද ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) අංක පීඊෆ්/පීථ්/21 හා 2002 මැයි.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 139,592,032 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 603,272,829 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.463,680,797 කින් පිරිහී තිබුණි. මූල්‍ය ආදායම රු.164,008,366 කින් වැඩිවී තිබුණ ද පරිපාලන වියදම රු.94,368,978 කින් හා දළ ලාභය රු. 866,422,146 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012/2013 වර්ෂයේ රු.126,856,580 ක් පැවති ශුද්ධ ලාභය 2015/2016 වර්ෂය අවසානයට රු.603,272,829 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එහෙත් පොහොර සහනාධාර ක්‍රමය ඉවත්කිරීමත් සමග සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය රු.139,592,032 ක් දක්වා අඩු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, දේපළ පිරියත හා උපකරණ ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2012/2013 වර්ෂයේ රු.428,414,541 ක් වූ සමාගමේ දායකත්වය 2016/2017 වර්ෂය අවසානයට රු. 476,433,758 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, ශ්‍රී ලංකා කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ ආදායම් හා ලාභදායිත්වය වැඩිකිරීම සඳහා බහුවිධ වෙළඳපොළ ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීමේ මෙහෙවර යටතේ සීමාසහිත ලංකා පොහොර සමාගම ස්ථාපනය කර තිබුණි.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වී වගාව ප්‍රධාන බෝගයක් වීම නිසා රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස 2006 වර්ෂයේ සිට 2016 පෙබරවාරි 28 දින දක්වා පොහොර මිටියක් රු.350 ක සහනදායී මිලකට ගොවියාට මිලදී ගැනීමට අවස්ථාව සලසා දී තිබුණු අතර එම සහනාධාර වැඩසටහන සඳහා අවශ්‍ය සියයට 65 ක පොහොර අවශ්‍යතාවය සීමාසහිත ලංකා පොහොර සමාගම විසින් ඉටු කර තිබුණි.

යූරියා, එම්ඕපී, ටීඑස්පී යනාදී ඍජු පොහොර වර්ග හා මිශ්‍ර පොහොරවලින් රු.බිලියන 12.197 ක් ආදායමක් ලබාගැනීමට ඉලක්ක කර තිබුණද 2016 මාර්තු 01 සිට පොහොර සහනාධාර වැඩසටහන ඉවත්කිරීම හේතුවෙන් තත්‍ය අලෙවි ආදායම රු.බිලියන 2.371 ක් විය. ඒ අනුව, ලභාකර ගත හැකිවූ අලෙවි ආදායම සියයට 19.44 ක් වූ අවම මට්ටමක පැවතුණි.

## 4.2 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පොහොර සාම්පල් පරීක්ෂා කිරීමේ අරමුණින් රු.17,617,653 ක් වටිනා රසායනාගාර උපකරණ හා වෙනත් උපකරණ වලින් සමන්විත වර්ග අඩි 3000 ක පමණ අංග සම්පූර්ණ රසායනාගාරයක් පිහිටුවා තිබුණු අතර රසායනාගාර කළමණාකාරවරියක යටතේ රසායනාගාර සහායකයින් 04 දෙනෙකු හා සාම්පල් එකතු කරන්නෙකු සේවයේ යොදවා තිබුණි. එසේ වුවද, පොහොර ලේකම් කාර්යාලය විසින් සිදුකරනු ලබන පොහොර සාම්පල් තත්ත්ව පරීක්ෂණ කිසිවක් මෙම රසායනාගාරය මගින් සිදුකර නොතිබීම නිසා මෙම වත්කම් ඌන උපයෝජිතව පැවතුණි.

## 4.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2005 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සිදුවී තිබූ පොහොර තොග ඌනතාවයන් සම්බන්ධයෙන් අලෙවි නියෝජිතවරුන් හතර දෙනෙකුට එරෙහිව එකතුව රු.268,335,298 ක වන්දි ඉල්ලා නඩු පවරා තිබුණි.

## 4.4 කළමනාකරණ ක්‍රියාකාරකම්

2015 වර්ෂයේ පොතුවිල් ප්‍රාදේශීය පොහොර ගබඩාවේ හිටපු තොග නිලධාරී විසින් සිදුකර තිබූ පොහොර මෙට්‍රික් ටොන් 281 ක තොග ඌනතාවය හේතුවෙන් සිදුවී තිබූ රු.15,269,218 ක පාඩුව අයකර ගැනීම සඳහා 2017 දෙසැම්බර් 05 වන විට නඩු පැවරීම පමණක් සිදුකර තිබුණි.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රචාරණය හා විකුණුම් ප්‍රවර්ධනය සඳහා අනුග්‍රාහක දායකත්වය ලබා දීම සහ ප්‍රජා සත්කාර සේවාවන් සඳහා රු.15,409,813 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජූලි 29 වන දින මීගමුව කුරණ ග්‍රෑන්ඩියා හෝටලයේ පවත්වා තිබුණු අලෙවි නියෝජිත හමුව හා කාබනික පොහොර නිෂ්පාදනය එළිදැක්වීමේ වැඩසටහන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ රු.5,000,000 ක්වූ වියදම් සීමාව ඉක්මවා රු.2,749,129 ක් වැයකර කර තිබුණි.

තවද වැඩසටහනේ සංවිධාන කටයුතු සිදුකර ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, ආයතන තුනකින් මිල ගණන් කැඳවා තිබුණද එම ආයතන තුනම එකම ආයතනයක් යටතේ ඇති අනුබද්ධිත ආයතන බව විගණනයේදී තහවුරු විය. එසේම උත්සව සංවිධාන කටයුතු සඳහා දරන ලද වියදමින් රු. 3,232,500 ක් එනම් සියයට 43 ක ප්‍රමාණයක් සභාපති හා ක්‍රියාකාරි අධ්‍යක්ෂගේ උපදෙස් මත වැයකර තිබුණි.

(ආ) ආයතනයේ අරමුණින් බැහැරව සමාලෝචිත වර්ෂයේදී නාට්‍ය, ප්‍රසංග, පෙරහැරවල් හා පාසල් සඳහා අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්ක වල බක්මහ උළෙල 97 ක් සඳහා රු.2,813,140 ක් ද සුහද හමු 11 ක් සඳහා රු.513,505 ක් ද දීප ව්‍යාප්ත කෘෂිකර්ම සතිය සඳහා සමාරම්භක දිනයේදී ඉටිපන්දම් 2000 ක් දල්වා කලා වැවේ පා කර යැවීම වෙනුවෙන් රු.390,000 ක් ද හා උපන් දින සුභපැතුම් සඳහා රු.480,000 ක්ද වැය කර තිබුණි.

## 4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සමාගම විසින් 2015 ජනවාරි සිට 2016 පෙබරවාරි දක්වා ආනයනය කර තිබූ පොහොර මෙට්‍රික් ටොන් 365,359 ක් කොළඹ වරායේ සිට කිලෝමීටර් 10 ක් ඇතුළත ගබඩා වෙත ප්‍රවාහනය කිරීම වෙනුවෙන් හිහ ප්‍රවාහන ගාස්තු ලෙස රු.35,848,212 ක් ගෙවීමට තීරණය කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රවාහන සේවා ලබාගැනීම සඳහා තෝරාගන්නා ලද ආයතනය සමග මෙට්‍රික් ටොන් එකක් ප්‍රවාහනය කිරීම සඳහා රු.735 ක් ගෙවීමට ගිවිසුම්ගත වී තිබූ අතර 2016 දෙසැම්බර් 31 දින දක්වා එම ගිවිසුම් දීර්ඝ කර තිබුණි. 2015 ජනවාරි 22 දින සිදු වූ ඩීසල් මිල අඩුවීම පදනම් කරගෙන 2015 අප්‍රේල් 30 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2015 මාර්තු 25 දින සිට 2016 අප්‍රේල් 29 දින දක්වා කාල සීමාව තුළ මෙට්‍රික් ටොන් එකක් ප්‍රවාහනය කිරීම සඳහා රු.629.16 ක් බැගින් ගෙවීම් කර තිබුණි.

(ii) අදාළ ප්‍රවාහන ආයතනය මෙම මිල අඩුකර ගෙවීම සම්බන්ධයෙන් 2016 පෙබවරවාරි 23 දින දක්වාම විරෝධතාවයක් ඉදිරිපත් කර නොතිබුණු අතර පළමු වරට 2016 පෙබරවාරි 24 දින මිල අඩුකිරීමට එකඟ නොවන බව සඳහන් කර රු.35,848,212 ක හිඟ මුදල ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

(iii) 2015 ජූනි 16 දින විවෘත කරන ලද ලංසුව සඳහා ඉහත ප්‍රවාහන ආයතනය පොහොර මෙට්‍රික් ටොන් එකක් ප්‍රවාහනය කිරීම සඳහා රු.635 ක මිලක් ඉදිරිපත් කර තිබීම හේතුවෙන් එම හිඟ මුදල ගෙවීමට තීරණය කිරීම පදනම් විරහිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.7 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ තාර දැමීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමග ගිවිසුමකට එළඹ බැංකු බැඳුම්කරයක් මත රු.8,859,708 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් 2014 පෙබරවාරි මාසයේ ගෙවා තිබුණි. 2014 මැයි 11 දින කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබීම හේතුවෙන් කාර්යසාධන බැඳුම්කරයේ වටිනාකම වූ රු.2,214,927 ක් අයකරගෙන තිබුණි. එහෙත් විගණන දිනය වූ 2017 ඔක්තෝබර් 30 විගණන දින වන විටත් ගෙවීම් කරන ලද අත්තිකාරම් රු.6,644,781 ක් අයකර ගැනීම සඳහා බේරුම්කරණ අධිකරණයක නඩුවක් (Arbitration) විභාග වෙමින් පැවතුණි.

(ආ) සමාගම විසින් රු.27,188,304 ක වියදමින් නුවරඑළිය බුළුඇල ක්‍රියාත්මක කර තිබූ සංචාරක බංගලාවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සංචාරක බංගලාව ඉදිකිරීමට පෙර ඉඩමේ අයිතිය තහවුරු කරගෙන නොතිබුණි.

(ii) ඉහත කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් උපදේශක සේවාවන් ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් තෝරා ගෙන තිබුණි. ඉදිකිරීම්වලට අදාළ ප්‍රමාණපත්‍ර සැකසීමේදී සම්මත මිල අනුපාතයන් යොදා නොගැනීම හේතුවෙන් සමස්ත කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු වටිනාකමෙහි රු.576,728 ක විචලනයක් නිරීක්ෂණය විය.

(iii) කොන්ත්‍රාත්තුව ආරම්භ කර දින 180 කින් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද ඉදිකිරීම් නිම කිරීම දින 136 කින් ප්‍රමාද වී තිබුණු අතර මෙම ප්‍රමාදය සඳහා රු.1,762,016 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(iv) 2017 ඔක්තෝබර් 25,26 හා 27 දිනයන්හි ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ඉදිකිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- ❖ පස් පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව අත්තිවාරම් හා කුළුණු ඉදිකිරීම, සිදුකර තිබීම හා නිසි ප්‍රමිතියකින් තොරවීම නිසා මුළු ගොඩනැගිල්ලේ සියළුම බිත්ති පසාරු වන ආකාරයට පුපුරා ගොස් තිබුණි. තවද Slab, Beam,ග්‍රැනයිට් වර්ක් ටොප් වෙන් වී යන ආකාරයට පුපුරා ගොස් තිබුණි.

- ❖ සියළුම දොරවල් ජනෙල් හා Flashing හා වඩිම්බු සපයා සවි කිරීම සඳහා රු.2,542,000 ක් වැයකර තිබුණ ද ඒවා නිසි ප්‍රමිතියකින් තොර වීම.

- ❖ වහල ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව Lump Sump ක්‍රමයට අනුව ප්‍රදානය කර තිබීම හේතුවෙන් රු.464,900 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

❖ ගෙබිම සඳහා රු.959,500 ක් වැයකර නිමකරන ලද වර්ගමීටර් 100 ක කුඹුක් ලෑලි තට්ටුවක් ගැලවී ගොස් තිබුණු අතර රු.3,081,568 ක වියදමකින් ඉදිකළ ගල්බැම්ම හා තාප්පයද නිසි ප්‍රමිතියට ඉදිකර නොතිබීම නිසා බොහෝ ස්ථාන වලින් පුපුරා වෙන් වී ගොස් තිබුණි.

(v) ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිමකර වසරකුත් මාස 04 ක කාලයක් ප්‍රමාද වී එය භාවිතයට ගෙන තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ ප්‍රාථමික මට්ටමේ (Skilled) අනුමත කාර්ය මණ්ඩලය 163 දෙනෙකු වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 184 දෙනෙකු වූයෙන් නිලධාරීන් 21 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි.

(ආ) 2016 ජුනි 01 දින කොන්ත්‍රාත් පදනම යටතේ ගබඩා සහායකයින් ලෙස නිලධාරීන් 5 දෙනෙකු සේවයට බඳවාගෙන තිබූ අතර එයින් නිලධාරීන් හතර දෙනෙකු අනුරාධපුර දිස්ත්‍රික්කයේ අමාත්‍ය කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන සෝයා ව්‍යාපෘතියක හා එක් නිලධාරියෙකු සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක ලෙස සේවයේ යොදවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් ඔවුන්ගේ වැටුප් වෙනුවෙන් පිළිවෙලින් රු.425,333 ක් හා රු.350,578 ක් වැයකර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2015/2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2017 ඔක්තෝබර් 31 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයිතම 113 ක අයවැයගත හා තත්‍ය ආදායම් සහ වියදම් අතර සියයට 99 සිට සියයට 281 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කාර්ය මණ්ඩල පරිපාලනය | සේවක බඳවාගැනීම් විධිමත් පරිදි සිදුනොකිරීම. |
| (ආ) කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීම. |
| (ඇ) වත්කම් පාලනය | ඌන උපයෝජිතව පවතින වත්කම් උපයෝජනය කිරීමට කටයුතු නොකිරීම. |
| (ඈ) අයවැය පාලනය | අයවැය ලේඛනය තාත්විකව පිළියෙල නොකිරීම. |
| (ඉ) පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම | සමාගම් පනත අනුව හා ගිණුම් කටයුතු වෙනුවෙන් පවත්වාගත යුතු පොත්පත් හා ලේඛන විධිමත්ව පවත්වා නොතිබීම. |

## සී/ස ලංකා පොහොර සමාගම
### 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| අයභාරය | 3 | 2,350,637,985 | 4,242,769,733 |
| විකුණුම් පිරිවැය | 4 | (2,119,612,208) | (3,145,321,810) |
| **දළ ලාභය** | | **231,025,777** | **1,097,447,923** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 5 | 29,096,825 | 122,926,594 |
| පරිපාලන වියදම් | 6 | (445,490,134) | (539,859,112) |
| බෙදාහැරීමේ වියදම් | 7 | (20,490,594) | (11,712,957) |
| **මෙහෙයුම් ලාභය** | | **(205,858,126)** | **668,802,448** |
| මූල්‍ය ආදායම | 8 | 333,536,542 | 169,528,176 |
| මූල්‍ය  වියදම් | 8 | 126,125 | (1,726,619) |
| **බදු පෙර ලාභය** | | **127,804,541** | **836,604,005** |
| ආදායම් බදු | 9 | 11,787,491 | (233,331,176) |
| **වර්ෂය සඳහා ලාභය** | | **139,592,032** | **603,272,829** |
| | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| ප්‍රත්‍යාගණනය කරන ලද දේපල පිරියත හා උපකරණ මත අතිරික්තය | | 847,136,318 | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත මත විලම්භිත බදු ප්‍රතිලාභ | | (173,231,211) | - |
| **සමස්ත විස්තීරණ ආදායම්** | | **673,905,107** | **-** |
| **වර්ෂය සඳහා සමස්ත විස්තීරණ ආදායම** | | **813,497,139** | **603,272,829** |
| | | | |
| කොටසක මූලික ඉපැයුම | 10.1 | 2.78 | 12.01 |
| ලාභාංශ ඉපැයුම | 10.2 | 0.83 | 3.60 |

වරහන් තුළ අගයන්වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.
අංක 05 සිට 24 දක්වා  පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුය.

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 11 | 2,683,237,393 | 1,838,655,988 |
| නොනිමි වැඩ | 12 | 21,960,737 | 32,152,294 |
| අස්පෘශ වත්කම් | 13 | - | 79,667 |
| **මුලු ජංගම නොවන වත්කම්** | | **2,705,198,130** | **1,870,887,948** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 14 | 2,043,336,119 | 251,765,999 |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 15 | 26,288,316,003 | 30,803,548,992 |
| සේවක ණය හා අත්තිකාරම් | 16 | 45,206,196 | 46,209,130 |
| කල්පිරීම සඳහා පවත්වාගෙන යන ආයෝජන | 17 | 532,548,539 | 554,361,934 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 18 | 3,970,073,287 | 3,059,582,808 |
| මුදල් හා මුදල් සමාන | 19 | 24,001,404 | 17,002,525 |
| **මුලු ජංගම වත්කම්** | | **32,903,481,549** | **34,732,471,389** |
| **මුලු වත්කම්** | | **35,608,679,679** | **36,603,359,337** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රත්‍යගණන සංචිත | 20 | 502,456,080 | 502,456,080 |
| රඳවා ගත් ලාභ | 21 | 2,506,976,187 | 1,833,071,080 |
| **මුලු හිමිකම්** | | 2,494,732,936 | 2,392,840,203 |
| **ජංගම නොවන වගකීම්** | | **5,504,165,203** | **4,728,367,363** |
| සේවක පාරිතෝෂිත බැඳීම | 22 | 66,893,460 | 61,731,050 |
| රාජ්‍ය ප්‍රදාන | 23 | - | 2,889,117 |
| විලම්භිත බදු | 24 | 155,078,112 | 40,928,542 |
| **මුලු ජංගම නොවන වගකීම්** | | **221,971,572** | **105,548,709** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 25 | 1,400,959,514 | 3,799,678,633 |
| ගෙවිය යුතු ණය | 26 | 28,294,744,826 | 27,460,439,996 |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | 27 | 138,241,125 | 142,371,790 |
| වර්තමාන බදු වගකීම් | 28 | 8,266,616 | 180,984,083 |
| උපචිත වියදම් හා වෙන්කිරීම් | 29 | 39,571,679 | 164,200,505 |
| බැංකු අයිරා | 19 | 759,143 | 21,768,258 |
| **මුලු ජංගම වගකීම්** | | **29,882,542,904** | **31,769,443,265** |
| **මුලු හිමිකම් හා වගකීම්** | | **35,608,679,679** | **36,603,359,337** |
| | | | |
| | | **109.55** | **94.11** |

සමාගමෙහි මෙම මූල්‍ය පකාශන කට්ටලය 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුරූපව පිළියෙල කර ඇති බවට මම සහතික කරමි.

මූල්‍ය කළමනාකරු

අධ්‍යක්ෂක මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවට අනුමත කර අත්සන් කළේ.

සභාපති
07.12.2017
කොළඹ

අධ්‍යක්ෂ

වරහන් තුළ අගයන්වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.
අංක 87 සිට 110 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුය.

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාත්‍යාගණන සංචිත | රඳවාගත් ලාභ | එකතුව |
|---|---|---|---|---|
| **2015 අප්‍රේල් 01 දිනට ශේෂය** | **502,456,080** | **1,833,071,080** | **1,869,914,195** | **4,205,441,355** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 603,272,829 | 603,272,829 |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | - | 35,457,620 | 35,457,620 |
| ප්‍රාත්‍යගණන වත්කම් අපහරණය | - | | (115,804,442) | (115,804,442) |
| **2016 මාර්තු 31 දිනට ශේෂය** | **502,456,080** | **1,833,071,080** | **2,392,840,203** | **4,728,367,363** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 139,592,032 | 139,592,032 |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | - | (7,699,299) | (7,699,299) |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | 673,905,107 | - | 673,905,107 |
| ලාභාංශ වෙන් කිරීම | - | - | (30,000,000) | (30,000,000) |
| **2017 මාර්තු 31 දිනට ශේෂය** | **502,456,080** | **2,506,976,187** | **2,494,732,936** | **5,504,165,203** |

වරහන් තළ අගයන්වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.
අංක 87 සිට 110 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුය.

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

| | | 2017 | 2016 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | | |
| බදු පෙර ලාභය | | 127,804,541 | 836,604,005 |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් | | 50,069,487 | 29,148,977 |
| දේපල පිරියත හා උපකරණ නවීකරණය සඳහා වෙන්කිරීම | | 79,667 | 107,750 |
| රාජ්‍ය ප්‍රධාන ක්‍රමක්ෂය | | (2,889,117) | (5,643,699) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමේ ලාභය අලාභය | | (601,448) | (6,527,192) |
| වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණය | | - | 992 |
| වර්ෂය සඳහා සේවක පාර්තෝෂික වෙන්කිරීම් | | 11,001,717 | 17,591,797 |
| පොලී ආදායම | | (333,536,542) | (169,528,176) |
| පොලී වියදම | | 126,125 | 1,726,619 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | | (7,699,299) | 35,457,620 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය** | | **(155,644,869)** | **738,963,570** |
| තොගය | | (1,791,570,120) | 243,625,115 |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | | 4,515,232,989 | 8,874,174,868 |
| සේවක ණය හා අත්තිකාරම් | | 1,002,934 | (12,347,257) |
| ජංගම වගකීම් | | (2,428,719,124) | (4,903,922,705) |
| ගෙවිය යුතු ණය | | (4,130,665) | (21,968,213) |
| වර්තමාන බදු වගකීම් | | (124,628,826) | 44,015,170 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | **11,542,320** | **4,962,540,547** |
| ගෙවූ සේවක පාර්තෝෂිත | | (5,839,307) | (6,049,880) |
| ගෙවූ පොලී | | (126,125) | (1,726,619) |
| ගෙවූ බදු | | (220,011,618) | (95,290,494) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ ප්‍රවාහය** | | **(214,434,731)** | **4,859,473,554** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ප්‍රකාශය** | | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම් | | (14,082,872) | (5,698,774) |
| අස්පෘෂ්‍ය වත්කම් අත්පත්කර ගැනීම් | | - | (72,000) |
| නොනිමි වැඩ | | (23,276,640) | (3,629,474) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ මුදල් | | 637,948 | 6,527,191 |
| භාණ්ඩාගාර බිල්පත්වල ශුද්ධ ආයෝජන විකිණීම් | | (2,162,425,736) | (1,479,404,640) |
| අනෙකුත් මූල්‍ය වත්කම් ශුද්ධ ආයෝජන | | 1,317,159,252 | 240,000,000 |
| ලැබුණු පොලී | | 290,125,942 | 155,577,685 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(591,862,107)** | **(1,086,700,012)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂය තුළ ණය ගැනුම් | | 11,474,044,093 | 14,023,172,748 |
| වර්ෂය තුළ ණය පියවීම් | | (10,639,739,262) | (17,867,058,020) |
| මූල්‍ය කියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | **834,304,831** | **(3,843,885,272)** |
| **මුදල් හා මුදල් සමාන දෑ වර්ෂය තුළ සිදුවූ ශුද්ධ වෙනස් වීම්** | | **28,007,993** | **(71,136,605)** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | (4,765,733) | 66,370,872 |
| | | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | සටහන් 19 | **23,242,261** | **(4,765,733)** |

වරහන් තුළ අගයන්වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.
අංක 87 සිට 110 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුය.

## 01. ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

සීමාසහිත ලංකා පොහොර සමාගම ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද නිත්‍යවාසි හා සීමිත වගකීම් සහිත සියලුම අයිතීන් ශ්‍රී ලංකා රජය සතු සමාගමකි.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

සමාගම ප්‍රධාන ක්‍රියාකාරකම ලෙස වී, තේ, පොල්, රබර් සහ අනෙකුත් අස්වනු සඳහා අවශ්‍ය පොහොර ආනයනය, මිශ්‍ර කිරීම හා අලෙවිකරනය සිදු කරයි.

### 1.3 මූල්‍ය වර්ෂය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාල සීමාව මාර්තු 31 දිනෙන් අවසන් වේ.

### 1.4 ලියාපදිංචි කාර්යාලය

සමාගමේ ලියාපදිංචි කාර්යාලය බිෂොප්හීල්, හුණුපිටිය, වත්තල, පිහිටා ඇත.

### 1.5 සේවක සංඛ්‍යාව.

2017 මාර්තු 31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 408 කි. (2016-420)

### 1.6 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කිරීම.

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වර්ෂ 2017 ක් වූ දෙසැම්බර් 31 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවෙන් අනුමැතිය ලබා දී ඇත.

## 2. සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. ඓතිහාසික පිරිවැය සංකල්පය මත පදනම්ව පිළියෙල කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් වෙනස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට නිශ්චිත හා තීරණාත්මක වන ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීමට සිදුවේ. එසේම ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී කළමනාකරණයේ මතයන් යොදා ගැනීමද අවශ්‍ය වේ. ඉහළ පරාසයක විමසුමක් හෝ සංකීර්ණතාවයක් හෝ නිගමනයන් ඇස්මේන්තු හා සම්බන්ධ වන විශේෂිත අනාවරණයන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සටහන් 2.26 දක්වා ඇත.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පහත සඳහන් අයිතමයන් හැර ඓතිහාසික පිරිවැය පදනම මත සමාගමේ මූල්‍ය ප්‍රකාශය සකස් කර ඇත.

- අර්ථ ප්‍රතිලාභ වගකීමක් වර්තමාන වටිනාකමක් ලෙස හඳුනා ගැනේ.
- සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලද දිනය වන සාධාරණ අගය වන තක්සේරු ප්‍රමාණයක් දී අත්පත් කර ගැනීම හා ඊට පසුව කරන අවස්ථාවේ දී පිරිවැය මනිනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය ප්‍රතිපත්ති සටහන් සමන්විත වන්නේ පවත්නා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය විස්තීර්ණ අදායම් ප්‍රකාශය හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන් පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූල වන පරිදිය.

### 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්

වෙනත් ආකාරයට සඳහන් කර නොමැති අවස්ථාවලදී සමාගම විසින් පෙර මූල්‍ය වර්ෂවලදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒ ආකාරයෙන්ම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මුල් වරට භාවිතා කළ මෙම වර්ෂයට අදාළ කරගෙන ඇත. වඩා හොඳ ඉදිරිපත් කිරීමක් හා වර්තමාන වර්ෂය සමඟ සැසඳීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ මූල්‍ය වාර්තා වෙනස් කර ඇත.

### 2.3 විදේශ මුදල් ගනුදෙනු

#### 2.3.1 මෙහෙයුම් හා ඉදිරිපත් කරන මුදල් ඒකකයන්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සමාගම මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ප්‍රධාන මුදල් ඒකකය වේ.

#### 2.3.2 ගනුදෙනු හා ශේෂයන්

තත්කාලීනව බලපවත්නා වූ අනුපාතිකය අනුව සියලුම විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. විදේශ වලංගු මුදල්වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වර්ෂය අවසානයේදී පැවැති විදේශ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ. ඒ අනුව ලබන්නා වූ ලාභය හෝ අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කෙරේ. මූල්‍ය නොවන වත්කම් හා වගකීම් ඓතිහාසික පිරිවැය මත මනිනු ලබන අතර මුල් ගනුදෙනුව සිදුකළ දිනයේදී පැවැති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ.

#### 2.4.1 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිරිවැය ලෙස මූලික වශයෙන් ගැනුම් පිරිවැය සහ වැඩ කළ හැකි හා භාවිතා කළ හැකි තැනට, තත්ත්වයට පත් කිරීම සඳහා දරන වියදම්වල එකතුවෙන් වාර්තා කර ඇත.

සමාගමේ මූල්‍ය තත්වයෙහි දේපල, පිරියත හා උපකරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව වාර්තා කර ඇත. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් දේපල, පිරියත හා උපකරණ පිරිවැය අගයෙන් වාර්තා කර ඇත. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් දේපල, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හෝ සමුච්චිත හානිකරණය පිරිවැයෙන් අඩුකොට වාර්තා කර ඇත. 2010 වර්ෂයේ සමාගම ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යගණන අගය ගණනය කොට වත්කමේ සාධාරණ අගයේ සිදුවූ වෙනස්කම් ස්කන්ධ ප්‍රකාශනයට හඳුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ අලුත් වැඩියාවේදී හා නඩත්තු කිරීමේදී මුල් තක්සේරු ක්‍රියාකාරී ප්‍රමිතියේදී බලාපොරොත්තු වූ ඉදිරි ආර්ථික ප්‍රතිලාභ නැවත ඇති කිරීමට දරන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන අතර අනෙකුත් වියදම් අදාළ වර්ෂයේදී විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි.

ඉඩම් හැර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමයට පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත වත්කමේ ප්‍රයෝජනවත් ජීවකාලය තුළදී පහත අනුපාතයන්ට ක්ෂය කරනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 40 |
| යන්ත්‍රාගාර හා උපකරණ | අවුරුදු 05 - 10 දක්වා |
| මෝටර් රථ | අවුරුදු 05 |
| පාපැදි | අවුරුදු 03 |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | අවුරුදු 03 |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 03 |
| වැඩ පොළ මෙවලම් | අවුරුදු 05 |
| රසායනාගාර උපකරණ | අවුරුදු 03 |

| | |
|---|---|
| වෙනත් උපකරණ | අවුරුදු 03 |
| භෝජනාගාර උපකරණ | අවුරුදු 05 |
| පරිඝනක උපාංග | අවුරුදු 03 |

වත්කමක ධාරණ අගය එම වත්කමෙන් නැවත අයකරගත හැකි අගයට වඩා අඩුවන විට ධාරණ අගය නැවත අයකරගත හැකි අගය දක්වා ක්ෂය කරනු ලබයි.

### 2.4.2 අස්පෘශ්‍යය වත්කම්

අත්පත්කර ගන්නා ලද පරිඝනක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති අත්පත් කර ගැනීමට හා වැඩකර ගත හැකි තත්ත්වයකට පත් කිරීමට දරනු ලබන වියදම් ප්‍රාග්ධනිත කර ඇත. අස්පෘශ්‍යය වත්කම් ඒවායේ පිරිවැය අගයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හෝ සමුච්චිත හානිකරණයන් අඩුකොට වාර්තා කර ඇත. මෙම පිරිවැය පහත පරිදි වත්කමේ ඵලදායි ජීවිතකාලය පුරා ක්‍රමක් ක්ෂය කරයි.
පරිඝනක මෘදුකාංග අවුරුදු 03
පරිඝනක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති නඩත්තු කිරීම සඳහා දරන වියදම් වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 2.4.3 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම්, හානිකරණය වීමේ සංඥාවක් ඇත්දැයි සමාගම තක්සේරු කරයි. යම් වත්කමක් සඳහා එවැනි සංඥාවක් ඇත්නම් සමාගම වත්කමෙහි නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. එකිනෙක වත්කමෙහි නැවත අයකරගත හැකි අගය ගණනය කිරීම අපහසු අවස්ථාවල සමාගම මුදල් උත්පාදන ඒකකයන් වල නැවත අයකල හැකි අගයන් ගණනය කරනු ලබයි. වත්කමක නැවත අයකර ගත හැකි අගය එහි සාධාරණ අගයට හෝ වත්කම භාවිතයේ ආර්ථික ප්‍රතිලාභයන්ට වඩා අඩුවන විට වත්කම නැවත අයකරගත හැකි අගය දක්වා ක්ෂය කරනු ලබයි.

වත්කමේ නැවත අයකරගත හැකි අගයට වඩා වත්කමේ සාධාරණ අගය වැඩිවන විට එම වත්කම නැවත අගය කළ හැකි වටිනාකම දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට කපා හරිනු ලබයි.

## 2.5 මූල්‍ය වත්කම්

### 2.5.1 සමාගම මූලික හඳුනාගැනීමේදී තම මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරයි.

අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්
ආ) ණය සහ ලැබිය යුතු දෑ
(අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

සමාගම විසින් කල්පිරීම තෙක් රඳවා තබා ගැනීමේ අභිප්‍රායෙන් හා හැකියාවෙන් යුක්තව තබාගෙන ඇති නිශ්චිත හෝ ස්ථිර වු ගෙවුම්වලින් සමන්විත ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් මේ නමින් හැඳින්වේ. කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම් ජංගම වත්කම් යටතේ වර්ග කර ඇත.

(ආ) ණය හා ලැබිය යුතු දෑ

ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් වන ණය හා ලැබිය යුතු දෑ උපලබ්ධි වීමට නියමිත තක්සේරු කළ වටිනාකම මත පදනම්ව වාර්තා කර ඇත. ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති වාර්තා කරන දිනයේ සිට මාස 12 කට පසු උපලබ්ධි වීමට නියමිත ණය සහ ලැබිය යුතු දෑ හැර අනෙකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගමේ ණය හා ලැබිය යුතු දෑ, ලැබිය යුතු සහනාධාර, වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රතිමිලදී ගන්නා රාජ්‍ය බැඳුම්කර, ස්ථාවර තැන්පතු, පෙර ගෙවීම්, අත්තිකාරම්, තැන්පතු, සේවක ණය සහ වාර්තාකරණ දිනට මුදල් හා මුදල් සමාන දෑ වලින් සමන්විත වේ.

### 2.5.2 හඳුනාගැනීම හා මූලික මැනීම්

සමාගමේ ණය හා ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා ඇති වූ දිනට මූලික වශයෙන් හඳුනාගනු ලැබේ. අනෙකුත් මූල්‍ය වත්කම් මුල්වරට හඳුනාගැනීමේදී වෙළදාම් සිදුවූ දිනට එනම්, සමාගම මූල්‍ය උපකරණයන්හි ගිවිසුම්ගත බැඳීමේ පාර්ශවයන් බවට පත් වූ දිනට හඳුනාගත යුතු මූල්‍ය වත්කමක් වශයෙන් අගය කරනුයේ සාධාරණ අගයට ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය යන වර්ගීකරණයට අයත් නොවන්නා වූ අයිතමයන්ට අදාළ අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට අදාළ කරගත හැකි ගනුදෙනුවල පිරිවැයට එකතු කළ අගයයි. සමාගම විසින් එහි මූල්‍ය වත්කම් හඳුනා ගැනීම නවතා දමනුයේ මූල්‍ය වත්කම් තුළින් මුදල් ලැබීමට ඇති ගිවිසුම්ගත බැඳීම කල්පිරිමකදී හෝ එම මූල්‍ය වත්කම්වලට අදාළ සියලු අවදානම් හා ප්‍රතිලාභයන් වෙනත් පාර්ශවයක් වෙත පරිවත්‍ය කරන අවස්ථාවකදී ය.

### 2.5.3 පසුකාලීන මැනීම්

(අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම් සඵල පොලී අනුපාතිකය භාවිතා කර ක්‍රමක් ක්ෂය වූ පිරිවැයෙන් හානිකරණයත් අඩුකළ පසු අගයට අගය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ වත්කම් හෝ අධිභාරයන් සහ ගනුදෙනු පිරිවැය මූල්‍ය වත්කමේ ක්‍රමක් ක්ෂය පිරිවැය ගණනයේදී සලකා බලයි.

(ආ) ණය හා ලැබිය යුතු දෑ

මුල් වරට අගය කිරීමෙන් පසුව ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ සඵල පොලී අනුපාතිකය භාවිතා කර ක්‍රමක් ක්ෂය වූ පිරිවැයෙන් හානිකරණයන් අඩුකළ පසු අගයට වාර්තා කරයි.

### 2.5.4 මූල්‍ය වත්කම් හානිකරණය

**ක්‍රමක් ක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලබන වත්කම්**

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදී තම මූල්‍ය වත්කම් හානිකරණයට ලක්වී ඇති බවට සාක්ෂි තිබේද නැද්ද යන්න පිළිබඳව විමසා බැලිය යුතුය. මූල්‍ය වත්කමක් හානිකරණය කිරීම සහ එම හානිකරණ අලාභය දැරිය යුත්තේ මුල්වරට හඳුනාගැනිමෙන් පසුව ඇති වූ එක් හේතුවක් (සිදුවීමක්) හෝ හේතු කිහිපයක් නිසා වූ බවට සාක්ෂි ඇත්නම් පමණක් හා එම අලාභ සිදුවීමෙන් අනාගත මූලය ප්‍රවාහයන් මත ඇති වන්නා වූ බලපෑම විශ්වාසනීය ලෙස ආගණනය කළ හැකිනම් පමණි. ක්‍රමක් ක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන ණය සහ ලැබිය යුතු දෑ වල හානිකරණ අලාභ හඳුනාගත යුත්තේ වත්කම් පවත්වාගෙන යන අගය හා එම වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් සඵලදායි පොලී අනුපාතය මත වට්ටම් කළ පසු අතර ඇති වෙනසයි. (අනාගත මුදල් ප්‍රවාහයන් සැලකීමේදී දරනු නොලබන අනාගත අපේක්ෂිත අලාභ ඉවත් කරයි.) වත්කමේ පවත්වාගෙන යනු ලබන අගය හා කපා හල යුතු අගය අතර අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා හඳුනාගත යුතුය. යම් හෙයකින් පසු කාල පරිච්ඡේදයේදී හානිකරණ අලාභය අඩු වුවහොත් එම අඩුවීම හානිකරණය හඳුනා ගැනීමෙන් පසු ඇති වූ කිසියම් සිදුවීමකට අදාල කළ හැකි නම් පමණක් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ප්‍රත්‍යාවර්ථනය කළ හැකිය.

### 2.6 තොගය

තොගය (සෘජු හා මිශ්‍ර පොහොර) පිරිවැය අගයෙන් සහනාධාර අඩු කර දක්වා ඇත. පිරිවැය ගණනය කරනු ලබන්නේ පළමු ලබාගත් තොග පළමු බැහැර කිරීමේ ක්‍රමයටය. මිශ්‍ර පොහොර තොග පිරිවැය අමුද්‍රව්‍ය, සෘජු වේතන, අනෙකුත් සෘජු පිරිවැයන් හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයන්ගෙන් සමන්විත වේ. දේශීයව මිලදී ගත් පොහොර පිරිවැයට වාර්තා කර ඇත. සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට බලාපොරොත්තු

වන මිලෙන් එයට අදාළ වියදම් අඩුකිරීමෙන් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර තිබේ. පාරිභෝගික ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ඊට අදාළ පිරිවැය යටතේ දක්වා ඇත.

**2.7 වෙළෙඳ ලැබිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුළදී භාණ්ඩ විකිණීමෙන් ලැබිය යුතු මුදල් වෙළෙඳ ලැබිය යුතු දෑ වේ. ණය එකතු කිරීම සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය තුළදී බලාපොරොත්තු වන අතර, ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. පළමු හඳුනාගැනීමේදී වෙළෙඳ ලැබිය යුතු ඉන්වොයිස් වටිනාකම වන සාධාරණ අගයට හඳුනාගැනේ. පසුව ඉන්වොයිස් අගයෙන් හානිකරණයන් අඩුකිරීමෙන් හඳුනාගැනේ.

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණයට ලක් වී තිබේද නැද්ද යන්න පිළිබඳ විමසා බලයි. සමාගමේ ණය එකතු කිරීම පිළිබඳ අතීත පලපුරුද්ද, ගෙවීම් ප්‍රමාණ වීමේ දින ගණන උපරිමය දින 90 ට වැඩිවීම යනාදිය හානිකරණය ගණනයේදී සලකා බලයි. වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය හා එම හානිකරණ අලාභය දැරිය යුත්තේ එම හානිකරණය පිළිබඳ සාක්ෂි ඇත්නම් පමණි. සියලුම වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා තනි තනිව සලකා බලයි.

වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය නිර්ණය කිරීමේ පදනම හා ආකෘතිය පහත පරිදි වේ. තනි තනිව ඇගයීමේ ක්‍රමය: හානිකරණය ගණනය කිරීම සඳහා පහත දැක්වෙන වෙළෙඳ ලැබිය යුතු දෑ තනි තනිව ආගණනය කර ඇත.

i) විවිධ සේවා සමූපකාර සමිති
ii) ගොවිජන සේවා මධ්‍යස්ථාන
iii) බලයලත් නියෝජිතයන්
iv) රාජ්‍ය හා ආයතන හා දෙපාර්තමේන්තු

**2.8 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, අනෙකුත් මාස 03 අඩු කාලයකින් කල් පිරෙන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස වර්ගීකරණය කෙරේ.

**2.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා රජයට නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් හිමිකම ලෙස වර්ගීකරණය කරයි.

**2.10 මූල්‍ය වත්කම්**

සමාගම මූල්‍ය වගකීම් අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගමේ අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස ණය, වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරා ඇතුළත් වේ. අනෙකුත් මූල්‍ය වගකීම් මූලිකවම සෘජුව වෙන්කර හැකි අනෙකුත් වියදම් සමග සාධාරණ අගයට හඳුනා ගනී. පසුව සඵල පොලී අනුපාතිකය භාවිතා කරමින් හානිකරණ පිරිවැය මත පදනම්ව හඳුනාගනී. සමාගම ගිවිසුම්ප්‍රකාර බැඳීම් ඉවත් කිරීමේදී, අවලංගු කිරීමකදී හෝ කල් ඉකුත්වීමකදී මූල්‍ය වගකීම් හඳුනාගැනීම නවතා දමයි.

**2.11 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම නිසා ඒවාට ගෙවීමට ඇති වූ බැඳියාව වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කරයි. ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලින් පැන නැඟී වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූලිකව ඒවායේ ගනුදෙනු වටිනාකම වන සාධාරණ අගයට හඳුනා ගනි. පසුව මුදලෙහි කාලීන වටිනාකම වැදගත් නොවන විට සහ කෙටිකාලීනව ගෙවීමට බලාපොරොත්තු වන විට ඒවායේ නියමිත ඉන්වොයිස් වටිනාකමට හඳුනා ගනි.

**2.12 ණය ගැනුම්**

ණය ගැනුම් මූලිකව වාර්තා කළ ශුද්ධ ගනුදෙනු වටිනාකමට, සාධාරණ අගයට හඳුනා ගනී. පසුව සඵල පොලී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක් ක්ෂය වු වටිනාකමට හඳුනා ගනී.

**2.13 ණය ගැනුම් පිරිවැය**

වර්ෂය තළ ණය ගැනුම් පිරිවැය විස්තීර්ණ අදායම් ප්‍රකාශයෙන් ගලපා ඇත.

**2.14 රාජ්‍ය ප්‍රදාන**

රාජ්‍ය ප්‍රදානයන් ලැබෙන බවට සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබීමත්, සමාගම විසින් අදාළ කොන්දේසි සපුරන්නේ නම් රාජ්‍ය ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට හඳුනා ගනී. ආනයන වියදම් පියවීම සඳහා ලැබෙන සහනාධාරවලට අදාළ වියදම් එම වියදම දරනු ලබන්නා වු කාල පරිච්ඡේදයේදී විස්තීරණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ. දැනටමත් දරා ඇති ආනයන වියදම් සඳහා ලැබෙන සහනාධාර ඒවා ලැබීම පිළිබඳ සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබේ නම් ලැබිය යුතු සහනාධාර ලෙස හඳුනා ගැනේ. දේපල, පිරියත හා උපකරණ සඳහා ලැබුනු රාජ්‍ය ප්‍රදාන විලම්භිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම්වලට ඇතුළත් කර ඇත. ඒවා වත්කමේ අපේක්ෂිත ආයු කාලය තුළ සරළ මාර්ග ක්‍රමයට විස්තීරණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගනී.

**2.15 වර්තමාන හා විලම්භිත බදු**

කාල පරිච්ඡේදය සඳහා අදාළ බදු වියදම වර්තමාන බදු වියදම හා විලම්භිත බදු වියදමෙන් සමන්විත වේ. බදු වියදම විස්තීරණ අදායම් ප්‍රකාශයට හඳුනාගනු ලබන්නේ ඒවා අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අයිතමයන් ලෙස හඳුනාගත් ප්‍රමාණය දක්වා පමණි.

වර්තමාන වසර සඳහා ආදායම් බදු වගකීම දේශීය ආදායම් පනතේ විධි විධානයන්ට අනුකූලව ආදායම් බදු අධිකාරිය වෙත ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණය දක්වා හඳුනාගනු ලැබේ.

මූල්‍ය වාර්තාවල වත්කම් හා වගකිම්වල ධාරණ අගයේ සහ බදු පදනම අනුව වත්කම් හා වගකීම්වල ධාරණ අගයේ ඇති වෙනස්වීම් මත විලම්භිත ආදායම් බදු හඳුනාග ැනේ. බදු සඳහා හඳුනාගත් සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්භිත ආදායම් බදු වගකීම හඳුන්වාදී ඇත. එසේ නොවන්නේ ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවකදී හා ගනුදෙනුව කරන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බද්දට යටත් ලාභයට හෝ පාඩුවට බලනොපාන මූලිකව වත්කමක් හෝ වගකීමක් හෝ විලම්භිත බදු වගකීම සිදුවන අවස්ථාවේදී ය. වත්කමේ උපලබ්ධි වූ විට හෝ වගකීමෙන් නිදහස් වූ විට ඒකී වසර සඳහා බලපැවැත්වෙන්නා වූ බදු අනුපාතය පදනම් කරගෙන හා ප්‍රඥප්ති කළ හෝ පසුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට බලපැවැත්වෙන බදු නීති මත විලම්භිත ආදායම් බදු වගකීම හෝ වත්කම හඳුනා ගනී.

ප්‍රවර්ථන ආදායම් බදු වගකීම්වලට එරෙහිව ප්‍රවර්ථන බදු වත්කම් හිලව් කිරීමට නෛතිකව පැනවු අයිතියක් ඇත්නම්ද, විලම්භිත ආදායම් බදු එකම අඩු බදු අයකරන ඒකකයට හෝ එකම බදු අධිකාරියකට සම්බන්ධ නම්ද විලම්භිත ආදායම් බදු වත්කම් හා විලම්භිත ආදායම් බදු වගකීම් හිලව් කරනු ලැබේ.

## 2.16 සේවක ප්‍රතිලාභ

සමාගම අර්ථ ප්‍රතිලාභය හා නිර්වචනය කරන ලද දායක සැලසුම් දෙකම ඇත.

(අ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමක් වන අතර, සමාගම විසින් ස්ථාවර දායකත්වයක් වෙනත් ආයතනයකට ඒ වෙනුවෙන් සපයයි. සමාගමට මෙම දායකත්වයන් සම්බන්ධයෙන් හා ඒවා ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් නීතිමය හෝ වෙනත් ආකාරයක බැඳීමක් නොමැත.

සමාගම සේවක භාරකාර අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් පිළිවෙළින් 15% හා 3% ප්‍රමාණයන් සේවක දළ වැටුපට අනුව ගෙවයි.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායකත්ව සැලසුම් ගණයට අයත් නොවන මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනට මූල්‍ය ප්‍රකාශයන් තුළ නිශ්චිත ප්‍රතිලාභ සම්බන්ධයෙන් දක්වා ඇති වගකීම් හඳුනාගෙන ඇත්තේ එම නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීමෙහි වර්තමාන අගයයි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම සුදුසුකම්ලත් ජීවගණනවරයෙකු ලවා පුරෝකතනය කරන ලද ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් තක්සේරු කර ඇත. ජීව ගණන තක්සේරු ක්‍රමය තුළ වට්ටම් අනුපාතිකය සම්බන්ධව සිදුකරන උපකල්පනයන් සේවක වැටුප් වර්ධක අනුපාතිකයන් හා සේවකයන්ගේ ඉතිරි සේවා කාලය යන දෑ අන්තර්ගත වේ. මෙම සැලසුමෙහි පවත්නා දිගු කාලීන ස්වභාවය හේතු කොටගෙන තක්සේරු අගයන් තුළ සැලකිය යුතු අවිනිශ්චිත තාවයන් අන්තර්ගත වන අතර, ඒවා වාර්තා වූ කාල පරිච්ඡේදයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ.

එම වගකීම බාහිරව ආයෝජනය කර නොමැත.

(ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

සේවකයන් විසින් සපයනු ලබන සේවයට ගෙවීමට බලාපොරොත්තු වන වටිනාකම වට්ටම් නොකර වාර්තා කරයි.

## 2.17 වෙන් කිරීම් හා අසම්භාව්‍ය වගකීම්

පසුගිය සිද්ධීන් නිසා ආර්ථික ප්‍රතිලාභ ගලායාමක් හා එම ප්‍රමාණය ගැන සෑහීමට පත් විය හැකි ආකාරයෙන් ගණනය කළ හැකි විට එම වගකීම පියවීම සඳහා නීතිමය හෝ වෙනත් ආකාරයක බැඳීමක් ඇත්නම් ඒවා මෙහෙයුම් වියදම් ලෙස හඳුනා ගැනේ. වාර්තාකරණ දිනයේදී වෙන් කිරීමක් පියවීම සඳහා ඇති වර්තමාන බැඳීම නිවැරදිව සෑහීමට පත්විය සාධක මත පදනම්ව අවදානම හා අසම්භාව්‍යතාවයන් ඇතළත්ව වෙන්කිරීම හඳුනා ගැනේ.

සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය වාර්තා සඳහා වන සටහන් තුළ දක්වා වාර්තා කර ඇති අතර ඒවා පියවීම සඳහා අවශ්‍ය වන ආර්ථික ප්‍රතිලාභයන් හෝ ප්‍රමාණය නිශ්චිත හෝ විශ්වාසදායක ලෙස මැන දැක්වීමක් කළ නොහැකි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය වාර්තා තළ හඳුනා නොගන්නා අතර හෙළිදරව් කිරීමක් පමණක් සිදු කරනු ලැබේ.

## 2.18 ආදායම් හඳුනාගැනීම්

ලැබිය යුතු හා ලැබුණු සහනාධාර වටිනාකම සහ භාණ්ඩ විකිණීමෙන් පෙන්නුම් කරන ලැබිය යුතු ප්‍රමාණයන්ය. එකතු කළ අගය මත බද්ද (එ.අ.බ.) හා ජාතිය ගොඩනැගීමේ බද්ද (ජ.ගො.බ) අඩු කිරීමෙන් ආදායම් හඳුනා ගනී. අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ

ප්‍රමාණය නිශ්චිත හෝ විශ්වාසදායක ලෙස මැන දැක්වීමක් කළ හැකි වීම සමාගම ආදායම හඳුනා ගනී.

ආදායම හඳුනා ගැනීමේ ප්‍රධාන ආකාරයන් පහත පරිදි වේ.

(අ) පොහොර විකිණීම

සමාගම සෘජු සහ මිශ්‍ර පොහොර ආනයනය කර තොග හා සිල්ලර වශයෙන් විකිණීම කරයි. භාණ්ඩ සම්බන්ධ ප්‍රධාන අවදානම් සහ ප්‍රතිලාභ පාරිභෝගිකයාට මාරුවන අවස්ථාවේදී එනම්, ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කරනු ලබන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී.

(ආ) පොලී ආදායම

සඵල පොලී අනුපාතිකය භාවිතා කර පොලී ආදායම හඳුනා ගනී.

(ඇ) කුලී ආදායම

කල්බදු ගිවිසුමට අනුව උපචිත පදනමට කලී ආදයම හඳුනා ගනී.

(ඈ) දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ හා පාඩු

දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගයන් ඉවත් කිරීමෙන් ලැබෙන වටිනාකමත් සංසන්දනය කර විස්තීරණ ආදායම් ප්‍රකාශයට ලාභය හෝ පාඩුව හඳුනා ගනී.

(ඉ) අනෙකුත් ආදායම්
අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 2.19 වියදම්

වාර්තාකරණ කාල පරිච්ඡේදයේ ලාභය ගණනය කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා දායක වු සියලුම වියදම සලකා බලයි.

### 2.20 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවූ සියලුම වැදගත් සිද්ධීන් සලකා බලා අවශ්‍ය අවස්ථාවල කරන ලද ගැලපීම් හෝ අනාවරණයක් මෙම ප්‍රකාශන සඳහා වන සටහන්වල දක්වා ඇත.

### 2.21 වගකීම්

වාර්තාකරණ දිනය මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත යුතු හා ගැලපිය යුතු සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් තුළ දක්වා ඇත.

### 2.22 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පනයන්

